වාර්ෂික වාර්තාව

2024

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

අංක 117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල,

නුගේගොඩ

පටුන

1. පරිච්ඡේදය
1.1. කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ගැන ---------- 4
1.2. පෙර වසර දශකය මූල්‍ය සාරාංශය ---------- 6
1.3. දැක්ම සහ මෙහෙවර ---------- 7
1.4. ආයතනයේ අරමුණු ---------- 8
1.5. අධ්‍යක්ෂ මණ්ඩලය 2024 ---------- 9
1.6. ජ්‍යෙෂ්ඨ කළමණාකරණය ---------- 13
1.7. අවධානම් කළමණාකරණ කමිටු සාමාජිකයින් හා රැස්වීම් සාරංශය ---------- 19
1.8. විගණන කළමණාකරණ කමිටු සාමාජිකයින් හා රැස්වීම් සාරංශය ---------- 20
1.9. ආයතනික ව්‍යුහය ---------- 21

2. පරිච්ඡේදය
2.1. සභාපතිවරයාගේ පණිවිඩය ---------- 22

3. පරිච්ඡේදය
3.1. මෙහෙයුම් අංශය ---------- 24

4. පරිච්ඡේදය
4.1. රක්ෂණ අංශය ---------- 28

5. පරිච්ඡේදය
5. 1 අභ්‍යන්තර විගණන අංශය ---------- 32

6. පරිච්ඡේදය
6.1 පරිපාලන හා මානව සම්පත් අංශය ---------- 35

7. පරිච්ඡේදය
7.1 සැලසුම් අංශය ---------- 40

8. පරිච්ඡේදය
8.1.තොරතුරු තාක්ෂණ අංශය ---------- 48

9. පරිච්ඡේදය
9.1. විශ්‍රාම වැටුප් අංශය ---------- 52

10. පර්ච්ඡේදය
10.1 මුදල් අංශය
10.1.1. පෙර වසර දහයක මූල්‍ය තොරතුරු ---------- 61

11. පරිච්ඡේදය
11.1 මූල්‍ය ප්‍රකාශන
11.1.1.සමස්ථ යෝජනා ක්‍රම සඳහා ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන හා කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය ---------- 66
11.1.2.ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ---------- 94
11.1.3.ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ---------- 114

12. පරිච්ඡේදය
12.1. විගණකාධිපති වාර්තා
12.1.1. කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය ---------- 134
12.1.2. ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ---------- 148
12.1.3. ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය---------- 155

අප ගැන ...

දේශීය කෘෂිකාර්මිකයා හා කෘෂිකාර්මාන්තය සුරක්ෂිත කිරීමෙහිලා රජය වෙත පැවරී ඇති වගකීම ඉටු කිරීම සඳහා 1973 අංක 27 දරන කෘෂිකර්ම රක්ෂණ පනත මගින් කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය පිහිටුවා ඇති අතර 1999 අංක 20 දරණ කෘෂිකර්මික හා ගොවිජන රක්ෂණ පනත මඟින් කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ලෙස නැවත ස්ථාපිත කර ඇත.

කෘෂිකර්මාන්තයේ තිරසර සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වන්නා වූ ජාතික වැඩපිළිවෙලේදී කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය දැවැන්ත කාර්ය භාරයක් ඉටු කරනු ලබයි.

එහි ප්‍රමුඛතම කාර්යය ලෙස අවදානම් කළමණාකරණයේදී කෘෂිකාර්මිකයා වෙනුවෙන් මැදිහත් පාර්ශවකරුවෙකු ලෙස සම්බන්ධ වීම විශේෂයෙන් වැදගත් වේ. මෙහිදී කෘෂිකාර්මිකයාගේ බෝගවල අවදානම භාරගැනීමට අමතරව කෘෂිකාර්මිකයින්ගේ රථවාහන, උපකරණ හා ගබඩා වෙනුවෙන්ද රැකවරණය සලසමින් කෘෂිකාර්මිකයාගේ සමාජ ආරක්ෂණය උදෙසා කටයුතු කිරීමද විශේෂ වේ. කෘෂිකාර්මිකයාගේ මෙන්ම කෘෂිකර්මාන්තයේ තිරසර ප්‍රවර්ධනය උදෙසා රටේ ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය වඩාත් ස්ථාවර සහ වේගවත් කිරීමේ අරමුණින් කෘෂිකර්ම අමාත්‍යාංශය මූලික කරගනිමින් රජය මඟින් කෘෂිකාර්මිකයින් උදෙසා ක්‍රියාත්මක කළ පොහොර සහනාධාරය වැනි ගොවීන් උදෙසා ක්‍රියාත්මක කළ පහසුකම් දිරි ගැන්වීම් යටතට දිවයිනේ වගා කරන ප්‍රධාන බෝග වර්ග 06ක් වන වී, බඩ ඉරිඟු, අර්තාපල්, ලොකු ඵෑනු , සෝයා හා මිරිස් යන බෝග සඳහා ගංවතුර, නියඟය හා වන අලි හේතුවෙන් සිදුවන වගා හානි වෙනුවෙන් 2018 යල කන්නයේ ආරම්භ කරන ලද නොමිලයේ ලබාදුන් අනිවාර්ය රක්ෂණ යෝජනා ක්‍රමය 2024 වර්ෂය තුලද ක්‍රියාත්මක විය.

2024 වර්ෂය තුළදී මණ්ඩලයේ ආදායමේ කැපී පෙනෙන ප්‍රගතියක් අත්පත් කර ගැනීමට සියළුම රක්ෂණ යෝජනා ක්‍රම සමත් වී ඇත. 2023 වර්ෂයේ රුපියල් මිලියනක් 502.15 වූ ආදායම 2024 වර්ෂය අවසානයේදී රුපියල් මිලියන 623.28 දක්වා වර්ධනය කර ගැනීම මෙම වර්ෂයේ විශේෂ විය. දිස්ත්‍රික් මට්ටමින් පුළුල් අලෙවි සහ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළ සියළුම යෝජනා ක්‍රම සම්බන්ධයෙන් විශ්වාසය කෘෂිකාර්මිකයින් තුළ ඇති කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රගතිය අත්පත් කරගත හැකිවිය. මේ මඟින් උපයාගත් ආදායම මණ්ඩලයේ මූල්‍ය ස්ථාවරත්වය වර්ධනය කර ගැනීම සඳහා බෙහෙවින් ඉවහල් විය.

GIZ (Deutsche Gesellschaft für Internationale Zusammenarbeit) ආයතනයේ මූල්‍ය ආධාර යටතේ, මණ්ඩලයේ අභ්‍යන්තර පරිපාලන හා මෙහෙයුම් ක්‍රියාවලිය පූර්ණ වශයෙන් ඩිජිටල්කරණය කිරීමේ අරමුණින් හඳුන්වාදෙන ලද ERP (Enterprise Resource Planning) පද්ධතියෙහි සංවර්ධන කටයුතු ඉතා වේගවත්ව ක්‍රියාත්මක කිරීම මෙම වර්ෂය තුලදී සිදු කරන ලදී.

තොරතුරු තාක්ෂණ අංශය ස්ථාපනය කිරීමෙන් පසු, මණ්ඩලයේ ප්‍රචාරණ කටයුතු හා දැනුවත් කිරීමේ කටයුතු සඳහා e-SMS සේවාවක් ආරම්භ කරන ලදී. මෙම කෙටි පණිවිඩ සේවාව මගින්, දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලය තුළ සිදුවන පාරිභෝගික දැනුවත් කිරීම් හා අනෙකුත් ප්‍රවර්ධන වැඩසටහන් ඉතා සාර්ථකව ක්‍රියාත්මක වන අතර, එමඟින් සම්බන්ධිත සියළු පාර්ශවවලට සෘජු හා කාර්යක්ෂම සන්නිවේදනයන් සිදු කිරීමට හැකියාව සලසා ඇත.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන ප්‍රධානතම සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය වන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ

යෝජනා ක්‍රමය යටතේ 2024 වර්ෂය අවසානයේදී නව යෝජනා ක්‍රමයට දායක වී ඇති සමස්ත දායකයින් ප්‍රමාණය 4,903 ක් වන අතර, මෙම වර්ෂය තුළදී මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ සපයන ගොවීන් සංඛ්‍යාව 179,382 කි. මෙයට අමතරව ධීවර ප්‍රජාවගේ යහපත උදෙසා ක්‍රියාත්මක වන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය යටතේ 2024 වර්ෂය අවසානයේදී 69,049ක් වන ධීවරයින් සාමාජිකත්වය දරණ අතර, ධීවර විශ්‍රාම වැටුප්ලාභීන් 6,056 දෙනෙකු වෙත මාසිකව විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකර තිබුණි.

රටෙහි පැවති ආර්ථික අස්ථාවරත්වය තුළ වුවද ජාතික කෘෂිකාර්මික, පශු සම්පත් නිෂ්පාදන ක්‍රියාවලියේදී පුළුල් දායකත්වයක් ලබා දෙමින් අවදානම් අවම කිරීම සඳහා වන ශක්තිය කෘෂිකාර්මියා ප්‍රමුඛ ජාතික කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රියාවලියට ලබා දෙමින්, රටේ සමස්ත ආර්ථික නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රමුඛ කාර්ය කොටසක් ඉටුකරනු ලබන ආයතනයක් ලෙස කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සිය වගකීම 2024 වර්ෂය තුළදී ද ඉටුකරන ලදී.

වසර දහයක මූල්‍ය සාරාංශය

වාර්ෂික රක්ෂණ වාරික ආදායම 2015 සිට 2024 දක්වා

(රු.මිලියන)

රක්ෂණ යෝජනා ක්‍රමය	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
කෙතට අරුණ (අනිවාර්ය බෝග රක්ෂණය)	1,086.27	667.54	65.64	119.97	58.07	43.62	67.84	50.99	90.95	178.80
අතිරේක බෝග රක්ෂණය	24.72	30.09	30.01	8.04	3.05	2.28	6.41	4.72	9.75	9.99
පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය	9.01	10.57	13.39	10.59	7.87	5.78	11.07	5.25	15.59	19.63
වංචල දේපළ රක්ෂණය	-	7.81	41.91	137.85	220.15	278.94	296.50	311.04	353.44	358.85
ගබඩා රක්ෂණය	1.09	-	0.20	-	-	-	-	-	-	-
සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණ යෝජනා	16.43	15.61	53.13	6.34	9.42	13.78	9.04	18.55	32.30	56.00
එකතුව	**1,137.51**	**731.63**	**204.29**	**282.79**	**298.55**	**344.40**	**390.85**	**390.56**	**502.03**	**623.28**

වාර්ෂික ශුද්ධ ලාභය 2015 සිට 2024 දක්වා
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය(සමූහය)

(රු.මිලියන)

	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
මුළු ආදායම	1,361.31	972.87	5,916.38	4,569.71	3,566.55	3,724.63	3,655.16	3,676.44	3,848.42	4,013.93
මෙහෙයුම් වියදම	(3,599.05)	(21.07)	(25.68)	(50.66)	(63.43)	(66.43)	(70.06)	(72.52)	(98.28)	(129.69)
මෙහෙයුම් අතිරික්තය	(2,237.75)	(5,682.55)	(6,397.36)	(5,446.34)	(6,328.90)	(7,324.58)	(6,306.83)	(5,817.01)	(7,927.18)	(7,557.69)
රාජ්‍ය ප්‍රදාන හා අනෙකුත් අදායම	2,285.80	2,696.89	2,811.59	2,842.56	3,215.52	4,661.08	4,011.14	4,167.82	4,619.45	5,033.84
මුළු වියදම්	(307.08)	(269.11)	(293.47)	(307.82)	(328.96)	(327.95)	(336.20)	(486.77)	(576.82)	(658.34)
වාර්ෂික ශුද්ධ ලාභය / අලාභය	(256.35)	(3,254.77)	(3,879.24)	(2,911.60)	(3,442.35)	(2,991.45)	(2,631.89)	(2,135.97)	(3,884.55)	(3,182.19)

වාර්ෂික ශුද්ධ ලාභය 2015 සිට 2024 දක්වා කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය

(රු.මිලියන)

	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
මුළු ආදායම	1,156.07	782.21	5,735.18	4,398.51	3,365.07	3,530.41	3,456.91	3,432.32	3,488.25	3,691.94
මෙහෙයුම් වියදම	(1,116.14)	(9.95)	(12.00)	(36.37)	(48.76)	(51.37)	(54.70)	(56.86)	(81.62)	(111.50)
මෙහෙයුම් අතිරික්තය	39.93	377.72	80.94	1,144.73	878.06	1,401.34	1,752.00	2,663.14	1,268.23	1,799.76
අනෙකුත් අදායම්	98.90	122.51	130.12	4.00	9.14	8.29	8.16	6.75	14.35	17.21
මුළු වියදම්	(131.97)	(144.40)	(161.13)	(169.73)	(185.02)	(179.77)	(184.29)	(229.20)	(300.08)	(353.91)
වාර්ෂික ශුද්ධ ලාභය / අලාභය	8.76	355.83	49.93	979.00	702.19	1,229.86	1,575.88	2,440.68	982.50	1,463.06

දැක්ම සහ මෙහෙවර

දැක්ම....

"දේශීය කෘෂිකර්මාන්තයේ අග්‍රගණ්‍ය රැකවලා වීම තුළින් දකුණු ආසියාවේ පරමාදර්ශී කෘෂි රක්ෂණ ආයතනය වීම"

මෙහෙවර...

"කෘෂිකාර්මික රක්ෂණය සහ ආරක්ෂණය සැලසීම සඳහා සාමූහික ප්‍රයත්නයන් හා අදාල ආයතන සම්බන්ධීකරණය තුළින් ජාත්‍යන්තරව පිළිගත හැකිවිශිෂ්ඨ සේවාවක් සැපයීම"



කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙහි අරමුණු .....

- කෘෂිකාර්මික වගාවන්ට අදාළ අවදානම් කළමණාකරණය
- ගොවීන් සතු අනෙකුත් නිශ්චල හා චංචල දේපල සඳහා වන අවදානම් කළමණාකරණය
- ගොවීන් සතු පශු සම්පත් වලට අදාළ අවදානම් කළමණාකරණය
- සාමාජ ආරක්ෂණ, හා ජීවිත රක්ෂණ ක්‍රමවේද තුළින් ගොවි හා ධීවර ප්‍රජාව සුරක්ෂිත කිරීම
- ආයතනයට අදාළ වන දේශීය හා ජාත්‍යන්තර තත්ත්ව සහතික ලබාගැනීම
- සංවර්ධන, මෙහෙයුම් හා අලෙවි ප්‍රවර්ධනය
- දිස්ත්‍රික් පරිපාලනය, කළමනාකරණය හා බාහිර ආයතන සම්බන්ධීකරණය
- ආයතනික මානව හා භෞතික සම්පත් සැලසුම්කරණය හා සංවර්ධනය
- ප්‍රසම්පාදන හා සැපයුම් කළමණාකරණය
- පනත් ක්‍රියාත්මක කිරීමට අදාළ නෛතික සහාය ලබාදීම
- ආයතනික අරමුණු ඉටුකරගැනීම සඳහා සැලසුම්කරණය, අධීක්ෂණය හා ඇගයීම් සිදුකිරීම
- විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ගොඩනැඟීම හා පරිපාලන ක්‍රියාවලියේ දුර්වලතා අවම කිරීම
- ලාභදායී වර්ධනයක් තුළින් තිරසාර මූල්‍ය ශක්තියක් සහතික කිරීම
- ආයතනික ක්‍රියාවලින් විධිමත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ක්‍රමවේද හා GIS ක්‍රමවේද භාවිතය

අධ්‍යක්ෂ මණ්ඩලය 2024



ආචාර්ය ඩබ්.ඩබ්.එම්.බී වීරසේකර
සභාපති
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
(2022 සැප්. සිට 2024 සැප්. දක්වා)

SLAS (Special grade).

- **DBA –** Doctoral Degree in Business Administration – IIC University of Technology - Colombia
- **MSc** – Master of Science – Human Resource Planning and Development – University of Gurugobing Singh, New Delhi, India.
- **MSsc- Master of Social Science** – University of Kelaniya Sri Lanka

Bachelor of Arts –University



පේමසිරි ජාසිංහාරච්චි මහතා
සභාපති
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
(2024 ඔක්. 09 සිට)

- **Bachelor of the Science** (Agriculture), University of Ruhuna.
- **Dip.** in Inland Fisheries and Aquaculture Extension, Ministry of Fisheries and Aquatic Resources.



රුවන් තිසේරා මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
අතිරේක ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
SLAS (Special grade)

- **B.SC** Eng. (Mechanical) University Of Moratuwa
- **MA** Sociology, University of Kelaniya



ආර්.ඒ.ඩී.එස්.රණතුංග මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
අතිරේක ලේකම් (ධීවර සම්පත් කළමණාකරණ)
ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය

SLAS (Special grade).

Additional Secretary (Fisheries Resource Management)
Ministry of Fisheries, Aquatic and Ocean Resources

- **BSc** (Agri) **Hons**, University of Ruhuna),
- **MPA** University of Sri Jayawardanapura,
- **MDP**, University of Queensland



ආර්.එම්.ඩී.කේ.ජී.එන්.ඩී.රණතුංග මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
(2024 ජූලි දක්වා)

- **MA** Economics- University of Keleniya
- **BSc**. University of Sri Jayewardenepura,
  - Fellow Member of the Institute of Public Finance and Development Accountancy.
  - Licentiate Examination at Institute of Chartered Accountants of Sri Lanka



එම්.ඒ.එස්.එච්. පෙර්රා මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
(2024 අගෝස්තු සිට)

- **BSc** Mgt (Public) special, University of Sri Jayawardanapura
- **MSc** in App. Finance, University of Sri Jayawardenapura
- ACMA, CPFA(CASL), CPIFA(UK)



ජී.ජී.වී.ශ්‍යාමලි මිය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

- **BSc**, Agriculture special, University of Peradeniya
- **MSc** Horticulture (Pomology), Punjab Agricultural University, Ludhiana, India



ඒ.එච්.එම්.එල්. අබේරත්න
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

(2024 ජූලි දක්වා)

SLAS (Special grade)



රෝහණ රාජපක්ෂ මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

(2024 සැප්. සිට)

SLAS (Special grade)



MR. Dhananjaya Nandasiri
ධනංජය නන්දසිරි මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
උප සභාපති / ප්‍රාදේශීය කළමණාකරු
DFCC බැංකුව
(IBSL)



DR. C.N.S. GAMAGE
ආචාර්ය සී. එන්.එස්. ගමගේ
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
අධ්‍යක්ෂ (පශු සම්පත් සැලසුම්) (රාජ්‍ය අමාත්‍යාංශය)
පශු සම්පත්, සත්ව පාලන ප්‍රවර්ධන සහ කිරි සහ බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය.



MR. S.M.G. SAMARAKOON
එස්.එම්.ජී. සමරකෝන්
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ගොවිජන නියෝජිතයා

2024 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ විස්තර

අනු අංකය	අධ්‍යක්ෂ මණ්ඩලය/ප්‍රධාන කළමනාකරණය	තනතුර	සාමාජිකත්වය	වර්ෂය තුළ සහභාගී වූ රැස්වීම් ගණන
1	ආචාර්ය ඩබ්.ඩබ්.එම්.බී වීරසේකර (2024.09.30 දක්වා)	සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය	අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති	9
	ජේමසිරි ජාසිංහාරච්චි මහතා	සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය	අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති	1
2	ආර්.එම්.ඩී.කේ.ජී.එන්.ඩී.රණතුංග	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මුදල් අමාත්‍යාංශය	සාමාජික	6
	එම්.ඒ.එස්.එච්. පෙර්රා මහතා	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මුදල් අමාත්‍යාංශය	සාමාජික	4
3	ආර්.ඒ.ඩී.එස්.රණතුංග මහතා	අතිරේක ලේකම් (ධීවර සම්පත් කළමණාකරණ) ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය	සාමාජික	8
4	ආචාර්ය සී. එන්.එස්. ගමගේ	අධ්‍යක්ෂ (පශු සම්පත් සැලසුම්) (රාජ්‍ය අමාත්‍යාංශය) පශු සම්පත්, සත්ව පාලන ප්‍රවර්ධන සහ කිරි සහ බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය.	සාමාජික	8
5	ජී.ජී.වී.ශ්‍යාමලි මිය	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	සාමාජික	2
	එච්.එම්.එස්.පී. හේරත්	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	සාමාජික	2
6	ඒ.එච්.එම්.එල්. අබේරත්න	ගොවිජන සේවා කොමසාරිස් ජනරාල් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව	සාමාජික	3
	රෝහන රාජපක්ෂ මහතා	ගොවිජන සේවා කොමසාරිස් ජනරාල් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව	සාමාජික	3
7	ධනංජය නන්දසිරි මහතා	උප සභාපති / ප්‍රාදේශීය කළමණාකරු	සාමාජික	2
8	එස්.එම්.ජී. සමරකෝන්	ගොවිජන නියෝජිතයා	සාමාජික	8

ජ්‍යෂ්ඨ කළමණාකරණය



ඩබ්.එම්.එම්.බී. වීරසේකර මහතා
සභාපති (2024.09.30 දක්වා)



ජේමසිරි ජාසිංහාරච්චි මහතා
සභාපති



කේ.ඩී.පී.ආර්. වීරසේකර මහතා
අධ්‍යක්ෂ ජනරාල්
(2024.03.18 දක්වා)



අයි.යූ.කේ. කලුආරච්චි මහතා
අධ්‍යක්ෂ ජනරාල්



සී.එම්.එම්. මන්තිලකා මිය
අධ්‍යක්ෂ
රක්ෂණ අංශය



එස්.එම්.යූ.ජී.එස්.කේ. සුබසිංහ මහතා
අධ්‍යක්ෂ (වැ.බ)
මූදල් අංශය



කේ.ඒ.ඩී.සී.ජී. කොඩිප්පිලි මහතා
අධ්‍යක්ෂ (වැ.බ)
මෙහෙයුම් අංශය



බී. ආර්. කෞශල්‍යා මෙනවිය
අධ්‍යක්ෂ (වැ.බ)
විශ්‍රාම වැටුප් අංශය



ඒ.ටී.ඩී. ප්‍රනාන්දු මිය
සහකාර අධ්‍යක්ෂ
විශ්‍රාම වැටුප් අංශය



පී.ආර්. චතුරංගනී මිය
සහකාර අධ්‍යක්ෂ
මුදල් අංශය



කේ.එච්.පී. සමන්කුමාරි මිය
සහකාර අධ්‍යක්ෂ
මුදල් අංශය



කේ. ඩික්සන් මහතා
සහකාර අධ්‍යක්ෂ
රක්ෂණ අංශය



අයේෂා සමරකෝන් මිය
සහකාර අධ්‍යක්ෂ
සැලසුම් අංශය



එන්.එච්.ඩී. ප්‍රියදර්ශනී මිය
සහකාර අධ්‍යක්ෂ
අභ්‍යන්තර විගණන අංශය



ඉෂාරිකා වීරසේකර මිය
සහකාර අධ්‍යක්ෂ
නීති අංශය



එන්. ටී. ඉසුරු කවින්ද්‍යා මහතා
සහකාර අධ්‍යක්ෂ
තොරතුරු තාක්ෂණ අංශය



සී.සී.කේ. සමරවික්‍රම
සහකාර අධ්‍යක්ෂ
පරිපාලන හා මානව සම්පත් අංශය



එච්. එස්. ඩී. විතානගේ මහතා
සහකාර අධ්‍යක්ෂ
විශ්‍රාම වැටුප් අංශය



කේ.ඩී.ටී. පෙරේරා මෙනවිය
සහකාර අධ්‍යක්ෂ
පරිපාලන හා මානව සම්පත් අංශය



එම්.සී.පී. කුමාර මහතා
සහකාර අධ්‍යක්ෂ
රක්ෂණ අංශය (පශු රක්ෂණ)

ඩී.කිරිදරන් මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ
යාපනය දිස්ත්‍රික්කය

දීප්තිකා කොල්ලල්පිටිය මිය - නියෝජ්‍ය අධ්‍යක්ෂ
බදුල්ල දිස්ත්‍රික්කය

යූ.ආර්.කේ.සී.කේමරත්න මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ
කුරුණෑගල දිස්ත්‍රික්කය

ඒ. එල්. ඩී. පී. එස්. අඹේපිටිය මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ
පුත්තලම දිස්ත්‍රික්කය

පී.කුගන් මහතා - සහකාර අධ්‍යක්ෂ
මුලතිවු දිස්ත්‍රික්කය

ඩී. බී. එන්. දියවඩන මහතා - සහකාර අධ්‍යක්ෂ
කෑගල්ල දිස්ත්‍රික්කය

ඩබ්.ඒ.ආර්. කුලරත්න මහතා - සහකාර අධ්‍යක්ෂ
නුවර දිස්ත්‍රික්කය

ඒ. කාවන්තීසන් මහතා - සහකාර අධ්‍යක්ෂ
මඩකලපුව දිස්ත්‍රික්කය

ඊ. එම්.එන්.බී. ඒකනායක මහතා - සහකාර අධ්‍යක්ෂ
අනුරාධපුර දිස්ත්‍රික්කය

ඩී.බී.එච්. අඹන්වල මහතා - සහකාර අධ්‍යක්ෂ
මාතලේ දිස්ත්‍රික්කය

ඩී.කේ. දිසානායක මිය - සහකාර අධ්‍යක්ෂ
ගම්පහ දිස්ත්‍රික්කය

ඩී.ජී.ආර්.කේ. කුලවර්ධන මහතා - සහකාර අධ්‍යක්ෂ
ගාල්ල දිස්ත්‍රික්කය

ඒ.එම්.එල්.ජී. අධිකාරී මහතා - සහකාර අධ්‍යක්ෂ
මහව දිස්ත්‍රික්කය

ඩබ්.බී. පියසිරි මහතා - සහකාර අධ්‍යක්ෂ
මොණරාගල දිස්ත්‍රික්කය

ඩි.එච්.ජේ.පී.වී. රසාංග මහතා - සහකාර අධ්‍යක්ෂ
නුවර එළිය දිස්ත්‍රික්කය

ඩි. රංගන මහතා - සහකාර අධ්‍යක්ෂ
මනම්පිටිය හා දෙහිඅත්තකණ්ඩිය දිස්ත්‍රික්කය

එන්. ගම්හේවගේ මහතා - සහකාර අධ්‍යක්ෂ
හම්බන්තොට දිස්ත්‍රික්කය

කේ.සී.අමරවීර මිය - සහකාර අධ්‍යක්ෂ
ඇඹිලිපිටිය දිස්ත්‍රික්කය

එස්. තිලිප්කුමාර මහතා - සහකාර අධ්‍යක්ෂ
මන්නාරම දිස්ත්‍රික්කය

ඩබ්.ටී.ඒ. ප්‍රියදර්ශන මහතා - සහකාර අධ්‍යක්ෂ
පොලොන්නරුව දිස්ත්‍රික්කය

එස්. සතීස්කුමාර මහතා - සහකාර අධ්‍යක්ෂ
අම්පාර දිස්ත්‍රික්කය

ජී.කේ.එන්.ටී. ගල්ලොලුව මිය - සහකාර අධ්‍යක්ෂ
රත්නපුර දිස්ත්‍රික්කය

ඒ.ජේ.එන්. අතුරලිය මිය - සහකාර අධ්‍යක්ෂ
කොළඹ දිස්ත්‍රික්කය

පී.කදිරගාමනාදන් මහතා - සහකාර අධ්‍යක්ෂ
වව්නියාව දිස්ත්‍රික්කය

අනුරාධ තෙන්නකෝන් මහතා - සහකාර අධ්‍යක්ෂ (වැ.බ)
තඹුත්තේගම දිස්ත්‍රික්කය

කේ.කේ.එස්.රවීන්ද්‍ර මහතා - සහකාර අධ්‍යක්ෂ (වැ.බ)
කළුතර දිස්ත්‍රික්කය

ආර්.ටී. ලොකුහෙට්ටි මහතා - සහකාර අධ්‍යක්ෂ (වැ.බ)
මාතර දිස්ත්‍රික්කය

කේ එල් අන්සාර් මහතා - සහකාර අධ්‍යක්ෂ (වැ.බ)
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

පූර්ණ චන්ද්‍රන් මහතා - සහකාර අධ්‍යක්ෂ (වැ.බ)
කිලිනොච්චි දිස්ත්‍රික්කය

අවධානම් කළමණාකරණ කමිටු සාමාජිකයින් හා රැස්වීම් සාරංශය


දිනය	නම	නනතුර	ආයතනය
2024.02.28	ඒ.එච්.එම්.එල්. අබේරත්න මහතා	කොමසාරිස් ජනරාල්	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
	ආර්.එම්.කේ.ජී.එන්.බී. රණතුංග මහතා	අතිරේක අධ්‍යක්ෂ	භාණ්ඩාගාර හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව
	කේ.සී. නිරෝෂණ මහතා	අතිරේක ලේකම්	කෘෂිකර්ම අමාත්‍යාංශය
2024.05.21	ඒ.එච්.එම්.එල්. අබේරත්න මහතා	කොමසාරිස් ජනරාල්	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
	ආර්.එම්.කේ.ජී.එන්.බී. රණතුංග මහතා	අතිරේක අධ්‍යක්ෂ	භාණ්ඩාගාර හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව
	කේ.සී. නිරෝෂණ මහතා	අතිරේක ලේකම්	කෘෂිකර්ම අමාත්‍යාංශය
2024.09.18	ඒ.එච්.එම්.එල්. අබේරත්න මහතා	කොමසාරිස් ජනරාල්	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
	ආර්.එම්.කේ.ජී.එන්.බී. රණතුංග මහතා	අතිරේක අධ්‍යක්ෂ	භාණ්ඩාගාර හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව
	කේ.සී. නිරෝෂණ මහතා	අතිරේක ලේකම්	කෘෂිකර්ම අමාත්‍යාංශය
2024.12.24	ඒ.එච්.එම්.එල්. අබේරත්න මහතා	කොමසාරිස් ජනරාල්	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
	ආර්.එම්.කේ.ජී.එන්.බී. රණතුංග මහතා	අතිරේක අධ්‍යක්ෂ	භාණ්ඩාගාර හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව
	කේ.සී. නිරෝෂණ මහතා	අතිරේක ලේකම්	කෘෂිකර්ම අමාත්‍යාංශය

විගණන කළමණාකරණ කමිටු සාමාජිකයින් හා රැස්වීම් සාරංශය

කාර්තුව හා දිනය	නම	නනතුර	ආයතනය
I වන කාර්තුව 2024.02.28	ආර්.එම්.ඩී.කේ.ජී.එන්.ඩී.රණතුංග	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
	ඒ.එම්.එල්.අබේරත්න	ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
	ආර්.ඒ.ඩී.එස්. රණතුංග	අතිරේක ලේකම් (ධීවර සම්පත් කළමණාතරණ)	ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය
III වන කාර්තුව 2024.07.16	ආර්.එම්.ඩී.කේ.ජී.එන්.ඩී.රණතුංග	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
	ඒ.එම්.එල්.අබේරත්න	ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
	එච්.ඒ.කේ.ආර්.තිසේරා	අතිරේක ලේකම් (පොහොර)	කෘෂිකර්ම අමාත්‍යාංශය
IV වන කාර්තුව 2024.12.24	**ඒ.එස්.එච්. පෙරේරා**	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
	රෝහණ රාජපක්ෂ	ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
	එච්.ඒ.කේ.ආර්.තිසේරා	අතිරේක ලේකම් (පොහොර)	කෘෂිකර්ම අමාත්‍යාංශය

ආයතනික ව්‍යුහය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය



21



පේමසිරි ජාසිංආරච්චි
සභාපති
කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

සභාපතිවරයාගේ පණිවිඩය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කරමින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ 2024 ක්‍රියාකාරීත්වය හා සැලසුම් සම්බන්ධයෙන් සැකෙවින් විස්තර කරමි.

කෘෂි රක්ෂණ මණ්ඩලයේ 2024 වර්ෂයේ මූල්‍ය උත්පාදනය හා වන්දි ගෙවීම් :-

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් 2024 වර්ෂයේදී කෘෂි රක්ෂණ යෝජනා ක්‍රම මඟින් රු.මි. 623.28 ක ශුද්ධ ලාභයක් උපයාගෙන ඇති අතර, මෙම වර්ෂයේ උපයාගෙන ඇති මෙහෙයුම් ලාභය රු.මි. 1,799.76 කි. විපතට පත් ගොවිජනතාව වෙනුවෙන් කඩිනමින් වන්දි මුදල් ගෙවීම මණ්ඩලයේ ප්‍රමුඛතම කාර්යභාරය වන අතර, 2024 වර්ෂයේදී ද දිවයිනේ කෘෂිකාර්මික දිස්ත්‍රික්ක ගණනාවක අධික වර්ෂාව, ගංවතුර හේතුවෙන් විපතට පත් ගොවිජනතාව වෙනුවෙන් මණ්ඩලයේ අනිවාර්යය වගා රක්ෂණ වන්දි රු.මි. 2,516.94 ක මුදලක් ගොවීන් වෙත ප්‍රදානය කර ලදී.

සැලසුම්

කෘෂිකාර්මික රටක් වන ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනය සඳහා කෘෂිකාර්මික අංශය 7% කට ආසන්න දායකත්වයක් දක්වන අතර ලාංකික ශ්‍රම බලකායෙන් 27% ට ආසන්න ප්‍රමාණයක් කෘෂිකාර්මික කටයුතු ආශ්‍රිත රැකියාවන් වල නිරතවී සිටී. සමස්ථයක් ලෙස ගත් විට ශ්‍රී ලාංකික ජනගහනයෙන් බහුතරයක් කෘෂි ක්ෂේත්‍රය සිය ජීවනෝපාය කරගෙන ඇති බව පැහැදිලි වේ.

නිරතුරුවම ගොවීන්ට මුහුණ දීමට සිදුවන අනපේක්ෂිත ගංවතුර, නියං තත්වයන්, වන අලීන්ගෙන් සිදුවන හානි පිළිබඳව සළකා බැලීමේදී ගොවියා වගාවට පෙළඹවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අමතරව, ඔවුන්ගේ අවදානම් කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව රජය විසින් විශේෂ අවධානයක් යොමු කරමින් වන්දි ගෙවීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය දායකත්වය ලබාදෙන ලදී.

2024 වර්ෂයේ මා විසින් රාජකාරී භාර ගෙන කටයුතු කරන ලද මාස 02 ක් වැනි කෙටි කාලය තුල බිම් මට්ටමින් සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවන් වලදී පවතින බෝග රක්ෂණයට අමතරව ගොවීන් නිරත වන කර්මාන්ත වලට අදාලව අවධානම් ආවරණය කර ගැනීමේ අවශ්‍යතාවය බොහෝ ගොවී හට තිබෙන ගැටළුවක් බව හඳුනාගන්නා ලදී. ඒ අනුව එසේ හඳුනාගන්නා ලද කෘෂිකාර්මික ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පවතින අවධානම් විද්‍යාත්මක වශයෙන් අධීක්ෂණය කර එම අවධානම් වලට අදාලව රක්ෂණ ආවරණ සැලසුම් කිරීම සිදුකරමින් එම කටයුතු වඩාත් පුළුල් ලෙස 2025 වර්ෂයේදී දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව හා මඟ පෙන්වීම ලබාදෙන ලදී.

මානව සම්පත් කළමනාකරණය

මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 421 කි. 2024/12/31 දිනට කාර්ය මණ්ඩලය 327 වන අතර පුරප්පාඩු සංඛ්‍යාව 94 ක් වේ. සීමිත කාර්ය මණ්ඩලයක් යටතේ දීප ව්‍යාප්ත සේවාවන් ලබා දීමේදී ඇතිවන මානව සම්පත් ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙන් අවධානය යොමු කර කාර්ය මණ්ඩල වල ධනාත්මක ආකල්ප වර්ධනය සඳහා ඔවුන්ගේ සේවය ඇගයීම්, දිරි ගැන්වීම් නිරන්තරයෙන් සිදුකරන ලදී.

මණ්ඩලයේ රක්ෂණ යෝජනා ක්‍රම බිම් මට්ටමින් ක්‍රියාත්මක කරන දිස්ත්‍රික් කාර්යාල වල ප්‍රගතිය හා ගැටළු හඳුනා ගැනීම සඳහා පලාත් වශයෙන් දිස්ත්‍රික්ක වලට අදාල සියළුම නිලධාරීන් කැඳවා නිලධාරී මට්ටමින් ප්‍රගතිය සමාලෝචනයට ලක්කරන ලදී. එහිදී අඩු ප්‍රගතියක් සහිත දිස්ත්‍රික්කවල, ප්‍රගතිය වර්ධනය කරගැනීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට හැකි රක්ෂණ යොජනා ක්‍රම හඳුනාගෙන අලෙවි ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබාදෙමින්, අලෙවිය වර්ධනය කර ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය දිරි ගැන්වීම සිදුකර භෞතික අවශ්‍යතාවන්ද සම්පූර්ණ කිරීමට උපරිම වශයෙන් කටයුතු කරන ලදී.

රාජ්‍ය යාන්ත්‍රණය ඩිජිටල්කරණය කිරීමේ ක්‍රියාවලිය යටතට කෘෂි රක්ෂණ මණ්ඩලයද ඇතුලත් කර ගැනීම සඳහා මණ්ඩලය විසින් ආරම්භ කර තිබූ ERP මෘදුකාංග පද්ධතියේ කටයුතු වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන බැවින් ඒ සම්බන්ධයෙන් තවදුරටත් අවශ්‍ය සහයෝගය හා මග පෙන්වීම ලබාදෙමින් අවසන් කිරීම සඳහා උපදෙස් ලබාදීම සිදුකරන ලදී.

ඉදිරි අරමුණු

පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් යන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ක්‍රියාවට නගමින් මණ්ඩලයේ අරමුණු වලට ලගා වීම සඳහා මානව සම්පත් කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කරමින් සතුටින් රාජකාරී කරන කාර්ය මණ්ඩලයක් ජනනය කිරීම තුලින් ගොවි ජනතාවට පොහොසත් හා ලස්සන ජීවිතයක් ලබාදී තෘප්තිමත් ගොවි සමාජයක් ගොඩනැඟීම අපගේ මූලික පරමාර්ථය වේ. ඒ අනුව ඉහත සඳහන් කර ඇති සැලසුම් 2025 වර්ෂයේදී පුළුල් ලෙස දීපව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

ස්තූතිය

ගරු කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාර්මාර්ග අමාත්‍යතුමාගේ හා ගරු කෘෂිකර්ම හා පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා කෘෂි රක්ෂණ මණ්ඩලයේ කටයුතු සඳහා ලබාදුන් නොමද සහයෝගය සම්බන්ධයෙන් මාගේ ප්‍රණාමය පල කරන අතර කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්තුමා සහ එම අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ දායකත්වය පිළිබඳව කෘතඥතාවය පලකර සිටිමි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදුන් සහයෝගය මෙහිදී විශේෂයෙන් සඳහන් කලයුතු අතර, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ කළමනාකරිත්වය ඇතුළු සියළුම කාර්ය මණ්ඩලය විසින් ලබාදුන් දායකත්වය සම්බන්ධයෙන් මාගේ විශේෂ ස්තූතිය පලකරමි.

මීට අමතරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලය, හා ගොවිජන සංවර්ධන කොමසාරිස්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය අපගේ සේවාවන් බිම්ගත කිරීම සඳහා ලබාදුන් දායකත්වය සම්බන්ධයෙන්ද මාගේ ස්තූතිය පල කිරීමට මෙය අවස්ථාවක් කරගනිමි.

මෙහෙයුම් අංශය

2 පරිච්ඡේදය

අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් වශයෙන් දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයට කෘෂිකාර්මික රක්ෂණය හඳුන්වාදී දේශීය කෘෂි නිෂ්පාදනය ඉහළ නැංවීම හා කෘෂිකාර්මිකයා සුරක්ෂිත කිරීම මුඛ්‍ය කර්තව්‍යය කරගනිමින් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ක්‍රියාත්මක වේ. නියඟය, ගංවතුර, වන අලි හානි ඇතුළු ස්වභාවික ආපදා තත්ත්වයන් තුළදී ගොවීන් මුහුණ දෙන ආර්ථික ගැටළුවලට මනා විසඳුමක් ලෙස කෘෂි රක්ෂණ ක්‍රමවේදය වැදගත් වේ. එමෙන්ම, කෘෂි ආර්ථික රටාවක් තුළින් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේදී කෘෂි කාර්මික අවදානම් කළමනාකරණය වඩාත් ප්‍රායෝගික අයුරින් යොදා ගැනීම දේශීය කෘෂි ආර්ථික හා ජීවන රටාව ස්ථායී මට්ටමක පවත්වාගෙන යාමට මහඟු පිටුවහලක් වී ඇත. විශේෂයෙන් ගොවීන්ට වඩාත් සමීප වගා රක්ෂණ යෝජනා ක්‍රමය, පශු රක්ෂණ යෝජනා ක්‍රමය, සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණය, කෘෂි උපකරණ රක්ෂණය, ගබඩා රක්ෂණය හා තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණය වැනි වැඩි ප්‍රතිලාභ සහිත රක්ෂණ යෝජනා ක්‍රම රාශියක් ගොවිජනතාව වෙනුවෙන් මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වේ.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සේවාවන් ගොවිජනතාව අතර ව්‍යාප්ත කිරීමේදී වඩාත් වැදගත් කාර්ය භාරයක් ඉටු කිරීමට මෙහෙයුම් අංශයට පැවරී ඇත. මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන ඉදිරි වැඩපිළිවෙල ඇතුළත් සංයුක්ත සැලැස්මට අනුකූලව සියළුම ආයතනික සැලසුම් සකස් කිරීම, එම සැලසුම් ක්‍රියාත්මක කරවීම සඳහා දීප ව්‍යාප්තව පැතිරී ඇති දිස්ත්‍රික් කාර්යාල මෙහෙයවීම, ඒ සඳහා වූ මානව හා භෞතික අවශ්‍යතා පූරණය කිරීම ඇතුළු සුවිශේෂී වූ කාර්ය භාරයක් මෙහෙයුම් අංශය මඟින් ඉටු කරනු ලබයි.

- කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රක්ෂණ සේවා සපයන ප්‍රධාන රාජ්‍ය ආයතනය වශයෙන් දේශීය කෘෂිකර්මාන්තය නංවාලීමේ හා කෘෂිකාර්මිකයාගේ ආර්ථිකය ස්ථායී කිරීමෙහිලා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම උපරිම ආකාරයෙන් ඉටුකිරීම අරමුණු කරගනිමින්, 2024 වර්ෂයේදීද රක්ෂණ යෝජනා ක්‍රම රාශියක් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට මෙහෙයුම් අංශය කටයුතු කර ඇත.
    1. වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - වී වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - බඩ ඉරිඟු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - ලොකු ළූණු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - අර්තාපල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - මිරිස් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - සෝයා වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - අතිරේක බෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමය (තල, කුරක්කන්, කොල්ලු, මුංඇට, කව්පි, උඳු)
        - උක් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - අපනයන බෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමය (ගම්මිරිස්, කුරුඳු)
        - වැවිලි බෝග වගා රක්ෂණ යෝජනා ක්‍රමය (තේ වගාව)
        - පොල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - මල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - ඉහුරු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - එළවළු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - කෙසෙල් වගා රක්ෂණ යෝජනා ක්‍රමය
        - පළතුරු වගා රක්ෂණ යෝජනා ක්‍රමය
    2. ගබඩා රක්ෂණ යෝජනා ක්‍රමය
    3. කෘෂි උපකරණ රක්ෂණ යෝජනා ක්‍රමය
    4. පශු රක්ෂණ යෝජනා ක්‍රමය
        - ගව
        - එළු
    5. හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය
    6. සුවසෙත සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

7. තෙවන පාර්ශවීය රථවාහන රක්ෂණ යෝජනා ක්‍රමය
8. සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම
   - ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය
   - ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

නියඟය, ගංවතුර හා වන අලින්ගෙන් සිදුවන ආපදාවලින් වගා කටයුතුවලට ඇති වියහැකි හානි නිසා ගොවි ප්‍රජාවට මුහුණ දීමට සිදුවන දුෂ්කරතාවලට පිළියමක් වශයෙන් වී, බඩ ඉරිභූ, අර්තාපල්, ලොකුළූණු, සෝයා හා මිරිස් වගාවන් සඳහා ගොවීන්ගේ සහ රජයේ දායකත්වය සහිත අනිවාර්ය රක්ෂණ යෝජනා ක්‍රමයකට ගොවීන් දායක කරගැනීම සිදුවූ අතර, 2018 යල කන්නයේ සිට ගොවීන්ගෙන් වාරික මුදල් අය කිරීමෙන් තොරව රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත අක්කරයක් සඳහා උපරිමය රු.40,000/-ට යටත්ව රක්ෂණ ආවරණයක් ලබා දීමට රජය විසින් කටයුතු කරන ලදී. කෘෂිකර්ම අමාත්‍යාංශය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මහවැලි සංවර්ධන අධිකාරිය, රාජ්‍ය හා රාජ්‍ය නොවන බැංකු ඇතුළු අදාල සියළු ආයතන සම්බන්ධීකරණයෙන් මෙම රක්ෂණ යෝජනා ක්‍රමය 2018 යල කන්නයේ සිට මණ්ඩලය විසින් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙහෙයුම් අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් :

- 2024 වර්ෂයේ අලුත් සහල් මංගල්‍යය අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් 2024.04.05,06 දිනයන්හි අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස පවත්වන ලද මහෝත්සවය සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම හා ක්‍රියාකාරකම් සිදු කිරීම.
- තෙවන පාර්ශව රථවාහන රක්ෂණ යෝජනා ක්‍රමය සම්බන්ධ 02/2023 චක්‍රලේඛය සංශෝධනය කිරීම.
- මහනුවර, පුත්තලම, ගාල්ල, කළුතර, කුරුණෑගල, මහව, මොණරාගල, ඇඹිලිපිටිය, හම්බන්තොට, ත්‍රිකුණාමලය, මාතර, කොළඹ, බදුල්ල, තඹුත්තේගම, රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි අලෙවි ප්‍රවර්ධන කටයුතු යාවත්කාලීන කිරීම සඳහා බැනර් හා අත් පත්‍රිකා දිස්ත්‍රික් අවශ්‍යතාවයන් අනුව මුද්‍රණය කර ගැනීම සඳහා අවශ්‍යය ප්‍රතිපාදන හා මුද්‍රණ ආකෘතීන් සපයාදීම හා උපදෙස් ලබා දීම.
- වෙළඳපොල විභවයන්ට සරිලන ආකාරයෙන් පාරිභෝගික ජනතාවගේ පහසුව ඇතුළු කරුණු සළකා බලා කෑගල්ල, නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාල නව ගොඩනැඟිලිවල ස්ථාපිත කිරීම.
- දිස්ත්‍රික් කාර්යාල ගොඩනැඟිලි හා මණ්ඩලය සතු නිල නිවාස අවශ්‍යතාවය අනුව අළුත්වැඩියා කිරීම හා පාරිභෝගික ආකර්ෂණය ඇතිවන පරිදි සකස් කිරීම (අනුරාධපුරය, කුරුණෑගල, මාතර, යාපනය, මහව, මහනුවර, හම්බන්තොට, ඇඹිලිපිටිය, ගාල්ල, පොළොන්නරුව, බදුල්ල, නුවරඑළිය, මන්නාරම, කළුතර, තඹුත්තේගම)
- මණ්ඩලීය නිවාඩු නිකේතන වශයෙන් මහනුවර නිවාඩු නිකේතනය ආරම්භ කිරීම.
- මණ්ඩලීය රක්ෂණ අලෙවි කටයුතු විධිමත් කිරීම සඳහා නව බාහිර නියෝජිතයින් බඳවා ගැනීම සහ රක්ෂණ ක්‍රමවේද පිළිබඳව දීප ව්‍යාප්තව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලීය බාහිර අලෙවි නියෝජිතයින් ලෙස බඳවා ගනු ලැබූ නියෝජිතයින් සමඟ නියෝජිත හමු පැවැත්වීම. (මන්නරාම, මාතලේ)
- කෘෂිකර්ම අමාත්‍යතුමා ඇතුළු රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් වගා හානි වන්දි චෙක්පත් බෙදාදීමේ උත්සව පැවැත්වීම (රත්නපුර, කුරුණෑගල, ඇඹිලිපිටිය, මහව, හම්බන්තොට, අඹුණුකොළපැලැස්ස, මුරවැසිහේන, සූරියවැව, මයුරපුර)
- රත්නපුර, මහනුවර, මොණරාගල දිස්ත්‍රික්කන්ගේ ජංගම ප්‍රචාරණ වැඩසටහන් සිදු කිරීම.
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ පැවති "දක්ෂිණ ජන මෙහෙවර" වැඩසටහන

සඳහා සම්බන්ධ වී අලෙවි ප්‍රවර්ධන කුටියක් පවත්වාගෙන යාම.

- උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කළ ප්‍රදර්ශනය සඳහා යාපනය දිස්ත්‍රික් නිලධාරීන් මණ්ඩලය වෙනුවෙන් සම්බන්ධ කරවීම සහ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දෙහිඅත්තකණ්ඩිය පශු සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගීවූ ගොවීන් 600 දෙනෙකු දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ‘‘කෘෂි රක්ෂණ අභිමන්‘‘ තරඟාවලිය දිස්ත්‍රික් කාර්යාලයන් අතර පැවැත්වීම.
- 2024 යල කන්නයේ වගාහානි පරීක්ෂාවන් සඳහා මණ්ඩලීය නිලධාරීන් සහභාගී කරවීම.
- 2024/25 මහ කන්නයේ ගංවතුර හේතුවෙන් වගා හානි සිදුවූ අම්පාර, ත්‍රිකුණාමලය, කිලිනොච්චිය, මඩකලපුව, වව්නියාව, මුලතිව් , පොළොන්නරුව, තඹුත්තේගම ඇතුළු දිස්ත්‍රික් වෙත වගා හානි පරීක්ෂා කිරීමේ ක්ෂේත්‍ර නිරීක්ෂණ කණ්ඩායම් යොමු කිරීම හා වගා හානි පරීක්ෂාවන් සිදු කිරීම.

රක්ෂණ අංශය

3 පරිච්ඡේදය

➢ වගා රක්ෂණ

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ රක්ෂණ අංශය මඟින් සිදු කෙරෙන ප්‍රධාන කාර්යය වනුයේ රක්ෂණ යෝජනා ක්‍රම සකස් කිරීම, ඒවා පිලිබඳව දැනුවත් කිරීම මෙන්ම ක්‍රියාත්මක රක්ෂණ යෝජනා ක්‍රම යටතේ පැන නගින හිමිකම් සඳහා වන්දි මුදල් නිදහස් කිරීමට අදාළ රාජකාරි සිදු කිරීම වේ. ඒ අනුව අංශයේ රාජකාරීන් පහත සඳහන් අයුරින් සිදු කරන ලදී. එනම්, පෙර වර්ෂ වලදී මෙන්ම වගා හානි පරීක්ෂා කිරීම් හා වන්දි මුදල් සාරාංශය පහත පරිදි වේ

➢ වන්දි ගෙවීම්





කන්නය	ගොවීන් ප්‍රමාණය	අක්කර ප්‍රමාණය	වන්දි මුදල රු (මිලියන)
2023 යල	36629	30,627	726.11
2023/24 මහ	76,189	131,277	1,734.57
2024 යල	2691	2,573	56.24
එකතුව	**115,509**	**164,477**	**2,516.92**

වන්දි මුදල් නිදහස් කිරීමේ කාර්යයට මුල් තැන දී රාජකාරි කිරීමට කටයුතු කරන ලදී.

2023/24 මහ කන්නයට හා 2024 යල කන්නයේ වගා හානි වන්දි මුදල් ගෙවීමට අදාලව උපදෙස් නිකුත් කර වන්දි ගෙවීම් සඳහා පසුබිම සකස් කරන ලදී.

2023 යල කන්නයේ වන්දි ගෙවීම් හා 2023/24 මහ කන්නයේ වන්දි ගෙවීම් අවසන් කරන ලදී. එසේම 2024 යල කන්නයේ වන්දි ගෙවීම් 80% ම 2024 වර්ෂය තුලදී අවසන් කරන ලදී .

වන්දි මුදල් නිදහස් කිරීමේදී වන්දිලාභීන් සඳහා නිකුත් කල යුතු හදිසි අනතුරු රක්ෂණ සහතිකය නිකුත් කිරීම පවත්නා තත්වය තුල මෙහෙයුම් වියදම වැඩිවී ඇති බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර රක්ෂණ සහතිකය නිකුත් කිරීම වෙනුවට SMS මාර්ගයෙන් ගොවින් දැනුවත් කිරීමට කටයුතු කරන ලද අතර සෑම ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයකම ගොවීන්ට හදිසි අනතුරු රක්ෂණයක් ඇති බවට පෝස්ටරයක් ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන ලදී. එසේම මණ්ඩලයේ වෙබ් පිටුවේද මෙම රක්ෂණය පිළිබඳව තොරතුරු ඇතුලත් කිරීමට කටයුතු කරන ලදී .

වන්දි මුදල් නිදහස් කිරීමේදී ගොවීන්ගේ ගිණුම් වලට වන්දි මුදල නිකුත් කිරීමෙන් අනතුරුව දුරකථන අංක ලබා දී ඇති ගොවීන්ගේ දුරකථන

අංක වලට මුදල් ගිණුම් ගත කර ඇති බවට පණිවිඩයක් යැවීමටද කටයුතු කරන ලදී.

2023/24 මහ කන්නය, 2024 යල කන්නය හා 2024/25 මහ කන්නයේ වගා හානි වූ දිස්ත්‍රික්වල වගා හානි පරීක්ෂාවට කණ්ඩායම් යොදවා හානි පරීක්ෂා කරන ලද අතර ඒ මගින් රජයේ වගකීම හඳුනා ගැනීමට කටයුතු කරන ලදී. වර්ෂය තුලදී වගා හානි පරීක්ෂාවන් හා වන්දි ගණනය කිරීමේ වැඩසටහන් සඳහා මෙහෙයුම් වියදම් ලෙස මිලියන 6ක් පමණක් මුදලක් වැයවී ඇත. 2023/24 මහ කන්නයේ ඇති වූ ගංවතුර තත්ත්වය හා 2024/25 මහ කන්නයේ ඇතිවූ ගංවතුර හේතුවෙන් කඩිනමින් වගා හානි පරීක්ෂාවන් සිදු කිරීමට කටයුතු කරන ලදී. එමඟින් සත්‍ය හානිය හඳුනා ගැනීමට හැකි විය.

➢ රක්ෂණ කටයුතු කිරීම



එසේම 2024 වර්ෂය තුලදී අනිවාර්ය බෝග වගා 06 සඳහා පැවති රක්ෂණ යෝජනා ක්‍රමය යාවත්කාලීන කරන ලදී . වන්දි හිමිකම් ෆෝරමය යාවත්කාලීන කරන ලදී . එමගින් Giyo Goviyaa තොරතුරු ලබා ගැනීමටද අවශ්‍ය පසුබිම සකස් කර ගෙන ඇත.

අනිවාර්ය බෝග වගා රක්ෂණය යටතේ වනඅලින්ගෙන් සිදු වන හානිය පරීක්ෂා කිරීමේදී සමහර ප්‍රදේශ වල ප්‍රමාණවත් තරම් වන ජීවී /වන සංරක්ෂණ නිලධාරීන් ප්‍රමාණවත් නොවන බවට දිස්ත්‍රික් මට්ටමින් වාර්තා කරන ලද බැවින් 07/2017 චක්‍රලේඛය සංශෝධනය කර එම නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට නොහැකි අවස්ථාවලදී ග්‍රාම නිලධාරීන් ඒ සඳහා යොදා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගන්නා ලදී.

එසේම අනිවාර්ය වගා රක්ෂණයට රතුළූණු වගාව ඇතුලත් කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අමාත්‍යාංශය වෙත යැවීමට කටයුතු කර ඇත.

රක්ෂණ කටයුතු වලට අදාලව ERP සඳහා තොරතුරු ලබා දෙමින් එම කාර්ය කිරීම සඳහා අංශයෙන් ලබා දිය යුතු සහය ලබා දී ඇත.

රබර් වගාව සඳහා රක්ෂණයක් අවශ්‍ය බව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් වාර්තා කරන ලද බැවින් ඒ සඳහා රක්ෂණ යෝජනා ක්‍රමයක් සකස් කර න ලදී.

එසේම උක් වගා රක්ෂණය රක්ෂිත මුදල වැඩි කර යාවත්කාලීන කරන ලදී. තවද පැපොල් වගා රක්ෂණය යාවත්කාලීන කරන ලදී.

වගා රක්ෂණයේදී විභවත්වය අනුව ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා ඉලක්ක ලබා දීමට කටයුතු කර ඒ අනුව වගා රක්ෂණ කටයුතු පුළුල් කිරීමට දිස්ත්‍රික්වලට අවස්ථාව ලබා දෙන ලදී.

මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ හරහා ඉදි කෙරුණු ලවන බාධකය හේතුවෙන් වගාවන්ට සිදු වූ හානිය සඳහා ගොවින් විසින් වන්දි ඉල්ලා ඇතිමුත් එම හානිය පවත්නා චක්‍රලේඛයෙන් ආවරණය නොවන බැවින් එම ගොවීන්ට සිදුව ඇති හානිය සඳහා වන්දි ගෙවීමට ප්‍රතිපාදන ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කර අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කරන ලදී.

එයට අමතරව අංශ සමඟ සම්බන්ධ වී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් විගණන කටයුතු සඳහා අදාල පිළිතුරු සපයමින් ලැබෙන උපදෙස් පරිදි ක්‍රමවේදයන් සකස් කර ගැනීමට කටයුතු කිරීමත් මූලිකවම සිදු කරන ලදී.

එසේම ආයතනයේ පවතින සෙසු අංශ සමඟ ඒකාබද්ධව කටයුතු කිරීමත් දිස්ත්‍රික් කාර්යාල සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙමින් රක්ෂණ කටයුතු මෙහෙයවීමත් රක්ෂණ අංශය මඟින් සිදු කරන ලදී.

පශු රක්ෂණය



වගා රක්ෂණයට අමතරව පශු රක්ෂණ කටයුතුවලටද 2024 වර්ෂයේදී විශේෂ අවධානය

යොමු කර රක්ෂණ කටයුතු මෙහෙයවීමට කටයුතු කර ඇත.

සත්ත්ව වර්ගය	අදායම රු. (මිලියන)	වන්දි ගෙවීම් රු. (මිලියන)
ගව රක්ෂණය	9.8	3
එළු රක්ෂණය	9.9	2.5
එකතුව	**19.7**	**5.5**

එළුවන් රක්ෂණය කිරීමේදී වයස මාස 6ට අඩු සතුන් සඳහා රක්ෂණ අවශ්‍ය බව තහවුරු වීම හේතුවෙන් ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර ඒ සඳහා රක්ෂණය ලබා දීමට කටයුතු කරන ලදී.

එසේම පශු වෛද්‍ය නිලධාරීන් සඳහා පශ්චාත් මරණ පරීක්ෂණ වලදී ලබා දෙනු ලබන දීමනාව වැඩි කර පශු සම්පත් රක්ෂණය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන ලදී.

නියමු වැඩසටහනක් ලෙස සුරතල් සතුන් රක්ෂණය කිරීම සඳහා රක්ෂණ යෝජනා ක්‍රමයක් සකස් කරන ලදී.

ඒ අනුව 2024 වර්ෂය තුලදී රක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යක් ලෙස රක්ෂණ යෝජනා ක්‍රම යටතේ වන්දි ගෙවීම්හි සමස්ථ සාරාංශය පහත පරිදි වේ.

සමස්ථ වන්දි ගෙවීම්

රක්ෂණ වර්ගය	ගොවීන් සංඛ්‍යාව	වන්දි මුදල රු මිලියන
වගා රක්ෂණ	132,416	3,002.00
පශු රක්ෂණ	156	5.50
එකතුව	**132,572**	**3,007.50**

එසේම වර්ෂය අවසාන වන විට, 2023 යල, 2023/24 මහ, 2024 යල කන්නයන්ට අදාලව අභියාචනා සලකා බැලීම සිදු කරමින් ඇත. එසේම 2024/25 මහ කන්නයේ වගා හානි වන්දි ගෙවීම් වලට අදාලව මූලික රාජකාරි කටයුතු ආරම්භ කර ඇත.

තවද 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව හා 2025 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම සඳහා රක්ෂණ අංශයේ රාජකාරි ලබා දීමට කටයුතු කරන ලදී

2024/25 මහ කන්නයේ නොවැම්බර් මස ඇති වූ ගංවතුර හේතුවෙන් සිදුවූ වගා හානි සඳහා කඩිනමින් වන්දි ගෙවීමට අවශ්‍ය පසු බිම සකස් කරන ලදී

අමතර වශයෙන් පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න,ගොවීන්ගෙන් ලැබෙන ලිපි, අමාත්‍යාංශයෙන් ලැබෙන ලිපි හා වෙනත් ආයතන වලින් ලැබෙන ලිපි කෙරෙහි ආවධනය යොමු කර රාජකාරි සිදු කර ඇත

තවද 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කෙරෙන රක්ෂණ යෝජනා ක්‍රම සකස් කිරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කරන ලදී.


අභ්‍යන්තර විගණන අංශය

4 පරිච්ඡේදය

2024 වර්ෂය සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ක්‍රියාත්මක රක්ෂණ සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා ඒ ඒ අංශ සහ දිස්ත්‍රික් කාර්යාල අනුව පිලියෙල කරන ලද වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහනට අනුකූලව අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සඳහා පවතින අවදානම් කලමණාකරණය කිරීමේ අරමුණ මූලික කොටගෙන එක් එක් අංශ සහ දිස්ත්‍රික් කාර්යාල වල කටයුතු කාර්යක්ෂමව හා සඵලදායිව ඉටු කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති අභ්‍යන්තර පාලන ක්‍රමවල ප්‍රමාණාත්මකභාවය, නිරවද්‍යභාවය හා ඒවායේ ක්‍රියාකාරිත්වය ඇගයීම සඳහා එක් ක්ෂේත්‍ර යටතේ අභ්‍යන්තර විගණන පරීක්ෂණ සැලසුම්කොට ක්‍රියාත්මක කරන ලදී.

අභ්‍යන්තර විගණන චක්‍රය



ඒ අනුව, අභ්‍යන්තර විගණන අංශයේ සහකාර අධ්‍යක්ෂ, සංවර්ධන නිලධාරි හා කළමණාකාර සහකාර නිළධාරිනිය සේවය සහිතව 2024 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන පරීක්ෂණ 29 ක් ප්‍රධාන කාර්යාලීය එක් එක් අංශ සහ භූගෝලීය මට්ටමින් ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික් කාර්යාල 30 පදනම් කොටගෙන සිදුකරන ලදි.

පාලන අංශය

1. මණ්ඩලිය සංචිත වාහන ධාවනය නඩත්තුව, අළුත්වැඩියාව හා ඉන්ධන භාවිතය පිලිබඳව කළමණාකරන විගණන වාර්තාව.

2. නිළධාරීන්ට වැටුප් ගෙවීම හා වැටුප් වර්ධක ගෙවීම පිළිබඳ කළමණාකරන විගණන වාර්තාව

මුදල් අංශය

1. මුදල් පොත් හා බැංකු ගිණුම් පරීක්ෂාව - ගිණුම් අංක 001622 දරණ පශු රක්ෂණ ගිණුම. ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ගිණුම් අංක 112347 දරණ ගිණුම
2. මිශ්‍ර අත්තිකාරම් ලබා ගැනීම හා අත්තිකාරම් පියවීම පිළිබඳ කළමණාකරන විගණන වාර්තාව.
3. 2018 අංක 19 දරණ ජාතික විගණන පනත ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන විගණකාධිපති අවසන් වාර්තාවල ඇතුලත් ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කරගැනීම සම්බන්ධ කළමණාකරන විගණන වාර්තාව

රක්ෂණ අංශය

1. වන්දි ගෙවීම් ගණනය කිරීම සම්බන්ධ කළමණාකරන විගණන වාර්තාව - 1. පශු රක්ෂණ වන්දි ගෙවීම
   2. වී වගා හානි වන්දි ගෙවීම.
   3. බඩ ඉරිඟු වන්දි ගෙවීම.

ගොවි විශ්‍රාම වැටුප්

2018 අංක 19 ජාතික විගණන පනත ප්‍රකාරව ඉදිරිපත් කරනු ලැබූ විගණකාධිපති අවසන් වාර්තා වල ඇතුලත් ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කර ගැනීම සම්බන්ධ කළමණාකරණ විගණන වාර්තා තුල ගොවි විශ්‍රාම වැටුප් අංශයට නිවැරදි කර ගැනීමට පවතින අඩුපාඩු සම්බන්ධයෙන් කරුණු ද ඇතුලත් කර ඇත.

දිස්ත්‍රික් කාර්යාල

මාතලේ, පුත්තලම, ත්‍රිකුණාමලය, බදුල්ල, අම්පාර, මඩකලපුව, කළුතර යන දිස්ත්‍රික්කවල කාර්යාල කටයුතු සිදුකර ඇති ආකාරය හා රක්ෂණ කටයුතු දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කර ඇති ආකාරය පරීක්ෂා කරමින් කළමණාකරණ අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කර ඇත.

විගණන කළමණාකරණ කමිටු.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති රජය සතු ව්‍යාපාර සඳහා (SOE) වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 අනුව මණ්ඩලයේ විගණන හා කළමණාකරණ කමිටු සාමාජිකයන් පත්කරගැනීම, රැස්වීම් කැඳවීම හා වාර්තා කිරීම සිදුකරනු ලබයි.

නිරීක්ෂණ නිලධාරීන්.

1. ප්‍රධාන අභ්‍යන්තර විගණන - කෘෂිකර්ම අමාත්‍යාංශය.
2. විගණන අධිකාරි - ජාතික විගණන කාර්යාලය.

පරිපාලන හා මානව සම්පත් අංශය

5 පරිච්ඡේදය

2024 වසර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ හි මානව සම්පත් හා පරිපාලන අංශය සම්බන්ධයෙන් ගත් කල, අපගේ සේවක පිරිසෙහි වර්ධනය සහ ඔවුන්ගේ දායකත්වය අගය කිරීම කෙරෙහි කැපී පෙනෙන වසරක් විය. ආයතනයේ සමස්ත මෙහෙයුම් සාර්ථකත්වයට අත්‍යවශ්‍ය වන, කාර්යක්ෂම සහ සහයෝගී සේවා පරිසරයක් පවත්වා ගැනීමට අපට හැකි විය.

මෙම වසර තුළ දී, සේවක සුබසාධනය, පුහුණුව සහ සංවර්ධනය, කාර්ය සාධන කළමනාකරණය, සහ බඳවා ගැනීමේ ක්‍රියාවලින් වැඩිදියුණු කිරීම සඳහා සැලකිය යුතු පියවර ගනු ලැබීය. අපගේ ප්‍රධාන අවධානය යොමු වූයේ සේවකයන්ගේ වෘත්තීය වර්ධනයට අනුබල දීම, නව කුසලතා සංවර්ධනය කිරීම, සහ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන්ට අවශ්‍ය සහයෝගය ලබා දීමයි.

අඛණ්ඩ ඉගෙනීම සහ අනුවර්තනය වීමේ වැදගත්කම අවධාරණය කරමින්, නවීන තාක්ෂණයන් සහ උපාය මාර්ග භාවිතයෙන් අපගේ මෙහෙයුම් තවදුරටත් ඩිජිටල්කරණය කිරීමට පියවර ගන්නා ලදී. එමගින්, මානව සම්පත් ක්‍රියාවලීන් වඩාත් විධිමත් කරමින්, දත්ත විශ්ලේෂණය තුළින් වඩාත් නිවැරදි තීරණ ගැනීමට අවශ්‍ය පදනම සකස් කරන ලදී. ඒ අනුව මණ්ඩලය වෙත හඳුන්වා දීමට කටයුතු කරන ලද නව ව්‍යාපාර සම්පත් සැලැස්ම (ERP) ට අනුකූලව මණ්ඩලීය නිළධාරීන් වෙත හඳුන්වා දී ඇති මානව සම්පත් තොරතුරු පද්ධතිය(HRIS) මඟින් නිළධාරීන්ගේ පැමිණීම,නිවාඩු,අතිකාල සඳහා අනුමැතිය ලබා ගැනීම, නිළධාරීන් බඳවා ගැනීමේ සිට විශ්‍රාම යාම දක්වා සියළුම කටයුතු ඩිජිටල්කරණය කර ඇත.

AAIB හි මානව සම්පත් හා පරිපාලන අංශය ලෙස, අපගේ සේවක සේවිකාවන් ආයතනයේ වටිනාම සම්පත ලෙස සලකන අතර, ඔවුන්ගේ කැපවීම, දක්ෂතාවය සහ අඛණ්ඩ දායකත්වය අපගේ සාර්ථකත්වයට අත්‍යවශ්‍ය බව අවධාරණය කරමු. 2024 වසරේදී ලබාගත් සාර්ථකත්වය මත පදනම්ව, අනාගතයේදී ද AAIB හි මානව සම්පත් කළමනාකරණය තවදුරටත් උසස් තත්ත්වයකට ගෙන ඒමට අප අපේක්ෂා කරමු.

1. කාර්ය මණ්ඩලය

2024.12.31 දිනට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ 2024.12.31 දිනට කාර්ය මණ්ඩල විශ්ලේෂණය

1. කාර්ය මණ්ඩල සංයුතිය

1.1 සේවා ගණය අනුව ස්ථිර කාර්ය මණ්ඩලයේ සංයුතිය

සේවාගණය	තනතුරු නාමය	අනුමත සේවක සංඛ්‍යාව	සිටින සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ				
	අධ්‍යක්ෂ ජනරාල්	1	1	-
	අධ්‍යක්ෂ	5	1	4
කළමනාකරණ				
	නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ	45	38	7
කනිෂ්ඨ කළමනාකරණ				
	පරිපාලන නිලධාරි	2	2	-
	පද්ධති පරිපාලක	1	1	-
	මූල්‍ය නිලධාරි	1	-	1
	සැලසුම් නිලධාරි	1	-	1
ආශ්‍රිත නිලධාරි				
	සංවර්ධන නිලධාරි	55	40	15
	සැපයුම් නිලධාරි	1	-	1
	අභ්‍යන්තර විගණන නිලධාරි	1	-	1
කළමනාකරණ සහකාර (තාක්ෂණික)				
	ප්‍රවාහන සහකාර	1	1	-
	ලේකම්	1	1	-
	පොත් තබන්නා	4	1	3
	දෘඩාංග හා ජාලකරණ ශිල්පී	1	1	-
	කාර්මික ශිල්පී (ශ්‍රව්‍ය/දෘශ්‍ය)	1	-	1
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)				
	කළමනාකරණ සහකාර	220	191	29
ප්‍රාථමික (ශිල්පීය)				
	රියදුරු	38	19	19
ප්‍රාථමික (ශිල්පීය නොවන)				
	කාර්යාල සහායක	42	30	12
	එකතුව	**421**	**327**	**94**


මණ්ඩලයේ කාර්යභාර්ය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ස්ත්‍රීස්ත්‍රික් කාර්යාල සඳහා පහත සඳහන් තනතුරු වෙනුවෙන් නිලධාරීන් බඳවා ගන්නා තෙක් පවතින පුරප්පාඩු වලිඹ්කාන්ත්‍රාත් පදනමින් නිලධාරීන් යොදවාගෙන ඇත. අත්‍යාවශ්‍යම තනතුරු කිහිපයක් සඳහා ප්‍රධාන කාර්යාලය හා

1.2 ස්ථිර නොවන සේවනයන්

සේවාගණය	තනතුරු නාමය	සිටින සංඛ්‍යාව
ආශ්‍රිත නිලධාරී	සංවර්ධන නිලධාරී	7
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	කළමනාකරණ සහකාර/ක්ෂෙත්‍ර	17
ප්‍රාථමික (ශිල්පීය)	රියදුරු	12
ප්‍රාථමික (ශිල්පීය නොවන)	කාර්යාල සහායක (සනීපාරක්ෂක කම්කරු)	9
	එකතුව	**45**

1.3 කාර්ය මණ්ඩලයේ ස්ත්‍රී /පුරුෂ විශ්ලේෂණය

ස්ත්‍රී / පුරුෂභාවය	සේවක සංඛ්‍යාව
පුරුෂ	153
ස්ත්‍රී	174
එකතුව	**327**




1.4 සේවා කාලය අනුව විශ්ලේෂණය

අවුරුදු	සේවක සංඛ්‍යාව	ප්‍රතිශතය
30 ට වැඩි	15	5%
26 - 30	7	3%
21 - 25	9	3%
16 - 20	44	10%
15 ට අඩු	252	79%
එකතුව	**327**	**100%**

1.5 වයස් විශ්ලේෂණය

වයස් කාණ්ඩය	සේවක සංඛ්‍යාව	ප්‍රතිශතය
56 - 60	23	8%
51 - 55	28	9%
46 - 50	54	16%
41 - 45	51	16%
36 - 40	34	10%
31 - 35	33	10%
30 ට අඩු	104	31%
එකතුව	**327**	**100%**



1.6 2024 වර්ෂය තුළ විශ්‍රාම යාම්, මිය යාම් හා සේවයෙන් ඉවත්වීම්

2024 වර්ෂය තුළදී මණ්ඩලයේ සේවයේ නියතු නිලධාරීන්ගෙන් පහත සඳහන් හේතූන් මත නිලධාරීන් 21 දෙනෙකු සේවයෙන් ඉවත්ව ගොස් ඇත.

	තනතුරු නාමය	සංඛ්‍යාව	සේවය අවසන් කිරීමට හේතුව
1	අධ්‍යක්ෂ ජනරාල්	1	විශ්‍රාම යාම
2	සංවර්ධන නිලධාරි	1	විශ්‍රාම යාම
		7	සේවයෙන් ඉල්ලා අස්වීම
	කළමනාකරණ		
3	සහකාර	4	විශ්‍රාම යාම
		4	සේවයෙන් ඉල්ලා අස්වීම
4	කාර්යාල සහයක	1	විශ්‍රාම යාම
		1	සේවයෙන් ඉල්ලා අස්වීම
5	රියදුරු	2	සේවයෙන් ඉල්ලා අස්වීම

1. 2024 වර්ෂය තුළ බඳවා ගැනීම් හා උසස් කිරීම්

මෙම වර්ෂයේදී කළමනාකරණ සහකාර තනතුරු පුරප්පාඩු සඳහා නිලධාරීන් 13 දෙනෙකුද බඳවා ගැනීමට කටයුතු කරන ලදී.

2. පුහුණුව සහ සංවර්ධනය - 2024

විස්තරය	වියදම (රු)
අභ්‍යන්තර හා බාහිර පුහුණු	1,014,411
කාර්යක්ෂමතා කඩයිම් විභාග	1,751,325

3. සේවක අනෙකුත් ප්‍රතිලාභ

ප්‍රතිලාභය	මුදල (රු)
සෞඛ්‍ය රක්ෂණය	2,139,329
පාරිතෝෂික	20,384,363
දිරි දීමනා	18,056,415

සේවක සුභසාධනය

වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය,යතුරු පැදි හිමි නිලධාරීන්ට යතුරුපැදි ණය ලබාදීම පෙර වර්ෂයේ දී මෙන් මෙම වර්ෂය තුළ ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

මණ්ඩලිය ආයතනික කටයුතු සඳහා මණ්ඩලිය ප්‍රධාන කාර්යාලය නො.117, සුභද්‍රාරාම පාර,ගංගොඩවිල,නුගේගොඩ යන ලිපියෙහි පවත්වාගෙන යනු ලබන අතර, දිස්ත්‍රික් කාර්යාල කටයුතු සඳහා දිවයින පුරා පිහිටි දිස්ත්‍රික් කාර්යාල 30ක් මඟින් දේශීය කෘෂිකාර්මිකයාට සේවය සැලසීම සඳහා කාර්යාල ස්ථාපනය කර ඇත.
මණ්ඩලිය මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය සියළුම ප්‍රසම්පාදන කටයුතු පාලන හා මානව සම්පත් අංශය විසින් සිදුකර ඇති අතර, 2023 වර්ෂය අවසානයේ පැවති වාහන සංචිතය සඳහා 2024 වර්ෂය තුල අනෙකුත් රාජ්‍ය ආයතන මගින් ලබාදුන වශයෙන් වාහන 10ක් ලබා දී ඇති අතර, ඒ අනුව මණ්ඩලිය වාහන සංචිතය තුල වාහන 39ක පවති.

2024 වර්ෂය තුල මණ්ඩලිය අභ්‍යන්තර පරිපාලන කටයුතු ශක්තිමත් කරලීම සඳහා පරිපාලන කාර්යය පටිපාටි සංග්‍රහය, සකස් කිරීමට කටයුතු කරන ලද අතර,මණ්ඩලිය බඳවා ගැනීමේ පරිපාටිය යාවත්කාලීන කිරීම සඳහා කටයුතු කරන ලදී.

සැලසුම් අංශය

6 පරිච්ඡේදය

තාක්ෂණය සහ කෘෂි රක්ෂණය

පාර්ශවකාර හවුල්කාරිත්වය දිරිගැන්වීම

හදිසි ආපදා තත්ත්ව වලදී, හානියට පත් කෘෂිකාර්මික වගා බිම් අධීක්ෂණය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඩ්‍රෝන තාක්ෂණ සහය ලබා ගැනීමට අදාළව 2024 මැයි මස 20 වන දින කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව අතර, වසර දෙකක් සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී.


හදිසි හා විශාල ආපදා තත්ත්ව වලදී, වගා හානියට පත් කෘෂිකර්මිකයන් හට කඩිනමින් සහන සැලසීම මෙමගින් තහවුරු කෙරේ.











තාක්ෂණික විශේෂඥ සහාය ලබා ගැනීම

2023/24 මහ කන්නය තුළ මඩකලපුව දිස්ත්‍රික්කය ආශ්‍රිතව වැඩි වශයෙන් වගා හානි වීම් වාර්තා වූ ප්‍රදේශ, ශ්‍රී ලංකා සබරගමු විශ්වවිද්‍යාලයේ විෂය ප්‍රවීණ මහාචාර්යවරුන්ගේ තාක්ෂණික සහය ඇතිව LiDAR වන්දිකා ඡායාරූප යොදා ගනිමින් වැඩිදුර විශ්ලේෂණය කරන ලදී.

මෙම පර්යේෂණ කටයුතු ඉදිරි කන්න කිහිපය තුල වැඩි අවදානම් කලාප මූලික කරගනිමින් තවදුරටත් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.


2021/22 මහ කන්නයේ සිට 2023/24 මහ කන්නය දක්වා හානි ස්වාභාවය හා ගෙවූ වන්දි ප්‍රමාණය සම්බන්ධ දත්ත යොදා ගනිමින්, වැඩි අවදානම් කලාප සිතියම් ගත කිරීමේ කටයුතු සිදු කරන ලදී. එහිදී කන්නමය වශයෙන් නිරන්තරව ඉහල වන්දි මුදලක් ගෙවනු ලබන ගොවිජන සේවා මධ්‍යස්ථාන හඳුනාගන්නා ලදී.


මේ සඳහා හේතුවන ශෂ්‍ය විද්‍යාත්මක, පාරිසරික, සමාජීය හා ආර්ථික තත්ත්වයන් පිළිබඳ අධ්‍යයනය හා එම ගැටළු සඳහා ආයතනික හා රාජ්‍ය මට්ටමේ විසඳුම් ලබා ගැනීම මෙහි අරමුණයි.

අවදානම් කලාප සිතියම් ගත කිරීම

2021/22 මහ කන්නයේ සිට 2023/24 මහ කන්නය දක්වා හානි ස්වාභාවය හා ගෙවූ වන්දි ප්‍රමාණය සම්බන්ධ දත්ත යොදා ගනිමින්, වැඩි අවදානම් කලාප සිතියම් ගත කිරීමේ කටයුතු සිදු කරන ලදී. එහිදී කන්නමය වශයෙන් නිරන්තරව ඉහල වන්දි මුදලක් ගෙවනු ලබන ගොවිජන සේවා මධ්‍යස්ථාන හඳුනාගන්නා ලදී.

මේ සඳහා හේතුවන ශෂ්‍ය විද්‍යාත්මක, පාරිසරික, සමාජීය හා ආර්ථික තත්ත්වයන් පිළිබඳ අධ්‍යයනය හා එම ගැටළු සඳහා ආයතනික හා රාජ්‍ය මට්ටමේ විසඳුම් ලබා ගැනීම මෙහි අරමුණයි.





රාජ්‍ය ව්‍යාපෘති සඳහා ආයතනික දායකත්වය


NCRCS ණය යෝජනා ක්‍රමය සඳහා, ණය ඇපකර රක්ෂණාවරණයක්

කෘෂිකාර්මික කටයුතු සඳහා ගොවීන් වෙත ප්‍රාග්ධන සම්පාදනය සඳහා ස්ථාවර ක්‍රමවේදයක් ස්ථාපනය වෙනුවෙන්, කෘෂිකාර්මික ණය ලබා දීම සඳහා මූල්‍ය ආයතන දිරිගැන්වීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීම පරිදි, NCRCS ණය යෝජනා ක්‍රමවේදය සඳහා ක්‍රියාත්මක, කෘෂිකාර්මික ණය රක්ෂණ යෝජනා ක්‍රමවේදය යාවත්කාලීන කිරීම හා මූල්‍ය ආයතන වෙත, ණය ඇපකර රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට අදාළව, මණ්ඩලීය සැලසුම් අංශයේ සම්බන්ධීකරණය යටතේ, පත් කරන ලද කමිටුවේ නිර්දේශ මත ව්‍යාපෘති යෝජනා සකස් කරන ලදී. උක්ත ව්‍යාපෘති යෝජනා ඉදිරි කටයුතු සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.


ආයතනික සැලසුම්කරණය


Integrated Rurban Development and Climate Resilience Project

කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත Integrated Ruban Development and Climate Resilience ව්‍යාපෘතිය සඳහා, පාර්ශවකාර ආයතනයක් වශයෙන්, කෘෂිකර්මිකයින් හට විධිමත් රක්ෂණ සේවාවක් සැපයීය සඳහා හා කෘෂි අවදානම් කළමනාකරණය තුළින් ව්‍යාපෘතිය සඳහා දායක වන රාජ්‍ය හා පෞද්ගලික මූල්‍ය ආයතනයන්හි මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීම වන යෝජනා ක්‍රමය අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.



2023 – 2025 සංයුක්ත සැලැස්මට අදාළව, 2024 වර්ෂය සඳහා සැලසුම් කරන ලද උපායමාර්ගික සැලසුම් අනුව, වාර්ෂික මූල්‍ය හා භෞතික ඉලක්කයන් සකස් කර, විභවතාව අනුව දිස්ත්‍රික් වෙත යොමු කරන ලද අතර, දිස්ත්‍රික් බලප්‍රදේශ හා නිලධාරී විභවය මත, දිස්ත්‍රික් ඉලක්කයන් නිලධාරීන් වෙත යොමු කරන ලදී. එම ඉලක්කයන් ලහා කරගැනීම සඳහා මාසිකව සකසන ලද ඉදිරි වැඩ සැලසුම් අනුව, ක්ෂේත්‍ර ගත කටයුතු ක්‍රියාත්මක විය. තවද වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මට අනුව විවිධ අංශයන් මූලික කරගනිමින් සංවර්ධන හා අනෙකුත් මෙහෙයුම් ක්‍රියාවලීන් සිදු කෙරිණි.





දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචනය

දිස්ත්‍රික් ප්‍රගතිය ***Progress Recorder 2024*** මගින් මාසිකව සමාලෝචනය කෙරෙන අතර කාර්තුමය වශයෙන් දිස්ත්‍රික් ප්‍රධානීන්ගේ සහභාගිත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්විණි. ඒ අනුව 2023 වාර්ෂික අවසන් ප්‍රගති සමාලෝචනය හා 2024 වර්ෂයේ පළමු, දෙවන හා තෙවන කාර්තු සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කෙරිණි. 2024 වාර්ෂික අවසන් ප්‍රගති සමාලෝචනය 2025 වර්ෂයේ මුල් මාසයන්හි පැවැත්වීමට නියමිතය. තවද, වඩාත් ඉලක්කගත ප්‍රගති සමාලෝචනයක් අරමුණු කරගනිමින් ක්ෂේත්‍ර ගත කාර්යමණ්ඩලය පළාත් මට්ටමින් කැදවමින් නිලධාරී ප්‍රගතිය සෘජුව සමාලෝචනය කරන ලදී.

වඩාත් කාර්යක්ෂම හා ඉලක්කගත වර්ධනයක් අරමුණු කරගනිමින් මෙම ප්‍රගති සමාලෝචන වැඩසටහන වර්ෂය පුරා ක්‍රමවත්ව ක්‍රියාත්මක විය.


ප්‍රගති සමාලෝචනය හා ඇගයීම

2024 ක්‍රියාත්මක සැලැස්මට අනුව ආයතනික ප්‍රගතිය, සැලසුම් අංශය මගින් අංශ මට්ටමින් අර්ධ වාර්ෂිකව සමාලෝචනය කෙරෙන අතර එම වාර්තා විගණන කළමනාකරණ කමිටුවේ නිර්දේශ සඳහා ඉදිරිපත් කෙරිණි

2024 Progress Recorder — Jaffna

Total Target (for the progress period)	Total Income Earned (within the progress period)	Achievement Percentage (for the progress period)
45,094,000.00	34,367,082.00	76.2%

Composition of the Income (Cash Basis)




Scheme	Earned Income (Cash Basis)	Percentage Contribution to the total Income (%)
Pension	2,639,713.00	7.7%
Crop	5,746,403.00	16.7%
Livestock	533,916.00	1.6%
Pesonal Acc	0.00	0.0%
Third Party	25,447,050.00	74.0%
Stores	0.00	0.0%
2W/ 4W Tractors	0.00	0.0%
Green House	0.00	0.0%
Suwasetha	0.00	0.0%
Mashroom	0.00	0.0%
Agri Equipment	0.00	0.0%

Crop Insurance Scheme

Season	Target: Income	Target: Acers	Progress (Total Progress of the Period): Premium Income Earned	Acres Insured	Policies Issued	Achievement
2023/24 Maha	237,000.00 (for the progress period)	33.0	101,188 (within progress period)	13.81	18	42.70% (from the target of the period)
2024 Yala	2,509,000.00 (for the progress period)	287.0	566,275 (within progress period)	78.13	56	22.57% (from the target of the period)
2024/25 Maha	9,526,000.00 (for the progress period)	1,650.0	4,607,816 (within progress period)	1,636.55	1,093	48.37% (from the target of the period)

Crop wise Progress Analysis (Cash Basis) — for the progress period of the year


Crop Specific Insured Area



Name of the Crop	No. of Acres Insured
Red Onion	744.1
Carrot	5
Banana	1
Chilli	586
Potato	8
Paddy	473

Scheme wise Progress Analysis (Cash Basis) — for the progress period of the year

Income Distribution by Scheme



Scheme Specific Insured Area


Scheme	No. of Acres
Crop Insurance Bank Loan	758.6
Crop Insurance Premium Paid	1
Crop Insurance Additional Coverage	1,036

Monthly Progress and Target Comparison: Current Year vs. Previous Year (Cash Basis)


Monthly Income
2023 vs 2024 and Financial Target vs Progress



Monthly Acers Insured
2023 vs 2024 and Physical Target vs Progress



"Jaffna" District Progress Recorder 2024 – Dashboard



තොරතුරු තාක්ෂණ අංශය

7 පරිච්ඡේදය

2023-06-13 දින අප මණ්ඩලයේ ප්‍රථම වරට තොරතුරු තාක්ෂණය පෙර දැරි කර ගනිමින් ආරම්භ කරන ලද තොරතුරු තාක්ෂණ අංශය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දැක්ම හා මෙහෙවර අනුව යමින්, මණ්ඩලයෙහි මෙහෙයුම් ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම තුළින් වඩාත් ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් ලබා දීම වෙනුවෙන් අවශ්‍ය තාක්ෂණික සැලසුම් සකස් කිරීම, ඒ සඳහා අවශ්‍ය තොරතුරු රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම , එම සැලසුම් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම ආදී කටයුතු වල නිරත විය.

ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලයන් ජාලගතකරණය සිදු කිරීම.

➢ ප්‍රධාන කාර්යාලය ජාලගතකරණය

2024 වර්ෂය අවසාන වන විට ප්‍රධාන කාර්යාලයේ ජාලගතකරණ කටයුතු සඳහා අවශ්‍ය බිම් සැලසුම් සියල්ල, එක් එක් අංශයන්ට අනුකූලව නිර්මාණය කර අවසන් අතර, කාර්යාලයෙහි පාලන අංශය, මුදල් අංශය, රක්ෂණ අංශය, සංවර්ධන අංශය, සැලසුම් අංශය, තොරතුරු තාක්ෂණ අංශය හා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යාලයෙහි ජාලගතකරණ ක්‍රියාවලිය අවසන් කර ඇත.

➢ දිස්ත්‍රික් කාර්යාල ජාලගතකරණය

2021 වර්ෂය තුළ ආරම්භ කරනු ලැබූ දිස්ත්‍රික් කාර්යාල ජාලගතකරණ ක්‍රියාවලිය තොරතුරු තාක්ෂණ අංශය ස්ථාපනය කිරීමත් සමඟ එම ක්‍රියාවලියේ යාවත්කාලීන කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව 2023-08-08 දින Zoom තාක්ෂණ ඔස්සේ දිස්ත්‍රික් කාර්යාලයන් හා ප්‍රධාන කාර්යාලයේ එම අදාළ නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් රැස්වීමක් පැවැත් වූ අතර, එහි දී ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට අනුකූලව මිල ගණන් කැඳවීමේ ලේඛනයන් ලබා ගනිමින් ජාලගතකරණ කටයුතු සිදු කිරීම හා 2021 වර්ෂය තුළ ජාලගතකරණය සිදු කර අවසන් කර ලද දිස්ත්‍රික් කාර්යාලයන්හි යම් අලුත්වැඩියා කටයුතු පවතින්නේ නම් එම අලුත්වැඩියා කටයුතු ද සිදු කරන මෙන් දැනුම් දෙන ලදී.

ඒ අනුව දිස්ත්‍රික් කාර්යාල විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් කැඳවීමේ ලේඛනයන්හි පවතින මිල ගණන් වර්තමාන වෙළෙඳ පොළ මිල ගණන් සමඟ සැසඳීම් සිදු කරමින් ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික සහය තොරතුරු තාක්ෂණ අංශය විසින් ලබා දෙමින්, මේ වන විට දිස්ත්‍රික් කාර්යාල 28ක ජාලගතකරණ ක්‍රියාවලිය අවසන් කර ඇත.

මණ්ඩලයෙහි ප්‍රවර්ධන කටයුතු සඳහා තාක්ෂණික ක්‍රමවේදයන් යොදා ගැනීම.

➢ e-SMS සේවාව පවත්වාගෙන යාම.

තොරතුරු තාක්ෂණ අංශය ස්ථාපනය කිරීමත් සමඟ මණ්ඩලයෙහි ප්‍රචාරණ කටයුතු හා දැනුවත් කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා e -SMS සේවාවක් එනම් කෙටි පණිවිඩ සේවාවක් ආරම්භ කරන ලද අතර එමඟින් සියළුම දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලය තුළ සිදුවන පාරිභෝගික දැනුවත් කිරීම් හා අනෙකුත් ප්‍රවර්ධන වැඩසටහන් මෙම කෙටි පණිවිඩ සේවාව ඔස්සේ සිදු කරමින් පවතී.

තව ද, ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාළ දායකයින් යෝජනා ක්‍රමය තුළ සක්‍රිය ලෙස රඳවා තබා ගැනීම සඳහා මාසික කෙටි පණිවිඩ සේවාවක් ඔස්සේ ඔවුන් දැනුවත් කිරීම හා තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රමය හා අනෙකුත් රක්ෂණ යෝජනා ක්‍රම වලට අදාලව පාරිභෝගිකයන් දැනුවත් කිරීම මෙම කෙටි පණිවිඩ සේවාව ඔස්සේ සිදු කරනු ලැබේ.

➢ මණ්ඩලීය ප්‍රධාන වෙබ් අඩවිය පවත්වාගෙන යාම.

තොරතුරු තාක්ෂණ අංශය ස්ථාපනය කිරීමත් සමඟ මණ්ඩලය සතුව පවතින ප්‍රධාන වෙබ් අඩවියෙහි තොරතුරු යාවත්කාලීන කිරීම, පවත්වාගෙන යාම මෙන්ම වෙබ් අඩවිය හා සම්බන්ධ සංවර්ධන ආයතනය සම්බන්ධීකරණය කිරීම ආදී ක්‍රියාවලීන් සිදු කරන ලදි.

➢ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාළ වෙබ් යෙදුම පවත්වාගෙන යාම.

විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාල වෙබ් යෙදුම වැඩිදියුණු කර තොරතුරු යාවත්කාලීන කිරීම, පවත්වාගෙන යාම සිදු කරනු ලබයි.

අංශ හා දිස්ත්‍රික් කාර්යාල අතර සම්බන්ධීකරණය සිදු කිරීම හා බාහිර ආයතන අතර සම්බන්ධීකරණය

➢ අංශ හා දිස්ත්‍රික් කාර්යාල අතර සම්බන්ධීකරණය

දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලය තුළ පවතින දෘඩාංග හා ජාලකරණ ආශ්‍රිත ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ අංශයේ නිලධාරීන් විසින් දුරස්ථ සන්නිවේදන ක්‍රම ඔස්සේ තාක්ෂණික සහය නිරන්තරයෙන් ලබා දෙන අතර, අවශ්‍ය අවස්ථාවල දී එම දිස්ත්‍රික් කාර්යාල වෙත ගොස් එහි ඇති වී ඇති ගැටළු සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීමට කටයුතු සිදු කරන ලදී.

➢ බාහිර ආයතන අතර සම්බන්ධීකරණය

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් හා එම අමාත්‍යාංශය යටතේ පවත්වනු ලබන ව්‍යාපෘතීන්ට (IDAT) අදාළ රැස්වීම් හා පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම, ඊට අදාළව ඉල්ලුම් කරන ලද තාක්ෂණික වාර්තාවන් සකස් කිරීම හා එම වාර්තාවන් ආයතන ප්‍රධානීන් මඟින් අදාළ ආයතන වෙත කඩිනමින් යොමු කිරීමට කටයුතු කරන ලදි.

ERP පද්ධතිය සංවර්ධනය කිරීම හා ඒ සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.



GIZ (Deutsche Gesellschaft für Internationale Zusammenarbeit) ආයතනයෙහි මූල්‍ය ආධාර යටතේ මණ්ඩලයෙහි අභ්‍යන්තර පරිපාලන හා මෙහෙයුම් ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම සඳහා ක්‍රියාත්මක වන ERP (Enterprise Resource Planning) පද්ධතියෙහි සංවර්ධන කටයුතු සිදු කිරීම හා ඒ සඳහා මණ්ඩලයෙහි නිලධාරීන් වෙත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
මෙම ERP පද්ධතිය තුළ එම එක් එක් අංගයන් සඳහා වෙන් වෙන් වශයෙන් මොඩියුලයන් පවතින අතර මෙහි මූලික අදියරයෙහි කටයුතු අවසන් කර 2024 වර්ෂය අවසාන වන විට උක්ත පද්ධතියෙහි තත්ත්වය පහත පරිදි වේ.

- ඒ යටතේ අභ්‍යන්තර පරිපාලන කටයුතු සිදු කිරීම සඳහා සංවර්ධනය කරන ලද HRM මොඩියුලයට අදාළව මණ්ඩලයෙහි සියළුම නිලධාරීන් වෙත පරිශීලක ගිණුම් නිර්මාණය කර HRM වෙබ් හා ජංගම යෙදුම සියළුම නිලධාරීන් වෙත හඳුන්වා දී ඇති අතර, ඒ සඳහා අවශ්‍ය පුහුණු සැසියන් ද පවත්වා ඇත.
- තවද, මීට සමගාමීව ERP පද්ධතියෙහි HRM මොඩියුලයට අදාළව දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරීන්ගේ පැමිණීමේ හා පිටවීමේ වේලාසටහන් දත්ත ලබා ගැනීමේ ක්‍රියාවලිය සඳහා දිස්ත්‍රික් කාර්යාලවල පවතින ඇඟිලි සලකුණු යන්ත්‍රයන් ප්‍රධාන ජාලයට සම්බන්ධ කිරීමේ කටයුතු කඩිනමින් ආරම්භ කළ අතර 2024 වර්ෂය අවසාන වන විට දිස්ත්‍රික් කාර්යාල 22ක මෙම ක්‍රියාවලිය සිදු කර අවසන් කරන ලදි.

- තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළ තෙවන පාර්ශවීය රක්ෂණ මොඩියුලයෙහි මූලික අදියරයන් අවසන් කර ඊට අදාලව සියළුම දිස්ත්‍රික් කාර්යාල සඳහා පරිශීලක ගිණුම් නිර්මාණය කර අවසන් කර ඇත. කොළඹ,කළුතර,ගාල්ල හා මාතර දිස්ත්‍රික් කාර්යාලයන් හා සම්බන්ධ වෙමින් පළමු නියමු පරීක්ෂාව සිදු කරන ලද අතර ගාල්ල හා කළුතර දිස්ත්‍රික් කාර්යාලයන් හා සම්බන්ධ වෙමින් දෙවන නියමු පරීක්ෂාවන් සිදු කරන ලදී. තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළව ලබා දෙනු ලබන හදිසි අනතුරු රක්ෂණ ආවරණය දැනට පවත්නා පද්ධතිය මඟින් නිකුත්

කිරීම සඳහා පද්ධතියෙහි සංවර්ධන කටයුතු අවසන් කරන ලදී. එමෙන්ම 2024 වර්ෂය අවසන් වන විට දිස්ත්‍රික් කාර්යාලයන් 27ක් තුළ මෙම මොඩියුලය පිළිබඳව ප්‍රායෝගික පුහුණු සැසියන් ඔස්සේ ඔවුන් දැනුවත් කර ඇති අතර, අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල වෙත පුහුණු සැසිය පැවැත්වීමට අවශ්‍ය සැලසුම් සකස් කර ඇත.

- වගා රක්ෂණ යෝජනා ක්‍රමයට අදාලව අවශ්‍යතාවයන් රැස් කිරීමේ (Requirement gathering) ක්‍රියාවලිය අවසන් කර එහි සංවර්ධන කටයුතු ද අවසන් කර ඇත. ඒ අනුව එහි පරීශීලක පිළිගැනීමේ පරීක්ෂණයන් (User acceptance testing) සිදු කරමින් පවතී.

- පශු රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළව අවශ්‍යතාවයන් රැස් කිරීමේ (Requirement gathering) ක්‍රියාවලිය අවසන් කර එහි සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී.

- ජීවිත රක්ෂණ යෝජනා ක්‍රමයට අදාලව පද්ධතියෙහි සංවර්ධන කටයුතු අවසන් කර ඇත.

- විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාලව අවශ්‍යතාවයන් රැස් කිරීමේ ක්‍රියාවලිය අවසන් කර එහි සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී.

- මූල්‍ය මොඩියුලට අදාළව අවශ්‍යතාවයන් රැස් කිරීමේ (Requirement gathering) ක්‍රියාවලිය අවසන් කර එහි සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී.

- විකුණුම් හා අලෙවිකරණ මොඩියුලයට අදාල ජංගම යෙදුමෙහි සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී.

- එමෙන්ම අනෙකුත් මොඩියුලයන් හා එම මොඩියුලයන්ට අදාළව පවතින උප මොඩියුලයන් අප මණ්ඩලයෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කරමින් පවතින අතර එම මොඩියුලයන්හි අතුරුමුහුණත් පරීශීලකයන් සඳහා භාවිතයට පහසු වන පරිදි සකස් කරමින් පවතී.

විශ්‍රාම වැටුප් අංශය

8 පරිච්ඡේදය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය

ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම්

කෘෂිකාර්මික කටයුතුවල නිරත වී රටේ ආර්ථිකය බල ගන්වන ගොවි ජනයාගේ කාර්යභාරය හඳුනාගනිමින් එම ක්‍රියාවලිය තුල ඔවුන්ගේ සදෑ සමය ශක්තිමත් කිරීමේ අරමුණින් 1987 දී ක්‍රියාත්මක කරන ලද ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයේ මූලික පරමාර්ථය මුදුන් පමුණුවාලමින් 2024 වසර අවසාන වන විට ගොවි විශ්‍රාම වැටුප්ලාභීන් 179,382 ක් වෙනුවෙන් රු. 4,737,963,758.00 ක මුදලක් ඔවුන්ගේ ජීවිත සුරක්ෂිතතාවය වෙනුවෙන් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවන ලදී.

2010 වර්ෂයේ ජූලි මස අගභාගය වන විට ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය බවට පත්වීම නිසා ඇති වූ මූල්‍ය අර්බුදයට ස්ථිරසාර විසඳුමක් ලබා දී යෝජනා ක්‍රමය අකර්මණ්‍ය නොවී පවත්වා ගෙන යාම සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ උපදෙස් මත යෝජනා ක්‍රමය ප්‍රතිසංවිධානය කර 2014 වර්ෂයේ ගොඩනගන ලද නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය 2022 වර්ෂයේ ඔක්තෝම්බර් මස ආරම්භ කරන ලදී. එම යෝජනා ක්‍රමයට 2024 වර්ෂයේ අවසානය වන විට දායකයින් 4903 ක් දායක වී ඇත.

මරණ ප්‍රතිලාභ ගෙවීම්

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වී විශ්‍රාම වැටුප් ලැබීමට පෙර හදිසි අනතුරුවලට ලක් වීමෙන් සහ අනපේක්ෂිත රෝගාබාධවලට ගොදුරු වී ජීවිතයෙන් සමුගත් ගොවි විශ්‍රාම වැටුප් දායකයින් 291 දෙනෙකුගේ උරුමකරුවන් සහ පවුල් වෙත ගෙවූ ප්‍රතිලාභ මුදල රු. 5,215,204.00 කි.

බෙලහීන ප්‍රතිලාභ ගෙවීම්

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායකත්වය ලබා සිට පූර්ණ බෙලහීනතාවයට පත්වූ දායකයින් 96 දෙනෙකු වෙනුවෙන් පූර්ණ බෙලහීනතාවයට පත්වූ දින සිට ජීවිතාන්තය දක්වා ගෙවන දීමනාව 2024 වර්ෂය සඳහා රු. 1,066,898.00 ක් ගෙවන ලදී

ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම
2024 ජනවාරි - දෙසැම්බර්

අනු අංකය	දිස්ත්‍රික්කය	ගොවි විශ්‍රාම ලබන දායකයින් සංඛ්‍යාව	එකතුව
1	කොළඹ	9,219	174,519,613
2	ගම්පහ	4,433	342,582,035
3	කළුතර	9,297	271,350,525
4	මහනුවර	11,067	488,952,302
5	මාතලේ	22157	141,492,214
6	නුවරඑළිය	5,931	91,635,381
7	ගාල්ල	12,540	453,885,088
8	මාතර	15,479	294,101,103
9	හම්බන්තොට	998	246,823,494
10	මඩකලපුව	3,587	33,101,458
11	අම්පාර	5,909	111,744,077
12	ත්‍රිකුණාමලය	6,063	25,546,387
13	පුත්තලම	8198	151,231,718
14	කුරුණෑගල	1,370	546,223,309
15	අනුරාධපුරය	113	216,210,382

16	පොළොන්නරුව	18,255	152,601,438
17	මොණරාගල	10,486	155,691,626
18	බදුල්ල	5,907	207,671,315
19	රත්නපුරය	141	226,424,994
20	කෑගල්ල	6,450	283,305,215
21	යාපනය	2,744	71,769,680
22	මන්නාරම	8,309	2,361,750
23	වව්නියාව	680	15,997,063
24	මුලතිව්	10,049	4,155,572
	එකතුව	**179,382**	**4,709,377,739**

- කිලිනොච්චි දිස්ත්‍රික්කයට අදාල විශ්‍රාම වැටුප් ගෙවීම් වවුනියා දිස්ත්‍රික්කය හරහා කරනු ලබයි.

ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

මරණ පාරිතෝෂික ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

2024 ජනවාරි - දෙසැම්බර්

අනු අංකය	දිස්ත්‍රික් කාර්යාලය	මරණ පාරිතෝෂික ගෙවූ දායකයින් සංඛ්‍යාව	ගෙවන ලද ප්‍රතිලාභ මුදල
1	අම්පාර	13	245,526.00
2	අනුරාධපුරය	24	458,157.00
3	බදුල්ල	13	300,662.00
4	මඩකලපුව	7	141,261.00
5	කොළඹ	1	33,034.00
6	ගාල්ල	21	307,577.00
7	ගම්පහ	29	502,371.00
8	හම්බන්තොට	15	183,944.00
9	යාපනය	10	231,101.00
10	කළුතර	11	209,692.00
11	මහනුවර	15	272,554.00
12	කෑගල්ල	12	255,402.00
13	කුරුණෑගල	41	722,215.00
14	මන්නාරම	0	-
15	මාතලේ	6	77,821.00
16	මාතර	11	145,378.00
17	මොණරාගල	18	406,782.00
18	මුලතිව්	0	-
19	නුවරඑළිය	8	152,629.00
20	පොළොන්නරුව	8	160,452.00
21	පුත්තලම	11	178,994.00
22	රත්නපුරය	14	170,114.00
23	ත්‍රිකුණාමලය	2	53,742.00
24	වව්නියාව	1	5,796.00
	එකතුව	**291**	**5,215,204.00**

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

ධීවර විශ්‍රාම වැටුප් හා මරණ ප්‍රතිලාභ ගෙවීම්

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වැඩපිළිවෙලක් ලෙස ක්‍රියාත්මක කරනු ලබන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ 2024.12.31 දින වනවිට ධීවරයින් 69,049 ක් දායකත්වය ලබා ඇත. 2024 වර්ෂයේ ධීවරයින් 6,056ක් මාසිකව විශ්‍රාම වැටුප් ලබන අතර රු. 91,710,306.00 ක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවා ඇත. එම වැඩපිළිවල යටතේ අදාළ වර්ෂයේදී මරණයට පත් දායකයින් 21 ක් වෙනුවෙන් රු. 207,000.00 ක මරණ පාරිතෝෂික ප්‍රතිලාභ වශයෙන් ගෙවන ලදී.

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

විශ්‍රාම වැටුප් ගෙවීම 2024 වර්ෂය

දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කොට්ඨාශය	විශ්‍රාම වැටුප් ගෙවීම දායක සංඛ්‍යාව	(ජන-දෙසැ) මුදල රු.
කළුතර	131	2,093,253.00
ගාල්ල	136	1,952,272.00
මහවැව	487	7,319,235.00
මාතර	359	5,446,008.00
කොළඹ	71	1,116,688.00
තංගල්ල	309	4,700,927.00
පුත්තලම	74	1,223,812.00
මීගමුව	687	10,513,108.00
මඩකලපුව	612	9,439,357.00
ත්‍රිකුණාමලය	145	2,284,811.00
මන්නාරම	625	9,722,927.00
කල්මුනේ	407	6,151,877.00
මුලතිව්	96	1,482,428.00
කිලිනොච්චි	483	7,681,757.00
යාපනය	1352	19,233,285.00
මිරිදිය ධීවර ජලාශ		
නුවරඑළිය	7	98,004.00
පොළොන්නරුව	4	64,392.00
රත්නපුර	4	61,489.00
මොණරාගල	1	15,804.00
කුරුණෑගල	3	41,400.00
අනුරාධපුර	3	43,248.00
මාතලේ	6	87,703.00
නුවර	10	147,000.00
කෑගල්ල	-	-
බදුල්ල	7	98,604.00
වව්නියා	2	29,208.00
මඩකලපුව මිරිදිය	35	661,709.00
එකතුව	**6,056**	**91,710,306.00**

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

2024.12.31දිනට බඳවා ගැනීම්

දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කොට්ඨාශය	වයස අනුව දායක සංඛ්‍යාව						2024 මුළු දායක සංඛ්‍යාව
	18-29	30-35	36-45	46-50	51-54	55-59	
කළුතර	1,213	721	772	197	105	59	3,067
ගාල්ල	1,082	676	840	221	118	95	3,032
මහවැව	3,253	1,702	2,036	613	256	240	8,100
මාතර	1,750	980	1,232	346	201	164	4,673
කොළඹ	576	360	478	140	63	38	1,655
තංගල්ල	2,514	1,,389	1,629	412	201	169	6,314
පුත්තලම	2,167	1,156	1,222	255	107	61	4,968
මීගමුව	2,538	1,599	2,167	735	419	378	7,836
මඩකලපුව	2,248	1,390	1,630	555	272	266	6,361
ත්‍රිකුණාමලය	654	516	550	129	81	78	2,008
මන්නාරම	2,066	1,227	1,343	429	222	257	5,544
කල්මුනේ	1,565	1,109	1,515	479	244	207	5,119
මුලතිව්	88	79	141	50	27	44	429
කිලිනොච්චි	519	340	540	250	185	183	2,017
යාපනය	2,185	1,117	1,444	668	402	617	6,433
මිරිදිය ධීවර ජලාශ							
නුවරඑළිය	29	28	47	7	1	3	115
පොළොන්නරුව	45	35	27	11	2	1	121
රත්නපුර	27	15	9	1	3	-	55
මොණරාගල	17	14	10	1	-	-	42
කුරුණෑගල	45	24	24	1	-	2	96
අනුරාධපුර	169	81	84	17	7	5	363
මාතලේ	31	14	23	5	2	3	78
නුවර	13	12	25	5	3	3	61
කෑගල්ල	1	1	2	-	-	-	4
බදුල්ල	59	33	33	3	-	3	131
වව්නියා	59	33	41	15	4	-	152
මඩකලපුව මිරිදිය	84	52	67	27	20	25	275
මුළු එකතුව	**24,997**	**14,703**	**17,931**	**5,572**	**2,945**	**2,901**	**69,049**

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
මරණ හා බෙලහීන පාරිතෝෂික ගෙවීම් -2024 වර්ෂය

දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති කොට්ඨාශය	මරණ හා බෙලහීන පාරිතෝෂික ගෙවීම්	
	දායක සංඛ්‍යාව	මුදල රු.
කළුතර	2	18,000.00
ගාල්ල		
මහවැව	1	8,000.00
මාතර	1	10,000.00
කොළඹ		
තංගල්ල		
පුත්තලම		
මීගමුව	7	64,000.00
මඩකලපුව	1	10,000.00
ත්‍රිකුණාමලය		
මන්නාරම	4	48,000.00
කල්මුනේ		
මුලතිව්		
කිලිනොච්චි	2	18,000.00
යාපනය	3	31,000.00
මිරිදිය ධීවර ජලාශ		
නුවරඑළිය	-	-
පොළොන්නරුව	-	-
රත්නපුර	-	-
මොණරාගල	-	-
කුරුණෑගල	-	-
අනුරාධපුර	-	-
මාතලේ	-	-
නුවර	-	-
කෑගල්ල	-	-
බදුල්ල	-	-
වව්නියා	-	-
මඩකලපුව මිරිදිය	-	-
එකතුව	**21**	**207,000.00**

මූදල් අංශය

9 පරිච්ඡේදය

මූල්‍ය සම්පිණ්ඩනය

2024 වර්ෂය තුල මණ්ඩලයේ කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය රුපියල් මිලියන 1,274.3 ක ශුද්ධ ලාභයක් උපයාගත් අතර, මෙම වර්ෂය තුලදී උපයාගත් මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 1,799.7 කි.

2018 අය වැය යෝජනා අනුව අනිවාර්ය රක්ෂණ යෝජනා ක්‍රමය, එම භෝග වර්ග හය සඳහා මෙම වර්ෂයේදීද ක්‍රියාත්මක කරන ලද අතර, ඒ තුලින් වී, බඩඉරිඟු, ලොකු එෑණු, අර්තාපල්, සෝයා, මිරිස් යන භෝග සඳහා අක්කරයකට රු. 40,000/- ක උපරිමයකට යටත්ව ආවරණය සැළසීමට කටයුතු කර ඇත.

අඛණ්ඩව පැවති කාලගුණික හා දේශගුණික විපර්යාසයන්ගෙන් සිදුවූ බලපෑම සළකා බලා වර්ෂය තුල ගොවීන්ගෙන් අයකරනු ලබන වාර මුදල ඔවුන්ගෙන් අය නොකර රජය විසින් ලබාදීමට තීරණය කල අතර, එම මුදල රුපියල් මිලියන 1,000 කි.

මීට අමතරව 2024 වර්ෂය තුළදීද අතිරේක රක්ෂණ වාර මුදලක් අය කිරීම තුලින් වගාවන්ට සිදුවන සියළු අවදානම් ආවරණය වන පරිදි අවම වාරික මුදල රු. 6,400/- කට යටත්ව, රු. 100,000/- ක් දක්වා අක්කරයකට ලබාදෙන වන්දි මුදල ගෙවීමට කටයුතු කර ඇත.


2024 වර්ෂය තුල මණ්ඩලයේ අනිවාර්ය වගා රක්ෂණ වන්දි වගකීම රුපියල් මිලියන 2,557.2 ක් පමණ වී ඇත.

2024 වර්ෂය තුලදී, ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය මගින් ගොවීන් 179,382 ක් සඳහා රුපියල් මිලියන 4,737.9 ක ශුද්ධ මුදලක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවා ඇති අතර, ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය තුල ධීවරයින් 6,056 කට රුපියල් මිලියන 91.7 ක මුදලක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවන ලදී.

පෙර වසර දහයක මූල්‍ය තොරතුරු


ලාභදායීත්වය

- කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය




	1 2015	2 2016	3 2017	4 2018	5 2019	6 2020	7 2021	8 2022	9 2023	10 2024
මෙහෙයුම් ලාභය (රු.මි.)	39.9	377.7	80.9	1,144.7	878	1,401.3	1,752.0	2,663.0	1,268.2	1,799.7
ශුද්ධ ලාභය (රු.මි.)	8.7	339.9	42.3	921.0	652.3	1,153.7	1,494.4	2,208.0	877.0	1,274.3

- <u>ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය</u>



	1 2015	2 2016	3 2017	4 2018	5 2019	6 2020	7 2021	8 2022	9 2023	10 2024
ආදායම (රු.මි.)	166.1	221.6	208.4	211.9	223.4	209.8	224	164.4	225.9	196.8
මෙහෙයුම් වියදම (රු.මි.)	2,653	2,432.2	2,679.4	3,271.2	3,144.6	4,555	3,766	3,967.9	4,539.6	4,895.4

- ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය



	1	2	3	4	5	6	7	8	9	10
	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
ආදායම (රු.මි.)	35.5	60.4	56.1	69.6	53.03	29.6	35.2	102.5	134.1	125.1
මෙහෙයුම් වියදම (රු.මි.)	50.6	57.9	63.7	66	67.2	115.4	78.7	81.7	87.2	91.6

මූලාය ප්‍රකාශන

10 පරිච්ඡේදය

සමස්ථ යෝජනා ක්‍රම සඳහා ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන සහ කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය

2024

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (සමූහය)		කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය	
		31.12.2024	31.12.2023	31.12.2024	31.12.2023
	සටහන්	රු.	රු. .	රු.	රු.
ජංගම නොවන වත්කම්					
දේපළ, පිරියත හා උපකරණ	1	295,956,724	234,540,729	283,845,231	226,825,080
අස්පෘශ්‍ය වත්කම්-WIP ERP පද්ධතිය		72,002,970	72,002,970	72,002,970	72,002,970
		367,959,694	306,543,699	355,848,201	298,828,050
මූල්‍ය සාධන පත්‍ර					
භාණ්ඩාගාර බැඳුම්කර		5,657,249,551	3,352,820,995	3,319,257,408	1,851,357,619
		5,657,249,551	3,352,820,995	3,319,257,408	1,851,357,619
ජංගම වත්කම්					
තොග	2.1	35,195,530	38,538,139	26,899,915	33,271,478
ලැබිය යුතු දෑ	2.2	149,863,972	463,394,978	993,153,254	1,266,364,206
ලැබිය යුතු වාරික	2.3	1,826,970	1,288,180	810,790	371,734
තැන්පතු හා පූර්ව ගෙවීම්	2.4	23,882,944	30,537,026	23,882,944	30,537,026
අත්තිකාරම්	2.5	29,781,785	669,348	29,781,785	669,348
කල්පිරීම් දක්වා රඳවා ගත් මූල්‍ය සාධන	2.6	4,795,234,411	5,557,963,798	3,467,937,002	4,250,427,003
මුදල් හා මුදල් සමාන දෑ	2.7	56,711,051	38,520,272	37,965,764	32,364,702
මුළු ජංගම වත්කම්		5,092,496,662	6,130,911,740	4,580,431,453	5,614,005,497
⊔		**11,117,705,908**	**9,790,276,434**	**8,255,537,063**	**7,764,191,166**
ස්කන්ධ හා බැරකම්					
ප්‍රාග්ධන හා සංචිත					
භාණ්ඩාගාරය විසින් දායක කළ මූලික		50,000,000	50,000,000	50,000,000	50,000,000
කෘ.ගො.ර.ම සමුච්චිත අරමුදල	3	(93,318,413,051)	(90,041,219,155)	4,479,043,840	3,237,653,337
රජයේ ප්‍රාග්ධන ප්‍රදානය	4	10,654,285	17,330,189	10,654,285	17,330,189
කෘ.ගො.ර.ම. සංචිත අරමුදල	5	588,524,391	498,536,253	588,524,391	498,536,253
ගොවි මරණ පාරිතෝෂික අරමුදල	6	1,527,083,863	1,427,193,842	1,490,350,049	1,391,994,627
කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණ අරමුදල		36,274,241	27,313,478	36,274,241	27,313,478
කෙතට අරුණ අනිවාර්ය රක්ෂණ අරමුදල		706,503,600	706,503,600	706,503,600	706,503,600
ප්‍රත්‍යාගණන සංචිත		214,006,925	172,530,347	206,206,925	165,680,347
නිෂ්පාදන ප්‍රවර්ධන හා දිරි දීමනා අරමුදල		38,361,464	30,686,023	38,361,464	30,686,023
ගොවි විශ්‍රාම වැටුප සඳහා රජයේ ප්‍රදානය		1,081,488,000	1,081,488,000	-	-
ප්‍රාග්ධන ප්‍රදානය-GIZ		88,404,556	65,792,100	88,404,556	65,792,100
		(88,977,111,726)	(85,963,845,323)	7,694,323,350	6,191,489,954
ජංගම නොවන බැරකම්					
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය		90,459,417	55,462,953	39,032,761	22,103,553
විශ්‍රාම වැටුප් බැරකම		97,122,025,950	92,430,794,402	-	-
		97,212,485,368	92,486,257,355	39,032,761	22,103,553
ජංගම බැරකම්					
මුද්‍රණ කටයුතු සඳහා ප්‍රතිපාදනය		1,845,812	1,922,699	700,000	600,000
පූර්ව වාරික ලැබීම්	7.1	116,164,521	115,686,318	116,164,521	115,686,318
අනෙකුත් ගෙවිය යුතු දෑ	7.2	2,528,330,730	2,137,472,315	175,229,578	425,556,787
උපචිත වියදම්	7.3	38,374,728	39,414,416	32,470,377	35,385,901
හානිපූරණය සඳහා ප්‍රතිපාදනය	7.4	197,616,476	973,368,653	197,616,476	973,368,653
මුළු ජංගම බැරකම්		2,882,332,266	3,267,864,401	522,180,952	1,550,597,659
මුළු ස්කන්ධ හා බැරකම්		**11,117,705,908**	**9,790,276,434**	**8,255,537,063**	**7,764,191,166**

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතා සමග අනුකූල වේ .

....
මූල්‍ය ප්‍රධානී අධ්‍යක්ෂ මණ්ඩල

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ .
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලද්දේ :

....
අධ්‍යක්ෂ මණ්ඩල සමාජික අධ්‍යක්ෂ මණ්ඩල සමාජික
ෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය
විස්තීරණ ආදායම් ප්‍රකාශය

		කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (සමූහය)		කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය	
		31.12.2024	31.12.2023	31.12.2024	31.12.2023
ආදායම	සටහන්	රු.	රු.	රු.	රු.
වාරික හා දායක මුදල්	8.1	623,351,504	502,154,945	623,284,487	502,033,477
රක්ෂණ වාරිකය- භාණ්ඩාගාර දායක මුදල		1,000,000,000	1,000,000,000	1,000,000,000	1,000,000,000
හානිපූරණ සඳහා ප්‍රදාන - ජා.ර.හා.අ. - බෝග බද්ද		1,282,703,785	975,718,383	1,282,703,785	975,718,383
පොළිය	8.2	1,107,874,664	1,370,543,232	785,952,802	1,010,497,440
මුළු ආදායම		**4,013,929,953**	**3,848,416,560**	**3,691,941,074**	**3,488,249,300**
මෙහෙයුම් වියදම්					
හානිපූරණය	9.1	(1,780,680,767)	(2,138,394,861)	(1,780,680,767)	(2,138,394,861)
මෙහෙයුම් වියදම්	9.2	(129,694,540)	(98,281,615)	(111,497,555)	(81,623,872)
විශ්‍රාම වැටුප් ගෙවීම්		(4,933,473,726)	(4,572,552,593)	-	-
ශුද්ධ දායක මුදල් හා පොළී ආපසු ගෙවීම		(17,769,003)	(19,370,863)	-	-
සමූහ රක්ෂණ වාරිකය		(17,721,420)	(18,322,800)	-	-
ආබාධිතතා පාරිතෝෂික ගෙවීම්		(1,046,127)	(1,081,350)	-	-
විශ්‍රාම වැටුප් බැරකම වැඩිවීම		(4,691,231,548)	(4,927,590,388)	-	-
		(11,571,617,132)	**(11,775,594,470)**	**(1,892,178,323)**	**(2,220,018,733)**
මෙහෙයුම් අතිරික්තය/(හිඟය)		**(7,557,687,179)**	**(7,927,177,910)**	**1,799,762,752**	**1,268,230,567**
විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා රජයේ ප්‍රදානය		4,762,000,000	4,395,000,000	-	-
පරිපාලන වියදම් සඳහා රජයේ ප්‍රදානය		249,630,000	206,225,000	-	-
වෙනත් ආදායම්	10	22,214,226	18,223,887	17,207,153	14,348,633
		5,033,844,226	**4,619,448,887**	**17,207,153**	**14,348,633**
		(2,523,842,953)	**(3,307,729,023)**	**1,816,969,905**	**1,282,579,200**
වියදම්					
පරිපාලන වියදම්	11	(611,377,838)	(513,935,624)	(353,558,609)	(299,864,500)
මූල්‍ය සහ වෙනත් වියදම්	12	(46,964,427)	(62,884,014)	(346,723)	(214,664)
මුළු වියදම්		**(658,342,265)**	**(576,819,639)**	**(353,905,331)**	**(300,079,164)**
ශුද්ධ අතිරික්තය /(හිඟය)		**(3,182,185,218)**	**(3,884,548,662)**	**1,463,064,574**	**982,500,036**
ආදායම් බදු වියදම		(124,226,159)	(150,084,498)	(124,226,159)	(150,084,498)
බදුවලින් පසු ලාභය		**(3,306,411,377)**	**(4,034,633,160)**	**1,338,838,415**	**832,415,538**
කෘගොරම සංචිත අරමුදල සඳහා ප්‍රතිපාදන		(89,988,138)	(63,411,528)	(89,988,138)	(63,411,528)
ප්‍රතිපාදනවලින් පසු ශුද්ධ අතිරික්තය (හිඟය)		**(3,396,399,515)**	**(4,098,044,688)**	**1,248,850,277**	**769,004,009**
වෙනත් විස්තීරණ ආදායම					
පාරිතෝෂික ලාභ/(අලාභ)		(31,961,267)	(3,372,120)	(15,059,774)	725,417
		(31,961,267)	(3,372,120)	(15,059,774)	725,417
දේපළ, පිරියත හා උපකරණවල ප්‍රත්‍යාගණන අතිරික්තය		41,476,578	111,551,180	40,526,578	107,551,180
වෙනත් විස්තීරණ ආදායමෙන් පසු ශුද්ධ අතිරික්තය/(හිඟය)		**(3,386,884,204)**	**(3,989,865,628)**	**1,274,317,081**	**877,280,606**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

සමුහය

විස්තරය	ප්‍රාග්ධනය සඳහා රජයේ ප්‍රදානය රු.	සමුච්චිත අතිරික්තය / හිඟය රු.	ප්‍රාග්ධනය සඳහා රජයේ ප්‍රදානය රු.	AAIB සංචිත අරමුදල රු.	ගොවි මරණ පාරිතෝෂික අරමුදල රු.	කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණ අරමුදල රු.	කෙතට අරුණ අනිවාර්ය රක්ෂණ අරමුදල	නැවත තක්සේරු කිරීමේ සංචිතය රු.	නිෂ්පාදන ප්‍රවර්ධන සහ දිරි දීමනා අරමුදල රු.	භාණ්ඩාගාර බැඳුම්කර සඳහා රජයේ ප්‍රදානය රු.	ප්‍රාග්ධන ප්‍රදාන-GIZ රු.	එකතුව රු.
2023 ජනවාරි 01 දිනට ශේෂය	**50,000,000**	**(84,791,312,860)**	**12,128,064**	**435,124,725**	**1,292,310,847**	**18,812,989**	**706,503,600**	**60,979,167**	**31,660,458**	**1,081,488,000**	**65,792,100**	**(81,036,512,911)**
පෙර වසර ගැලපීම		(1,282,300,096)										(1,282,300,096)
වර්ෂය තුළ එකතු කිරීම:	-	133,810,610	17,800,000	63,411,528	18,322,800	5,503,200	-	-	7,740,142	-	-	246,588,280
පොළී ආදායම	-				118,209,835	5,402,615	-	-	-	-	-	123,612,450
ක්‍රමක්ෂය- රජයේ ප්‍රදානය	-	-	(12,597,874)	-	-	-	-	-	-	-	-	(12,597,874)
භාණ්ඩාගාර බැඳුම්කර	-				(1,649,640)	(2,405,326)	-	-	(8,714,577)	-	-	(12,769,543)
ශුද්ධ අතිරික්තය /(හිඟය)	-	(4,101,416,809)	-	-	-			111,551,180	-	-	-	(3,989,865,628)
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**50,000,000**	**(90,041,219,155)**	**17,330,189**	**498,536,253**	**1,427,193,842**	**27,313,478**	**706,503,600**	**172,530,347**	**30,686,023**	**1,081,488,000**	**65,792,100**	**(85,963,845,323)**
වර්ෂය තුළ එකතු කිරීම:	-	143,566,886	9,150,000	89,988,138	17,721,420	5,221,150	-	-	18,056,415	-	22,612,456	306,316,465
පෙර වසර ගැලපීම		7,600,000	-	-	-	-	-	-	-	-	-	7,600,000
පොළී ආදායම	-	-	-	-	84,137,602	5,876,906	-	-	-	-	-	90,014,507
ක්‍රමක්ෂය- ගොවි විශ්‍රාම වැටුප් රජයේ ප්‍රදානය	-	-	(15,825,905)	-	-	-	-	-	-	-	-	(15,825,905)
ප්‍රතිලාභ ගෙවීම	-	-	-	-	(1,969,000)	(2,137,293)	-		(10,380,974)	-	-	(14,487,267)
ශුද්ධ අතිරික්තය /(හිඟය)	-	(3,428,360,782)	-	-	-	-	-	41,476,578		-	-	(3,386,884,204)
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	**50,000,000**	**(93,318,413,051)**	**10,654,285**	**588,524,391**	**1,527,083,864**	**36,274,240**	**706,503,600**	**214,006,925**	**38,361,464**	**1,081,488,000**	**88,404,556**	**(88,977,111,727)**

ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය

Description	Initial Capital Contributed by the Treasury Rs.	Accumulated Surplus/ (Deficit) Rs.	Govt. Grant for Capital Rs.	AAIB Reserve Fund Rs.	Farmer's Death Gratuity Fund Rs.	Staff Medical Insurance Fund Rs.	Kethata Aruna Compulsory Insurance Fund	Revaluation Reserve Rs.	Product Promotion and Incentive Fund Rs.	Government Grant on Treasury Bond Rs.	Capital Grant-GIZ Rs.	Total Rs.
2022 ජනවාරි 01 දිනට ශේෂය	**50,000,000**	**6,796,467,767**	**12,128,064**	**435,124,725**	**1,258,775,352**	**18,812,989**	**706,503,600**	**58,129,167**	**31,660,458**	**-**	**65,792,100**	**9,433,394,222**
වර්ෂය තුළ එකතු කිරීම:	-		17,800,000	63,411,528	16,576,080	5,279,700	-	107,551,180	7,740,142	-	-	218,358,630
පොළී ආදායම	-				118,209,835	5,402,615	-	-	-	-	-	123,612,450
ක්‍රමක්ෂය - රජයේ ප්‍රදානය	-	-	(12,597,874)	-	-	-	-	-	-	-	-	(12,597,874)
පෙර වසර ගැලපීම	-	(4,328,543,856)	-	-	-	-	-	-	-	-	-	(4,328,543,856)
ප්‍රතිලාභ ගෙවීම	-	-	-	-	(1,566,640)	(2,181,826)	-	-	(8,714,577)	-	-	(12,463,043)
ශුද්ධ අතිරික්තය /(හිඟය)	-	769,729,426	-	-	-			-	-	-	-	769,729,426
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**50,000,000**	**3,237,653,337**	**17,330,189**	**498,536,253**	**1,391,994,627**	**27,313,478**	**706,503,600**	**165,680,347**	**30,686,023**	**-**	**65,792,100**	**6,191,489,954**
වර්ෂය තුළ එකතු කිරීම:	-	-	9,150,000	89,988,138	15,977,820	5,221,150	-	40,526,578	18,056,415	-	22,612,456	201,532,557
පෙර වසර ගැලපීම	-	7,600,000	-	-	-	-	-	-	-	-	-	7,600,000
පොළී ආදායම	-	-	-	-	84,137,602	5,876,906	-	-	-	-	-	90,014,507
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය ගොවි විශ්‍රාම වැටුප	-	-	(15,825,905)	-	-	-	-	-	-	-	-	(15,825,905)
ප්‍රතිලාභ ගෙවීම	-	-	-	-	(1,760,000)	(2,137,293)	-	-	(10,380,974)	-	-	(14,278,267)
ශුද්ධ අතිරික්තය /(හිඟය)	-	1,233,790,503	-	-	-	-	-	-	-	-	-	1,233,790,503
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	**50,000,000**	**4,479,043,840**	**10,654,285**	**588,524,391**	**1,490,350,049**	**36,274,240**	**706,503,600**	**206,206,925**	**38,361,464**	**-**	**88,404,556**	**7,694,323,350**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (සමූහය)		කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය	
	31.12.2024	31.12.2023	31.12.2024	31.12.2023
	රු.	රු.	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ				
පහත දැ සඳහා ගැලපුම්				
ක්ෂයවීම්	43,690,621	27,335,936	41,644,775	25,683,272
ක්‍රමක්ෂය- රජයේ ප්‍රදානය	(15,825,905)	(13,662,896)	(15,825,905)	(12,597,874)
විශ්‍රාම වැටුප් බැරකම	4,691,231,548	4,927,590,388	-	-
හානිපූරණය සඳහා වෙන් කිරීම	151,252,512	882,188,483	151,252,512	882,188,483
මණ්ඩලය විසින් ගෙවන ලද පරිපාලන වියදම්	-	-	(241,024,034)	(196,569,848)
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය	-	-	249,630,000	206,225,000
ආදායම් බදු සඳහා වෙන් කිරීම.				
කාර්ය මණ්ඩල දිරි දීමනා සහ ප්‍රවර්ධන අරමුදල	18,056,415	7,740,142	18,056,415	7,740,142
මරණ පාරිතෝෂික වාරිකය	17,721,420	18,322,800	-	-
පොලී වියදම්	46,482,878	62,601,947		
	4,952,609,491	**5,912,116,799**	**203,733,764**	**912,669,175**
දේපල, පිරියත, උපකරණ බැහැර කිරීම මත ලාභය / අලා	(49,715)	(256,473)	(49,715)	(205,913)
විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	10,187,207	8,700,946	5,324,589	4,059,133
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් අතිරික්	**1,780,561,765**	**2,036,012,610**	**1,672,073,211**	**1,899,022,430**
ලැබිය යුතු දැ (වැඩිවීම්)/අඩුවීම	313,546,506	(285,944,219)	337,624,005	(217,282,039)
ලැබිය යුතු වාරික (වැඩිවීම්)/අඩුවීම	(538,790)	3,906,687	(439,056)	2,912,413
තැන්පතු සහ පූර්ව ගෙවීම් (වැඩිවීම්)/අඩුවීම	6,654,082	(24,461,887)	6,654,082	(24,461,887)
හානි පූරණය සඳහා ප්‍රතිපාදන වැඩිවීම /(අඩුවීම)	(919,404,690)	(206,086,932)	(919,404,690)	(206,086,932)
මුද්‍රණ කටයුතු සඳහා ප්‍රතිපාදන වැඩිවීම /(අඩුවීම)	(76,888)	180,500	100,000	100,000
පූර්ව වාරික අත්තිකාරම් වැඩිවීම /(අඩුවීම)	478,203	69,743,604	478,203	69,743,604
අනෙකුත් ගෙවිය යුතු දැ වැඩිවීම /(අඩුවීම)	612,168,072	490,453,917	(37,623,517)	(1,967,559)
උපචිත වියදම් වැඩිවීම /(අඩුවීම)	(1,039,688)	22,629,995	(2,915,524)	21,126,615
	(13,983,020)	**67,362,185**	**(638,267,370)**	**(357,469,676)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත මුදල්	**1,766,578,745**	**2,103,374,795**	**1,033,805,841**	**1,541,552,754**
ආදායම් බදු ගෙවීම්	(347,270,504)	-	(347,270,504)	
විශ්‍රාමික පාරිතෝෂිකය - ගෙවන ලද	(7,152,010)	(17,734,755)	(7,152,010)	(17,734,755)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	**1,412,156,230**	**2,085,640,040**	**679,383,327**	**1,523,817,999**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ				
කාර්ය මණ්ඩල දිරි දීමනා සහ ප්‍රවර්ධන අරමුදල	(10,380,974)	(8,714,577)	(10,380,974)	(8,714,577)
වසර තුළ ආයෝජන	(1,541,699,169)	(2,178,567,081)	(685,409,788)	(1,486,668,033)
දේපල, පිරියත සහ උපකරණ මිලයට ගැනීම	(52,761,756)	(145,298,124)	(47,270,065)	(145,298,124)
දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් උත්පාදන	50,620	355,410	50,620	302,260
ආයෝජන ක්‍රියාකාරකම් වලින්ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	**(1,560,144,792)**	**(2,269,848,635)**	**(696,394,720)**	**(1,576,270,097)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින්ජනිත වූ මුදල් ප්‍රවාහ				
ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රදානය	22,612,456	-	22,612,456	-
නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම අරමුදල	54,818,394	20,730,787	-	-
පැරණි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	88,748,492	113,079,824	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	**166,179,342**	**133,810,610**	**22,612,456**	**-**
මුදල් හා මුදලට සමාන දෑ ශුද්ධ වැඩිවීම් / (අඩුවීම්)	**18,190,780**	**(50,397,985)**	**5,601,062**	**(52,452,098)**
වසර ආරම්භයේදී මුදල් සහ මුදලට සමාන දෑ	**38,520,272**	**88,918,257**	**32,364,702**	**84,816,800**
වසර අවසානයේදී මුදල් සහ මුදලට සමාන දෑ	**56,711,052**	**38,520,272**	**37,965,764**	**32,364,702**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති
2024 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

1. පොදු ප්‍රතිපත්ති

1.1 වාර්තාකරණ අස්තිත්වය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (මෙහි මින් මතු "මණ්ඩලය" ලෙස සඳහන් කරනු ලබන) 1999 අංක 20 දරන පනතෙන් සංස්ථාගත කරන ලදී. මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලය නුගේගොඩ, ගංගොඩවිල, සුභද්‍රාරාම පාරේ අංක 117 දරණ ස්ථානයේ පිහිටා ඇති අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ද එම ලිපිනයේම පිහිටා ඇත. තවද, අදාළ නීතිය මගින් ස්ථාපිත කර ඇති කෘෂිකාර්මික රක්ෂණ මණ්ඩලය වෙත පවරා ඇති හෝ පනවා ඇති මෙන්ම 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ පනත සහ 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ පනත මගින් ලබා දී ඇති සියලු බලතල හා කාර්ය, නියම කරනු ලැබූ දිනයේ සිට මණ්ඩලය වෙත පවරා ඇති හෝ පනවා ඇති බලතල හා කාර්ය ලෙස සැලකිය යුත්තේය.

1.2 මව් අස්තිත්වය සහ අවසාන මව් අස්තිත්වය

මණ්ඩලයේ මව් අස්තිත්වය සහ අවසාන මව් අස්තිත්වය වන්නේ ශ්‍රී ලංකා රජයයි.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

කෘෂිකාර්මික සහ උද්‍යාන භෝග, ඖෂධීය ශාක, පශු සම්පත්, ධීවර සහ වන විද්‍යාව, කෘෂිකාර්මික උපකරණ සහ මෙවලම් ඇතුළුව කෘෂිකාර්මික රක්ෂණයේ සහ කෘෂිකාර්මික උද්‍යාන විද්‍යාත්මක නිපැයුම් සහ ඖෂධීය ශාක නිෂ්පාදන, ධීවර සහ වනාන්තර නිෂ්පාදන ගබඩා කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ මණ්ඩලය මූලිකවම නියැලී සිටියි. එසේම, කෘෂිකාර්මිකයන් සඳහා වෛද්‍ය ප්‍රතිලාභ සැපයීම, සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ පොහොර රක්ෂණ කටයුතුවල සහ කෘෂිකාර්මිකයන්ට හිමි රථ වාහන සඳහා තෙවන පාර්ශවීය රක්ෂණ ආවරණ සැපයීමේ මණ්ඩලය නිරතව සිටියි. සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයෙහිසැලකිය යුතු වෙනස්කම් සිදු නොවුණි.

1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

1.5 සේවක සංඛ්‍යාව

2024 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සේවක සංඛ්‍යාව 372 කි.

1.6 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2024 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන 2025 පෙබරවාරි 27 දින අනුමත කොට නිකුත් කිරීමට බලය පවරන ලදී.

2 පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශනය

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර/ ශ්‍රී.ල.ගි.ප්‍ර.) ප්‍රකාරව පිළියෙල කර ඇත.

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් සංරචක වලින් සමන්විත වේ.

- මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයකින් 2024 දෙසැම්බර් 31 දිනට ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පිළිබඳ තොරතුරු සපයයි. [පිටුව 01]
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයකින් සමාලෝචිත වර්ෂය සඳහා ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සපයයි. [පිටුව 02]
- ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනයකින් ස්කන්ධවල සියලු වෙනස්වීම් නිරූපණය කරයි. [පිටුව 03]
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය, මුදල් සහ මුදලට සමාන දෑ ජනනය කිරීමට මණ්ඩලයට ඇති හැකියාව සහ එම මුදල් ප්‍රවාහ භාවිතය පිළිබඳව පරිශීලකයින්ට තොරතුරු සපයයි [පිටුව 04]
- ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවලින් සමන්විත මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් [පිටු 05 -29]

2.2 මැනීමේ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණය කිරීම් කරනු ලබන විටදී හැරුණු විට මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් පිළියෙල කර ඇත.

2.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මණ්ඩලය එහි සාපේක්ෂ ද්‍රවශීලතාව පිළිබිඹු කිරීම පිණිස පුළුල්ව එහි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කරයි. මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමනාත්මක සාධක සඳහා ගැලපීම් සිදුකර නොමැත.

2.4 කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

මණ්ඩලයේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලැබ ඇති සියලු මූල්‍ය තොරතුරු, අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස, ආසන්නතම රුපියලට වටයනය කර ඇත.

2.5 ප්‍රමාණවත්බව හා සමාහරණය

එක හා සමාන අයිතමවල එක් එක් ප්‍රමාණාත්මක පංති වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත. ස්වභාවය හෝ කාර්යයන් අනුව අයිතමයන් අසමාන වන්නේ නම් හැර ඒවා ද වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

2.6 වාර්තාකරණ කාලසීමාව

වාර්තාකරණ කාලසීමාව වන්නේ 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වාය. අදාළ වන විටදී, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඉන් අනතුරුව දක්වා ඇති සටහන් මගින් පැහැදිළි කර ඇත.

2.7 වැදගත් ගිණුම්කරණ තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර /.ශ්‍රී.ල.ගි.ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තාකරනු ලැබූ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණ භාවිතය කෙරෙහි බලපාන්නා වූ තීන්දු, තක්සේරු සහ උපකල්පන සිදුකිරීමට කළමනාකාරීත්වයට නියම කරයි. යොදා ගනු ලැබූ මෙම ඇස්තමේන්තු සහ තීන්දු සැබෑ ප්‍රතිඵලවලට වඩා වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ පාදක උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා ප්‍රතිශෝධන, ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කරඇති කාලසීමාව තුළ සහ ඒවා බලපානු ලබන යම් අනාගත කාලසීමාවන් තුළ පිළිගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවල පිළිගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම සැලකිය යුතු බලපෑම් ඇති කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී තක්සේරු, අවිනිශ්චිතතා සහ තීරණාත්මක තීන්දු සම්බන්ධයෙන් සැලකිය යුතු ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල අඩංගු කර ඇත.

2.7.1 අඛණ්ඩ පැවැත්ම

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවැතීමට මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳව කළමනාකාරීත්වය තක්සේරුවක් කර ඇති අතර පූර්වේක්ෂිත අනාගතය සඳහා ව්‍යාපාරික කටයුතුව අඛණ්ඩව පවත්වා ගෙන යාමට සම්පත් මණ්ඩලය සතු බවට සෑහීමකට පත් වේ. එබැවින්, ප්‍රවර්තන ව්‍යාපාරයක පදනමින් මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව පිළියෙල කරනු ලැබේ.

2.7.2 සංසන්දනාත්මක තොරතුරු

අන්තර් කාල සීමා සංසන්දනීයභාවය වැඩි දියුණු කිරීම පිණිස ප්‍රවර්ථන කාල සීමාවේ මූල්‍ය ප්‍රකාශනයන් අවබෝධ කර ගැනීම ඉහළ නැංවීම පිණිස මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කොට ඇති සියලු මුදල් ප්‍රමාණ සඳහා පෙර කාල සීමාවට අදාළ ප්‍රමාණාත්මක, ආඛ්‍යාන සහ විස්තරාත්මක ඇතුළු සන්සන්දනාත්මක තොරතුරු හෙළිදරව් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනයන්හි අයිතමයන් ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය සංශෝධනය කරනු ලැබ ඇති විටදී, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සැපයීම පිණිස ප්‍රවර්ථන වසර සමග අනුකූලවන සේ සන්සන්දනාත්මක මුදල් ප්‍රමාණ ද ප්‍රතිවර්ගීකරණය කර ඇත.

2.7.3 මූල්‍ය වත්කමක ක්‍රමක්ෂිත පිරිවැය

පහත දැක්වෙන කොන්දේසි දෙකම සපුරාලන්නේ නම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 9 ප්‍රකාරව මණ්ඩලය මූල්‍ය වත්කම් ක්‍රමක්ෂිත පිරිවැයට හඳුනාගනු ලබයි.

(අ) ගිවිසුම්කර මුදල් ප්‍රවාහ රැස් කිරීම පිණිස මූල්‍ය වත්කම් රඳවා ගැනීමේ අරමුණ ඇති ව්‍යාපාරික මොඩලයක් තුළ මූල්‍ය වත්කම් රඳවා ගැනීම

(ආ) මූල්‍ය වත්කමේ ගිවිසුම්කර නියම නිශ්චිතව සඳහන් කළ දිනවලදී මුදල් ප්‍රවාහ ඇති කරන අතර ඒවා හුදෙක්ම මුල් මුදල සහ මුල් මුදලේ නොපියවූ මුදල මත පොළිය වේ.

රජයේ සුරැකුම්පත් සහ ස්ථාවර තැන්පතුවල සිදු කළ ආයෝජන, මූල්‍ය වත්කම්වල ක්‍රමක්ෂීත පිරිවැය ක්‍රමය යටතේ වර්ගීකරණය කර ඇත.

2.7.4 මූල්‍ය සාධනපත්‍රවල සාධාරණ වටිනාකම

නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ මිලක් නොමැති, මූල්‍ය තත්තවය පිළිබඳ ප්‍රකාශනයේ වාර්තා කර ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් සඳහා සාධාරණ මිළ නිර්ණය කිරීම සිදු කරනු ලබනුයේ ගණිත ක්‍රම ආකෘති යොදා ගැනීම ඇතුළුව තක්සේරු කිරීමේ විවිධ ශිල්පීය ක්‍රම භාවිතා කරමිනි. මෙම ආකෘතිවල ආදාන සාමාන්‍යයෙන් ව්‍යුත්පන්න වනුයේ, ලබා ගත හැකි විටදී නිරීක්ෂණය කළ හැකි, වෙළඳපොළ දත්තවලිනි. කෙසේ වෙතත්, එවැනි දත්ත නොමැති විටදී, මෙම මූල්‍ය සාධනපත්‍රවල සාධාරණ වටිනාකම ස්ථාපිත කිරීම පිණිස විචාර බුද්ධිය අවශ්‍ය කරනු ලබයි.

2.7.5 බැරකම් හා අනිශ්චිත අවස්ථා සඳහා ප්‍රතිපාදන

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී මණ්ඩලයට එරෙහිව නෛතික හිමිකම් ඉල්ලීම් මණ්ඩලයට ලැබෙයි. ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමේදී, යම් හිමිකම් පෑමක් සාර්ථක වීමේ භව්‍යතාව පිළිබඳව කළමනාකාරිත්වය තීන්දු ගෙන තිබේ. නෛතික හිමිකම් පෑම අවසන් වන කාලය සේම ගලා යෑමට ඉඩ ඇති ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණය අවිනිශ්චිත ය. කාල නිශ්චය සහ පිරිවැය අවසාන වශයෙන් රඳා පවතින්නේ අදාළ නෛතික අධිකරණ බලයන්හි යථා ක්‍රියාවලිය මතය. මුළු නෛතික හිමිකම් පෑම්වලින් 15% ක් තෙවැනි පාර්ශවීය නෛතික හිමිකම් පෑම් සඳහා වන නඩුකර ප්‍රතිපාදන සඳහා වෙන් කිරීමට මණ්ඩලය තීරණය කර තිබේ. එය අනුගාමී වසර තුනක ආදායමෙන් 15% හරිත සාමාන්‍යය අනුපාතය ලෙස හඳුනාගෙන තිබේ. එම 15% අනුපාතයෙන් 7%, 5%, 3% පිළිවෙළින් ප්‍රවර්තන වසරේ ආදායමෙන්, පෙර වසරේ ආදායමෙන් හා පෙර වසරට පෙර වසරේ ආදායමෙන් සමානුපාතිකව වෙන් කර තිබේ.

2.8 මූල්‍ය වත්කම් හානිකරණය

මණ්ඩලය සෑම වාර්තාකරණ දිනයකදීම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි මණ්ඩලය තක්සේරු කරයන අතර එවැනි හානිකරණයක් සිදුව ඇත්නම්, වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගැනීම මගින් හානියේ ප්‍රමාණය ගණනය කරනු ලැබේ.

3. වත්කම් හා ඒවායේ තක්සේරු පදනම්

3.1 දේපළ, පිරියත හා උපකරණ

3.1.1 හඳුනාගැනීම සහ මැනීම

දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීමේ පදනම හඳුනාගනු ලබන්නේ වත්කම ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලා ඒමක් සිදුවිය හැකිනම් සහ වත්කමේ පිරිවැය විශ්වසනීයව මැනිය හැකි නම් පමණි.

සියලු දේපළ, පිරියත සහ උපකරණ මුලින්ම වාර්තා කර ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් හෝ හානිකරණ අලාභ අඩුකර පිරිවැයටය. වත්කමක වැදගත් සංරචක වෙනම හඳුනාගනු ලැබ ක්ෂය කරනු ලැබේ. දේපළක, පිරියතක හෝ උපකරණයක

සැලකිය යුතු කොටස් යම් කාල අන්තර තුළ ප්‍රතිස්ථාපනය කරනු ලැබීමට අවශ්‍ය වූ විට, ප්‍රතිස්ථාපිත කොටස හඳුනාගැනීමෙන් ඉවත්කර නව කොටස එය ආශ්‍රිත ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ක්ෂයවීම සහිතව අස්තිත්තවය මගින් පිළිගනු ලැබේ. අනෙකුත් සියලු අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරන ලද වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

රු. 67,297,225.10 මුළු ඓතිහාසික පිරිවැයක් සහිත සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් දේපළ, පිරියත හා උපකරණවල ඇතුලත් කර තිබේ.

3.1.2 පිරිවැය

වත්කමක් ලෙස හඳුනා ගැනීම සඳහා සුදුසුකම් ලබන දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක් මැනීම මුලින්ම සිදු කරනුයේ පිරිවැයට ය. දේපල, පිරියත හා උපකරණවල පිරිවැය ඒවායේ මිලදී ගැනීමේ මිලෙන් සහ අදාළ වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා වැඩකරන තත්ත්වයට ගෙන ඒම සඳහා වූ සෘජුවම ආරෝපණීය වූ පිරිවැයෙන් සමන්විත වේ.

වත්කම්වල ඉපැයුම් ධාරිතාවය දිගටම පවත්වා ගනු හෝ ඉහළ නැංවීම පිණිස ස්ථීර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද තදනන්තර වියදම ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

අළුත්වැඩියා හා නඩත්තු ඒවා දරන ලද මූල්‍ය කාලපරිච්ඡේදය තුළලාභ හා අලාභ ප්‍රකාශනයේ වැය බරක් සේ දක්වනු ලැබේ. ප්‍රධාන ප්‍රතිසංස්කරණවල පිරිවැය, පවතින වත්කම්වල වඩාත්ම මෑතකදී සිදුකරනු ලැබූ කාර්යසාධන ප්‍රමිතිය ඉක්මවා අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලා ඒමේ හැකියාවක් ඇත්නම් සහ ප්‍රතිසංස්කරණය වත්කමේ හඳුනාගත හැකි කොටසක් ප්‍රතිස්ථාපනය කරන්නේ නම්, වත්කමේ ධාරණ අගයට ඇතුලත් කරනු ලැබේ.

3.1.3 ප්‍රත්‍යාගණනය

වත්කමක් ලෙස හඳුනාගැනීමෙන් පසුව, සාධාරණ වටිනාකම විශ්වසනීය ලෙස මැණිය හැකි ඉඩම් සහ ගොඩනැගිලි, කිසියම් තදනන්තර සමුච්චිත ක්ෂය සහ තදනන්තර සමුච්චිත හානිකරණ අලාභ අඩු කොට ප්‍රත්‍යාගණනය සිදුකළ දිනයට ප්‍රත්‍යාගණන වටිනාකමට දක්වා තිබේ. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමක සාධාරණ වටිනාකම වාර්තාකරණ දිනයේදී එහි ධාරණ වටිනාකමින් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව සහතික කිරීම පිණිස තක්සේරු කිරීම් සිදුකරනු ලැබේ.

විවෘත වෙළඳපොළ වටිනාකම භාවිතා කරමින් මෝටර් රථ වාහන ප්‍රත්‍යාගණනය සිදුකරනු ලබනුයේ වෘත්තීමය සුදුසුකම් සහිත බාහිර තක්සේරුකරුවන් විසිනි. ප්‍රත්‍යාගණන අතිරික්තය හඳුනාගනු ලබන්නේ වත්කමේ ශුද්ධ ධාරණ වටිනාකම මත වන අතර ප්‍රත්‍යාගණනය කරන ලද මුදලට වත්කම නැවත ප්‍රකාශ කිරීමෙන් පසුව ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කරනු ලැබේ. ලාභ හා අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබූ එම වත්කමේ ම වටිනාකමේ කළින් සිදුවූ අඩුවීමක් එය හිළව් කරන්නේ නම් මිස මෝටර් රථයක් ප්‍රත්‍යාගණනය කිරීම මත, ප්‍රත්‍යාගණන වටිනාකමේ යම් වැඩිවීමක් ස්කන්ධයේ ප්‍රත්‍යාගණන සංචිතයට බැර කරනු ලැබේ. ප්‍රත්‍යාගණන සංචිතයේ කළින්හඳුනාගනු

ලැබූ වැඩිවීම එය ඉක්මවා යන අවස්ථාවලදී, වටිනාකමේ අඩුවීමක් ලාභ හා අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. අපහරණය කිරීමේදී. කිසියම් ආශ්‍රිත ප්‍රත්‍යාගණන සංචිතයක්, ප්‍රත්‍යාගණන සංචිතයේ සිට රඳවාගත් ඉැපැයුම්වලට පවරනු ලබන අතර අපහරණය මත ලාභ හෝ අලාභ තීරණය කිරීමේදී සැලකිල්ලට ගනු නොලැබේ.

3.1.4 ක්ෂයවීම

සරල මාර්ග ක්‍රමය මත පහත දැක්වෙන වාර්ෂික අනුපාතයන්ට එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය තුළ එම ප්‍රමාණ පොත්වලින් ඉවත්කිරීම පිණිස, ක්ෂයවීම් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වැය ඛරක් සේ දක්වනු ලබයි. ක්ෂයවීම ආරම්භ වනුයේ වත්කම භාවිතයට ගත් අවස්ථාවේ සිටය.

ගොඩනැගිලි	4%
රථ වාහන	20%
ලීබඩු සහ සවිකිරීම්	10%
ප්‍රචාරක උපකරණ	10%
හානි වැළැක්වීමේ උපකරණ	10%
අස්වනු කැපීමේ උපකරණ	10%
පාපැදි	20%
මිනින්දෝරු උපකරණ	10%
කිරුම් උපකරණ	10%
සුබසාධන උපකරණ	10%
දුරකථන	20%
පරිගණක	20%
යතුරු පැදි	20%

3.2 අස්පෘශ්‍ය වත්කම්

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ තත්ත්වයක් තිබෙනම් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ශ්‍රී.ල.ගි.ප්‍ර. -38 අස්පෘශ්‍ය වත්කම් ප්‍රකාරව වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මිණිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලැබේ. ඒ අනුව මෙම වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ කිසියම් සමුච්චිත හානිකරණ අලාභ අඩුකර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වනු ලැබේ.

මණ්ඩලයේ අසපෘශ්‍ය වත්කම්වලට උපාර්ජිත පරිගණක මෘදුකාංග අයත් වේ. පරිගණක මෘදුකාංග සරල රේඛීය ක්‍රමය මත වසර 5ක කාලා සීමාවක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ.

3.3 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ ප්‍රකාශ කර ඇත්තේ වඩා අඩු පිරිවැයට සහ ශුද්ධ උපලබ්ධි කළ අගයටය. ශුද්ධ උපලබ්ධි කළ අගය යනු, සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ සහ විකුණුම් වියදම් අඩුකිරීමෙන් පසු ඇස්තමේන්තුගත විකුණුම් මිලය.මෙම පිරිවැයට තොග භාණ්ඩ අත්කර ගැනීමේ සහ ඒවා දැනට තිබෙන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමට දරන ලද වියදම ද ඇතුළත්ය.

3.4 මූල්‍ය වත්කම්

ශ්‍රී.ල.ගි.ප්‍ර. 39 හි විෂය පථය තුළ මූල්‍ය වත්කම්, උචිත පරිදි ලාභ හෝ පාඩු, ණය සහ ලැබිය යුතු දෑ, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් ලෙස හෝ සළුල ඉදිරි රැකුමක ඉදිරි රැකුම් සාධන පත්‍ර ලෙස නම් කරනු ලැබූ ව්‍යුත්පන්න ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

සිය මූල්‍ය වත්කම්හි මූලික පිළිගැන්ම මත මණ්ඩලය ඒවායේ වර්ගීකරණය තීරණය කරයි.

සියලු මූල්‍ය වත්කම් ආරම්භයේදී සාධාරණ වටිනාකම ධන ලෙසත් ලාභ හෝ පාඩු මගින් වත්කම් සාධාරණ වටිනාකමට නොවන අවස්ථාවන්හිදී සෘජුව ආරෝපණීය ගනුදෙනු පිරිවැයටත් ආරම්භයේදී හඳුනාගනු ලැබේ.

මණ්ඩලය ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පතු ඒවා ආරම්භ කරනු ලබන දිනයේදී මුලින්ම හඳුනාගනු ලැබේ. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් (ලාභ සහ පාඩු හරහා සාධාරණ වටිනාකමට නිමිත කළ වත්කම් ඇතුළුව) ආරම්භයේදී හඳුනාගනු ලබන්නේ සාධන පත්‍රයේ ගිවිසුම් ප්‍රතිපාදනයන්ට මණ්ඩලය පාර්ශවකරුවකු වූ වෙළඳ දිනයටය.

යම් වත්කමකින් මුදල් ප්‍රවාහයන් කෙරෙහි ඇති ගිවිසුම්කර හිමිකම් අවසානවීමේදී හෝ මූල්‍ය වත්කම හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ පරිදාන සැලකිය යුතු ලෙස පවරනු ලබන විටකදී ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය එය පවරන විටදී මණ්ඩලය මූල්‍ය වත්කම හඳුනා ගැනීම ඉවත් කරනු ලැබේ. පවරනු ලැබූ මූල්‍ය වත්කමක් මණ්ඩලය විසින් නිර්මාණය කරනු ලැබූ හෝ රඳවා ගනු ලැබූ යම් බැඳියාවක්, වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස හඳුනාගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ බැරකම් හිලව් කරනු ලබන අතර, මුදල් ප්‍රමාණ හිලව් කිරීමට මණ්ඩලයට නෛතික අයිතිවාසිකමක් ඇති විටකදී සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම උපලබ්ධිකර වත්කම සමගාමීව පියවීමට අදහස් කරන්නේ නම් පමණක් ශුද්ධ මුදල් ප්‍රමාණ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉදිරිපත් කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය වත්කම්වලට මුදල් හා කෙටි කාලීන ආයෝජන සහ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ ඇතුළත් වේ.

3.4.1 ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්වලට වෙළඳාම සඳහා රඳවාගෙන සිටිනු ලබන මූල්‍ය වත්කම් සහ ලාභ සහ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මුල් පිළිගැනීම මත නම් කළ මූල්‍ය වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් ආසන්න කාලීනව විකිණීමේ හෝ ප්‍රතිමිලදී ගැනීමේ කාර්යය සඳහා අත්කර ගෙන ඇත්නම් ඒවා වෙළඳාම සඳහා රඳාවගෙන ඇති සේ වර්ගීකරණය කරනු ලැබේ.

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මනිනු ලැබූ මූල්‍ය වත්කම්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකානශයේ සාධාරණ වටිනාකමට වාර්තා කරනු ලැබේ. සාධාරණ වටිනාකමේ වෙනස්කම් මූල්‍ය ආදායමේ හෝ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය වියදම් ලෙස හඳුනාගනු ලැබේ.

3.4.2 ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබියයුතු දෑ සක්‍රීය වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ගණනය කිරීමෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් හානි අඩුකොට සළුල පොළී අනුපාතය භාවිතා කරමින් තදනන්තරව

ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ.ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්කර ගැනීමේදී කිසියම් වට්ටමක් හෝ ආධික්‍යයක් සහ සළුල පොළී අනුපාතයේ අනුකලක කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. සළුල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. හානිකරණ හේතුකොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ සමන්විත වනුයේ වෙළඳ ලැබීය යුතු දෑ, සේවක ණය, තැන්පතු අත්තිකාරම්, අනෙකුත් ලැබිය යුතු දෑ සහ මුදල් සහ මුදලට සමාන දෑ ආදියෙනි.

3.4.3 මූල්‍ය වත්කමක ක්‍රමක්ෂිත පිරිවැය

පහත දැක්වෙන කොන්දේසි දෙකම සපුරාලන්නේ නම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 9 ප්‍රකාරව මණ්ඩලය මූල්‍ය වත්කම් ක්‍රමක්ෂිත පිරිවැයට හඳුනාගනු ලබයි.

(අ) ගිවිසුම්කර මුදල් ප්‍රවාහ රැස් කිරීම පිණිස මූල්‍ය වත්කම් රඳවා ගැනීමේ අරමුණ ඇති ව්‍යාපාරික මොඩලයක් තුළ මූල්‍ය වත්කම් රඳවා ගැනීම

(ආ) මූල්‍ය වත්කමේ ගිවිසුම්කර නියම නිශ්චිතව සඳහන් කළ දිනවලදී මුදල් ප්‍රවාහ ඇති කරන අතර ඒවා හුදෙක්ම මුල් මුදල සහ මුල් මුදලේ නොපියවූ මුදල මත පොළිය වේ.

රජයේ සුරැකුම්පත් සහ ස්ථාවර තැන්පතුවල ආයෝජන මූල්‍ය වත්කම්වල ක්‍රමක්ෂිත පිරිවැය ක්‍රමය යටතේ වර්ගීකරණය කර ඇත.

3.4.4 විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු විකිණීම සඳහා ඇති ලෙස නම් කර ඇති හෝ ඉහත සඳහන් කවර හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයකට වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ .මූලික පිළිගැනීමට පසුව ,ඒවා සාධාරණ වටිනාකමට ගණනය කරනු ලබන අතර හානි අලාභ හැර එහි වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායමේ පිළිගනු ලබන අතර අරමුදල් සහ සංචිතවල වෙන්කර ඇති සාධාරණ වටිනාකමේ ඉදිරිපත් කරනු ලැබේ .විකිණීම සඳහා ඇති ණය සුරැකුම් මත පොළි ආදායම සළුල පොළී අනුපාතය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර ලාභයෙහි හෝ අලාභයෙහි පිළිගනු ලැබේ . ආයෝජනයක් පිළිගැනීම ඉවත් කළ විට , අරමුදල් සහ සංචිතවල එකතුවූ ලාභය හෝ පාඩුව ලාභ හෝ අලාභවල ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

මූලික පිළිගැනුම මත විකිණීම සඳහා ඇති මූල්‍ය අයෝජනයක් ලෙස මණ්ඩලය කවර හෝ මූල්‍ය වත්කමක් නම් කර නොමැත.

3.4.5 මූල්‍ය වත්කම් හානිවීම

එක් එක් වාර්තාකරණ දිනයේදී මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි මණ්ඩලය තක්සේරු කරන අතර එවැනි හානිවීමක් සිදුව ඇත්නම්, වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගැනීම මගින් හානියේ ප්‍රමාණය ගණනය කරනු ලැබේ.

4. බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය මත ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ඉල්ලුම මත හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ ගෙවීමට නියමිතව ඇති දේය. ජංගම නොවන බැරකම් වනුයේ වාර්තාකරණ දිනයේ සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂ වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, දන්නා සියලු බැරකම් සැලකිල්ලට ගෙන ඇත. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සම්මුතික බැඳීමක් සමාගම සතු විටදී සහ එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හැකියාවක් ඇති හා ඒ සඳහා විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් සෑදිය හැකිවීම අවශ්‍ය කරනු ලබන විටකදී මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ.

4.1 හිමිකම් පෑම් සඳහා ප්‍රතිපාදන

ගෙවීමට ඇති ඉල්ලුම් කර ඇති මුදල් සඳහා බැරකම භෝගයේ අවදානම් සාධක සහ රක්ෂිතයාගේ විෂය කරුණු මත පදනම්ව හඳුනාගනු ලැබේ. 2024 මූල්‍ය වසර සඳහා වන්දි ප්‍රතිපාදනය පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

රක්ෂිත විෂයය	හානිපූරණ සඳහා ප්‍රතිපාදන(රු.)
කෙතට අරුණ	136,160,359
පශු සම්පත්	5,500,000
සුවසෙත රක්ෂණය/ පුද්ගල අනතුරු	1,500,000
අතිරේක භෝග	5,020,400
වංචල දේපළ	49,435,717
	197,616,476

4.2 තෙවන පාර්ශවීය රක්ෂණ වන්දි සඳහා ප්‍රතිපාදන

ප්‍රතිපාදන වෙන් කිරීමේදී, යම් හිමිකම් පෑමක් සාර්ථක වීමේ භව්‍යතාව පිළිබඳව කළමනාකාරිත්වය තීන්දු ගෙන තිබේ. නෛතික හිමිකම් පෑම අවසන් වන කාලය සේම ගලා යෑමට ඉඩ ඇති ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණය අවිනිශ්චිත ය. කාල නිශ්චය සහ පිරිවැය අවසාන වශයෙන් රඳා පවතින්නේ අදාළ නෛතික අධිකරණ බලයන්හි යථා ක්‍රියාවලිය මතය. මුළු නෛතික හිමිකම් පෑම්වලින් 15% ක් තෙවැනි පාර්ශවීය නෛතික හිමිකම් පෑම් සඳහා වන නඩුකර ප්‍රතිපාදන සඳහා වෙන් කිරීමට මණ්ඩලය තීරණය කර තිබේ. තෙවන පාර්ශවීය ප්‍රතිපාදනය හඳුනාගනු ලබන්නේ අනුගාමී වසර තුනක ආදායමින් 15% ක හරිත සාමාන්‍ය අනුපාතයටය. එම 15% අනුපාතයෙන් පිළිවෙලින් 7% ක්, 5% ක් සහ 3% ක් වත්මන් වසරේ ආදායම, පෙර වසරේ ආදායම සහ පෙර වසරට පෙර වසරේ ආදායම සඳහා සමානුපාතිකව වෙන් කරනු ලැබේ.

4.3 බොල් ණය සඳහා ප්‍රතිපාදන

අඩමාන ණය සඳහා ප්‍රතිපාදන ලෙස මුළු කාර්යය මණ්ඩල ණයෙන් 5% ක ප්‍රතිපාදනයක් සලසා ඇත.

4.4 ආදායම් බදු සඳහා ප්‍රතිපාදනය

2024 වසර සඳහා ආදායම් බදු වියදම විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ කොටසක් ලෙස ඉදිරිපත් කර තිබේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති උපදෙස් ප්‍රකාරව, 2018 සිට 2023 දක්වා වසරවල් සඳහා රු. 302,123,251.36 ක බදු මුදලක් මණ්ඩලය ගෙවා තිබේ. 2024 වසර සඳහා,

මණ්ඩලය රු. 124,226,159 ක ආදායම් බදු බැරකමක් දැරීමට සිදුව ඇත.

4.5 විශ්‍රාම ප්‍රතිලාභ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 'විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය' අනුකූල වන පරිදි සියලු ස්ථිර සේවකයන් සඳහා සේවයේ පළමු වසර සම්පූරණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේවෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සමග සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේදී පමණි. එම බැරකම සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

4.6 ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම් වනුයේ ආර්ථික ප්‍රතිලාභ පැවරුම සිදු වීමට ඉඩක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මිණීමට නොහැකි අවස්ථාවන්හිදී අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කරන භව්‍ය බැඳීම් වේ.

මණ්ඩලයේ ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මනිනු ලැබූ මූල්‍ය වත්කම්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකානශයේ සාධාරණ වටිනාකමට වාර්තා කරනු ලැබේ. සාධාරණ වටිනාකමේ වෙනස්කම් මූල්‍ය ආදායමේ හෝ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය වියදම් ලෙස හඳුනාගනු ලැබේ.

3.4.2 ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබියයුතු දෑ සක්‍රීය වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ගණනය කිරීමෙන් පසුව එබඳු මූල්‍ය වත්කම් හානි අඩුකොට සඵල පොළී අනුපාතය භාවිතා කරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ.ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්කර ගැනීමේදී කිසියම් වට්ටමක් හෝ ආධික්‍යයක් සහ සඵල පොළී අනුපාතයේ අනුකලක කොටසක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. සඵල පොළී ක්‍රමවේද ක්‍රමක්ෂය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ. හානිකරණ හේතුකොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ සමන්විත වනුයේ වෙළඳ ලැබීය යුතු දෑ, සේවක ණය, තැන්පතු අත්තිකාරම්, අනෙකුත් ලැබිය යුතු දෑ සහ මුදල් සහ මුදලට සමාන දෑ ආදියෙනි.

3.4.3 විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු විකුණුම සඳහා ඇති ලෙස නම් කර ඇති හෝ ඉහත සඳහන් කවර හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයකට වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ .මූලික පිළිගැනීමට පසුව ,ඒවා සාධාරණ වටිනාකමට ගණනය කරනු ලබන අතර හානි අලාභ හැර එහි වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායමේ පිළිගනු ලබන අතර අරමුදල් සහ සංචිතවල වෙන්කර ඇති සාධාරණ වටිනාකමේ ඉදිරිපත් කරනු ලැබේ .විකිණීම සඳහා ඇති ණය සුරැකුම් මත පොළි ආදායම සඵල පොළී අනුපාතය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර ලාභයෙහි හෝ අලාභයෙහි පිළිගනු ලැබේ .ආයෝජනයක් පිළිගැනීම ඉවත් කළ විට , අරමුදල් සහ සංචිතවල එකතුවූ ලාභය හෝ පාඩුව ලාභ හෝ අලාභවල ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

මූලික පිළිගැනුම මත විකිණීම සඳහා ඇති මූල්‍ය අයෝජනයක් ලෙස මණ්ඩලය කවර හෝ මූල්‍ය වත්කමක් නම් කර නොමැත.

3.4.4 මූල්‍ය වත්කමක ක්‍රමක්ෂිත පිරිවැය

මූල්‍ය වත්කමක ක්‍රමක්ෂිත පිරිවැය

පහත දැක්වෙන කොන්දේසි දෙකම සපුරාලන්නේ නම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 9 ප්‍රකාරව මණ්ඩලය මූල්‍ය වත්කම් ක්‍රමක්ෂිත පිරිවැයට හඳුනාගනු ලබයි.

(අ) ගිවිසුම්කර මුදල් ප්‍රවාහ රැස් කිරීම පිණිස මූල්‍ය වත්කම් රඳවා ගැනීමේ අරමුණ ඇති ව්‍යාපාරික මොඩලයක් තුළ මූල්‍ය වත්කම් රඳවා ගැනීම

(ආ) මූල්‍ය වත්කමේ ගිවිසුම්කර නියම නිශ්චිතව සඳහන් කළ දිනවලදී මුදල් ප්‍රවාහ ඇති කරන අතර ඒවා හුදෙක්ම මුල් මුදල සහ මුල් මුදලේ නොපියවූ මුදල මත පොළිය වේ.

රජයේ සුරැකුම්පත් සහ ස්ථාවර තැන්පතුවල ආයෝජන මූල්‍ය වත්කම්වල ක්‍රමක්ෂිත පිරිවැය ක්‍රමය යටතේ වර්ගීකරණය කර ඇත.

4. බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය මත ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ඉල්ලුම මත හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ ගෙවීමට නියමිතව ඇති දේය. ජංගම නොවන බැරකම් වනුයේ වාර්තාකරණ දිනයේ සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂ වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, දන්නා සියලු බැරකම් සැලකිල්ලට ගෙන ඇත. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සම්මුතික බැඳීමක් සමාගම සතු විටදී සහ එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හැකියාවක් ඇති හා ඒ සඳහා විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් සෑදිය හැකිවීම අවශ්‍ය කරනු ලබන විටකදී මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ.

4.1 ගොවි විශ්‍රාම වැටුප් බැරකම

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, දන්නා සියලු බැරකම් සැලකිල්ලට ගෙන ඇත. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සම්මුතික බැඳීමක් මණ්ඩලය සතු විටදී සහ එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හැකියාවක් ඇති හා ඒ සඳහා විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් සෑදිය හැකිවීම අවශ්‍ය කරනු ලබන විටකදී මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 4 හි 15 වැනි ඡේදයේ ප්‍රකාශ කර ඇති පරිදි, රක්ෂණ ගිවිසුම්වල දී, රක්ෂණ සමාගම එක් එක් වාර්තාකරණ කාල සීමාව අවසානයේදී, සිය රක්ෂණ ගිවිසුම් යටතේ අනාගත මුදල් ප්‍රවාහවල වත්මන් ඇස්තමේන්තු භාවිතා කරමින් සිය හඳුනාගත් රක්ෂණ බැරකම් ප්‍රමාණවත් ද යන්න තක්සේරු කළ යුතුය. අනාගත මුදල් ප්‍රවාහ සැලකිල්ලට ගත් විට සිය රක්ෂණ බැරකම්වල ධාරණ අගය (ආශ්‍රිත විලම්බිත අත්කර ගැනීමේ පිරිවැය සහ ආශ්‍රිත අස්පෘශ්‍ය වත්කම් අඩු කොට) ප්‍රමාණවත් නොවන බව එම තක්සේරුවෙන් පෙන්නුම් කරන්නේ නම්, සමස්ත ඌනතාවය ලාභ හෝ අලාභවල හඳුනා ගත යුතුය.

වෙළඳපොළ පොළී අනුපාතවල වෙනස්කම් සැලකිල්ලට ගනිමින් විශ්‍රාම වැටුප් බැරකම වැඩි

කරනු ලැබ ඇති අතර ලාභ හා අලාභ ප්‍රකාශයේ වෙනත් විස්තීරණ ආදායමේ සහ සහ මූල්‍ය ප්‍රකාශනවල වෙනත් විස්තීරණ ආදායමේ ඌනතාවක් හඳුනා ගෙන තිබේ.

එබැවින්, වෙනත් විස්තීරණ ආදායම යටතේ ධීවර විශ්‍රාම වැටුප් බැරකමේ එකී වැඩිවීම හඳුනා ගැනීම ඉහත ප්‍රමිතියේ අවශ්‍යතා සමග අනුකූල වේ.

4.2 විශ්‍රාම ප්‍රතිලාභ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 'විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය' අනුකූල වන පරිදි සියලු ස්ථීර සේවකයන් සඳහා සේවයේ පළමු වසර සම්පූරණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත .කෙසේවෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සමග සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේදී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

4.3 ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම් වනුයේ ආර්ථික ප්‍රතිලාභ පැවරුම සිදු වීමට ඉඩක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මිණීමට නොහැකි අවස්ථාවන්හිදී අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කරන භව්‍ය බැඳීම් වේ.

මණ්ඩලයේ ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, දන්නා සියලු බැරකම් සැලකිල්ලට ගෙන ඇත. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සම්මුතික බැඳීමක් මණ්ඩලය සතු විටදී සහ එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හැකියාවක් ඇති විටදී මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ.

4.4 ගොවි විශ්‍රාම වැටුප් අරමුදල

ගොවි විශ්‍රාම අරමුදලේ බැරකම් 2007 දී සිදුකරන ලද ආයුගණක ගණනය කිරීම මත වත්මන් වටිනාකම පාදකව මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් ගත කර ඇත.

ගොවීන් විසින් නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට සිදු කරන ලද රු. මිලියන 73.1 දායක මුදල සමගින් අරමුදලින් ඉැපැයූ පොළිය ගොවි විශ්‍රාම වැටුප් අරමුදලට වෙන් කර තිබේ. වයස අවුරුදු 60 සම්පූර්ණ වීමේදී ගොවීන්ට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස අරමුදල ගොඩ නැගීම සඳහා මෙම ප්‍රතිපාදනය අවශ්‍ය වේ. සටහන් අංක 07 යටතේ මෙය හෙළිදරව් කර ඇත.

5. විස්තීරණ ආදායම් ප්‍රකාශනය

5.1 ආදායම

1. මණ්ඩලයේ අයභාරය රක්ෂණ වාරික ආදායම, භාණ්ඩාගාර බිල්පත්වල පොළී ආදායම සහ ස්ථාවර තැන්පතු, සේවක ණය සහ වෙනත් විවිධ ආදායම් නියෝජනය කරයි.
2. සියලුම ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ.
3. රක්ෂණ වාරිකය ගොවීන් වෙනුවෙන් සහනාධාරයක් ලෙස රජයෙන් ලැබී ඇත.

4. ප්‍රාග්ධන වියදම් සඳහා රජයෙන් ලැබුණු ප්‍රදාන ක්‍රමික පදනමක් මත ආදායම ලෙස පිළිගෙන ඇත.

5.2 ආදායම පිළිගැනීම

අ) විශ්‍රාම වැටුප් වාරික ආදායම රක්ෂිත කාලය සඳහා පිළිගනු ලැබේ.

ආ) ඉහත ආදායම උපචිත පදනමකින් වන අතර ආශ්‍රිත වියදම් සමග ගලපනු ලැබේ.

ඇ) පොළී ආදායම කාල පදනමකින් උපචිත වේ.

5.3 රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය

දරන ලද වියදම් වෙනුවෙන් මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රදාන එම වියදම් හඳුනාගනු ලැබූ කාල සීමාව තුළ ආදායම් ලෙස විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලැබේ. වත්කමක පිරිවැය සඳහා මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රදාන ආශ්‍රිත වත්කමේ ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ක්‍රමික පදනමකින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

5.4 වියදම

දරන ලද පිරිවැය සහ නිශ්චිත වියදම් අයිතම ඉපැයුම අතර සෘජු සම්බන්ධතාවයේ පදනමින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම් හඳුනාගනු ලැබේ. මණ්ඩලය පවත්වාගෙන යාම සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්වයෙන් පවත්වාගෙන යාම සඳහා දරන ලද සියලු වියදම්, වසර සඳහා අතිරික්තය සකස් කිරීමේදී ආදායමට බැර කර ඇත.

අංක 401/4 දරන 15.10.2008 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් පහත දැක්වෙන අනුපාත මත වෙන්කරනු ලැබූ මණ්ඩලයේ වක්‍ර වියදම් පහත දැක්වෙන පරිදි වේ.

වියදම	අනුපාත
වැටුප් .සේ.අ.අ,සේ.භා.අ ,	50%
වෛද්‍ය වියදම්	50%
උපදේශන ගාස්තු	40%
සුඛසාධනය	50%
නිල ඇඳුම්	48%
සංග්‍රහ	40%
මුද්‍රණ	40%
නෛතික ගාස්තු	60%
දැනුවත්කිරීම් හා පුහුණු	20%
අධ්‍යක්ෂ මණ්ඩල සාමජික දීමනා	40%
කුලී, දුරකථන	40%
තැපැල් ගාස්තු	55%
විදුලි	40%
ගමන්, අතිකාල	50%
ජල ගාස්තු	40%
දෛනික වේතන	50%
ආරක්ෂක කටයුතු	20%
කාර්යාලීයඋපකරණ නඩත්තුව	20%
වාහන නඩත්තුව	40%
පරිගණක නඩත්තුව	25%
ඉන්ධන වියදම්	30%
ගොඩනැගිලි නඩත්තුව	40%
ලිපි ද්‍රව්‍ය	48%

6. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව යෝජනා ක්‍රමයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ ‘‘වක්‍ර ක්‍රමය ’’යොදා ගනිමිනි.

7. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම් වන්නේ, වාර්තාකරණ දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පැවැරූ දිනය අතර සිදුවූ වාසිදායක සහ අවාසිදායක සිදුවීම් වේ. මූල්‍ය තත්වය පිළිබඳ සියලු ද්‍රව්‍යමය පශ්චාත් ශේෂ පත්‍ර සිදුවීම් සලකා බලා, යෝග්‍ය අවස්ථාවන්හිදී අනාවරණය කර, මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

8. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සම්බන්ධිත පාර්ශව ලෙස සලකනු ලැබේ. මෙම ආශ්‍රිත පාර්ශව සමග සිදුකළ ගනුදෙනු සාධාරණ වටිනාකම මත පදනම්ව හෙළිදරව් කරනු ලැබේ. ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමයෙන් රු. 295,230,441.79 ක ණයක් ලබා ගෙන ඇත.

9. අනිශ්චිත අවස්ථා

මාවිල්ආරු අමුණ වසා දැමීමෙන් පීඩාවට පත් ගොවීන්ට වන්දි ගෙවීමේදී රුපියල් මිලියන 7කට ආසන්න මුදලක් සාවද්‍ය පරිහරණය සම්බන්ධයෙන් මණ්ඩලයේ නිලධාරීන් 3 දෙනෙකුට එරෙහිව නඩුවක් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ විභාග වෙමින් පවතින අතර සාවද්‍ය මුදල් පරිහරණය සම්බන්ධයෙන් ඔවුනට එරෙහිව මහාධිකරණයේදී අධිචෝදනා ගොනු කිරීමට නියමිතය.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය
2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
සටහන - 01

විස්තරය	2024.01.01 දිනට පිරිවැය/ තක්සේරුව	බැහැර කිරීම	එකතු කිරීම	ප්‍රත්‍යාගණනය වෙත පැවරීම	ප්‍රත්‍යාගණනය	එකතුව	2024.01.01 දිනට සමුච්චිත ක්ෂය	බැහැර කිරීම	වර්ෂය සඳහා ක්ෂය	ප්‍රත්‍යාගණනය වෙත පැවරීම	මුළු ක්ෂය	ශුද්ධ පොත් වටිනාකම 31-12-2024
රථ වාහන	4,000,000		-	(4,000,000)	4,350,000	4,350,000	-		817,500	(600,000)	217,500	4,132,500
කාර්යාල උපකරණ	1,254,586		-	-	-	1,254,586	1,178,521	-	11,690	-	1,190,212	64,375
සුඛසාධන උපකරණ	19,978		13,848	-	-	33,826	16,574	-	1,053	-	17,627	16,199
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	1,385,296		-	-	-	1,385,296	1,115,238	-	82,690	-	1,197,928	187,368
වායු සමන යන්ත්‍ර	1,051,273		-	-	-	1,051,273	950,914	-	43,011	-	993,925	57,348
පරිගණක	25,437,735		5,477,843	-	-	30,915,578	22,226,670	-	1,072,260	-	23,298,930	7,616,647
ප්‍රචාරණ උපකරණ	422,837		-	-	-	422,837	422,837	-	-	-	422,837	-
පරිගණක මෘදුකාංග	1,475,000		-	-	-	1,475,000	1,475,000	-	-	-	1,475,000	-
	35,046,705	**-**	**5,491,691**	**(4,000,000)**	**4,350,000**	**40,888,396**	**27,385,754**	**-**	**2,028,204**	**(600,000)**	**28,813,959**	**12,074,437**

දේපළ, පිරියත හා උපකරණවලට 2024 දෙසැම්බර් 31 දිනට රු. 27,495,660.22 ක දළ වටිනාකමකින් යුතු පූර්ණව ක්ෂය කරන ලද තවමත් භාවිතා කරනු ලබන වත්කම් ඇතුළත් වේ .

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය
2024 දෙසැම්බර් 31 දිනෙන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	31.12.2024	31.12.2023
	රු.	රු.
සටහන 02 -තොග		
මුද්‍රණ ද්‍රව්‍ය	8,005,488	4,604,565
- පෙර වසරේ ගැලපීම	173,871	574,666
	8,179,359	**5,179,231**
සටහන 03 - ලැබිය යුතු දෑ		
එකතු කිරීමේ නියෝජිතයන්ගෙන් ලැබිය යුතු	686,979	686,979
තැපැල් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු	99,247,815	81,000,602
ධීවර ජංගම ගිණුම	-	86,866,223
	99,934,794	**168,553,804**
සටහන 04 -කල්පිරීම් දක්වා රඳවාගත් ආයෝජන		
භාණ්ඩාගාර බිල්පත්	762,897,424	391,325,158
ස්ථාවර තැන්පතු	235,364,240	521,782,651
	998,261,663	**913,107,809**
සටහන 05- ලැබිය යුතු ආදායම		
ගොවීන්ගේ දායක මුදල	780,425	720,651
ජීවිත රක්ෂණ වාරිකය සඳහා ගොවි දායක මුදල	157,170	130,530
පරිපාලන ආදායම සඳහා ගොවි දායක මුදල	78,585	65,265
	1,016,180	**916,446**
සටහන 06 - බැංකුවේ ඇති මුදල්		
ගිණුම් අංකය.100150112345 - ම.බැ. යුනියන් පෙදෙස	552,175	562,268
ගිණුම් අංකය. 100180112344 - ම.බැ. යුනියන් පෙදෙස	849,025	85,807
ගිණුම් අංකය. 100130112351 - ම.බැ. යුනියන් පෙදෙස	1,327,251	354,120
ගිණුම් අංකය. 100110112347 - ම.බැ. යුනියන් පෙදෙස	12,860,045	2,917,336
ගිණුම් අංකය. 8403704 - ලංකා බැංකුව යුනියන් පෙදෙස	29,346	266,636
ගිණුම් අංකය. 87144457 - ලංකා බැංකුව යුනියන් පෙදෙස	32,100	32,100
ගිණුම් අංකය. 87649201 - ලංකා බැංකුව නුගේගොඩ	520,062	144,082
ගිණුම් අංකය. 335100370008791-මහජන බැංකුව නුගේගොඩ	635,597	290,610
ගිණුම් අංකය. 100440112349 -ම.බැ. යුනියන් පෙදෙස	851,721	93,280
	17,657,323	**4,746,239**
සටහන 07- ගොවි විශ්‍රාම වැටුප් අරමුදල		
ඉදිරියට ගෙනා ශේෂය	(88,371,389,435)	(87,084,769,616)
පෙර වසරේ ගැලපීම	-	3,046,341,760
ගොවීන්ගේ දායක මුදල් හා තදනන්තර දායක මුදල්	97,949,579	113,079,824
නව ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	73,089,404	27,472,096
	(88,200,350,452)	**(83,897,875,936)**
එකතු කළා/(අඩු)		
වියදම් ඉක්මවූ මුළු ආදායම	(4,179,423,475)	(4,446,041,403)
	(92,379,773,927)	**(88,343,917,339)**

2024 දෙසැම්බර් 31 දිනෙන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	31.12.2024	31.12.2023
	රු.	රු.
සටහන 8 - ප්‍රාග්ධන ව්‍යයදම සඳහා රජයේ ප්‍රදානය		
ඉදිරියට ගෙනා ශේෂය	3,663,542	4,133,861
- පෙර වසර ගැලපුම		
එකතු කළා/(අඩු කළා)		
රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය	(1,210,704)	(1,065,021)
වර්ෂය තුළ එකතු කිරීම	5,491,691	594,702
ඉදිරියට රැගෙන ආ ශේෂය	**7,944,528**	**3,663,542**
සටහන 9 - ගෙවිය යුතු දෑ		
නියෝජිතායතන කොමිස් මුදල	248,323	84,410
කාර්ය මණ්ඩල ආරක්ෂක තැන්පතුව	142,300	142,300
විශ්‍රාම වැටුප් ගෙවීම	2,345,496,047	1,704,525,804
විශ්‍රාම වැටුප් කොමිස් මුදල	1,255,674	1,225,042
සමූහ රක්ෂණ වාරිකය	308,647,637	294,429,817
විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ණය		
- කෘ.ගො.ර.ම	552,668,504	518,782,124
	3,208,458,485	**2,519,189,497**
සටහන 10 - උපචිත ව්‍යයදම්		
මුද්‍රණ ගාස්තු සඳහා ප්‍රතිපාදනය	664,800	800,000
පරිපාලන ව්‍යයදම්	920,310	146,810
තැපැල් ගාස්තු	3,331,881	3,184,805
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදනය	693,495	369,900
	5,610,486	**4,501,515**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය
2024 දෙසැම්බර් 31 දිනෙන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	31.12.2024	31.12.2023
	රු.	රු.
සටහන 11 - වෙනත් ආදායම්		
රජයේ ප්‍රදානය සඳහා ක්‍රමක්ෂය	1,210,704	1,065,021
වෙනත් ආදායම්	107,883	39,893
වත්කම් බැහැර කිරීම්	-	50,560
	1,318,588	**1,155,474**
සටහන 12 - පරිපාලන වියදම්		
වැටුප් සහ වේතන	135,547,011	103,777,380
සේ.අ.අ.	17,052,147	12,527,325
සේ.භා.අ.	3,410,888	2,541,336
ගමන් දීමනා හා යැපීම් දීමනා	11,953,311	11,268,488
අතිකාල	4,448,111	3,432,367
දෛනික වැටුප්	554,581	562,604
වෛද්‍ය වියදම්	1,735,350	1,759,900
පාරිතෝෂික	4,770,210	4,368,782
T.A.C. දීමනා	68,000	-
කාර්ය මණ්ඩල සුබසාධනය	1,766,399	1,435,321
කාර්ය මණ්ඩල නිල ඇඳුම්	752,976	-
අධ්‍යක්ෂ මණ්ඩල දීමනා	270,800	276,200
උපදේශන ගාස්තු	-	68,000
කම්කරු ගාස්තු	-	62,570
කුලී	11,438,685	9,902,831
දුරකථන	7,176,110	2,966,819
තැපැල් ගාස්තු	7,714,950	7,523,165
ආරක්ෂාව	696,093	738,121
විදුලිය	2,990,210	2,507,491
ජල බිල්පත්	462,405	388,730
විගණන ගාස්තු	323,595	363,000
ඉන්ධන	7,480,729	6,914,645
දැනුවත් කිරීම සහ පුහුණුව	3,327,597	4,315,001
මුද්‍රණ	866,041	1,206,478
ලිපි ද්‍රව්‍ය හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	9,209,975	7,337,029
සංග්‍රහ	454,227	541,126
නඩත්තුව - රථ වාහන	10,842,897	10,569,477
නඩත්තුව - ගොඩනැගිලි	1,372,829	4,023,958
නඩත්තුව - කාර්යාල උපකරණ	354,022	384,290
පරිගණක හා මෘදුකාංග නඩත්තුව	613,675	1,243,662
ක්ෂයවීම	2,028,204	1,635,021
	249,682,029	**204,641,116**
සටහන 13 - මූල්‍ය හා වෙනත්		
ණය පොළිය	46,482,878	62,601,947
බැංකු ගාස්තු	121,026	61,168
	46,603,904	**62,663,115**

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

2024

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය
2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		31.12.2024	31.12.2023
	සටහන	රු.	රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	1	37,056	54,698
		37,056	**54,698**
මූල්‍ය සාධනපත්‍ර			
භාණ්ඩාගාර බිල්පත්		412,966,209	398,879,705
		412,966,209	**398,879,705**
ජංගම වත්කම්			
තොග	2	116,255	87,430
ලැබිය යුතු දෑ	3	88,172	5,000
කල්පිරීම් දක්වා රඳවාගත් ආයෝජන	4	329,035,746	394,428,987
බැංකුවේ ඇති මුදල්	5	1,087,964	1,409,330
		330,328,138	**395,930,747**
මුළු වත්කම්		**743,331,403**	**794,865,150**
ස්කන්ධ හා බැරකම්			
ප්‍රාග්ධන හා සංචිත			
ධීවර විශ්‍රාම වැටුප් සමුච්චිත අරමුදල	6	(5,417,682,964)	(4,934,955,153)
මරණ පාරිතෝෂික අරමුදල	7	35,733,815	34,199,215
		(5,381,949,149)	**(4,900,755,938)**
ජංගම නොවන වත්කම්			
විශ්‍රාම වැටුප් බැරකම		6,042,840,342	5,532,349,026
කාර්ය මණ්ඩල පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදනය		990,146	1,831,841
		6,043,830,488	**5,534,180,867**
ජංගම බැරකම්			
මුළු ගෙවිය යුතු දෑ	8	80,021,837	160,590,522
උපචිත වියදම්	9	1,428,227	849,699
		81,450,063	**161,440,221**
මුළු ස්කන්ධ හා බැරකම්		**743,331,403**	**794,865,150**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතා හා අනුකූල වේ .

....
මූල්‍ය ප්‍රධානී අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සහ ඉදිරිපත්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ .
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලද්දේ ;

....
අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික
කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය
විස්තීරණ ආදායම් ප්‍රකාශය

2024 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

	සටහන	31.12.2024	31.12.2023
		රු.	රු.
පොළී ආදායම		125,108,886	134,109,764
ධීවර දායක මුදල		67,017	121,468
		125,175,903	134,231,232
අඩුකළා:			
පරිපාලන වියදම් සඳහා පවරන ලද පොළී ආදායම		(3,500,000)	(3,500,000)
අරමුදල සඳහා මුළු අයභාරය		**121,675,903**	**130,731,232**
අඩුකළා: වියදම			
ශුද්ධ දායක මුදල ආපසු ගෙවීම		(218,765)	(195,015)
ශුද්ධ පොළිය ආපසු ගෙවීම		(296,988)	(284,602)
දිරි දීමනා ගෙවීම		(6,809)	(7,964)
සමූහ රක්ෂණ වාරිකය		(1,743,600)	(1,746,720)
විශ්‍රාම වැටුප් ගෙවීම සහ කොමිස් මුදල			
- විශ්‍රාම වැටුප් ගෙවීම		(88,348,718)	(83,913,258)
- විශ්‍රාම වැටුප් ගෙවීම් සඳහා කොමිස් මුදල		(1,080,820)	(1,034,520)
විශ්‍රාම වැටුප් බැරකමේ වැඩිවීම		(510,491,316)	(464,298,280)
මුළු වියදම		**(602,187,016)**	**(551,480,359)**
මෙහෙයුම් අතිරික්තය/හිඟය		**(480,511,113)**	**(420,749,127)**
ආදායම - පරිපාලනය සඳහා			
පරිපාලන වියදම් සඳහා පොළී ආදායම		3,500,000	3,500,000
පරිපාලන වියදම් සඳහා රජයේ ප්‍රදානය		1,500,000	1,500,000
		5,000,000	5,000,000
විවිධ ආදායම්		200	525
		(475,510,913)	**(415,748,602)**
අඩුකළා: වියදම්			
පරිපාලන හා ආයතනික වියදම්	10	8,137,200	9,430,008
මූල්‍ය ගාස්තු	11	13,800	6,236
මුළු පරිපාලන වියදම්		**8,151,000**	**9,436,244**
වර්ෂය සඳහා ලාභය/(අලාභය)		**(483,661,913)**	**(425,184,846)**
අනෙකුත් විස්තීරණ ආදායම			
පාරිතෝෂික ලාභ/(අලාභ)		934,103	80,014
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**(482,727,810)**	**(425,104,832)**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය

ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය

2024 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

	ගොවි විශ්‍රාම වැටුප් අරමුදල (රු.)	මරණ පාරිතෝෂික අරමුදල (රු.)	එකතුව (රු.)
2023 ජනවාරි 01 දිනට ශේෂය	**(4,509,850,321)**	**32,535,495**	**(4,477,314,826)**
පෙර වසරේ ගැලපුම	-		-
වසර තුළ එකතු කිරීම	-	1,746,720	1,746,720
ගෙවන ලද ප්‍රතිලාභ	-	(83,000)	(83,000)
ශුද්ධ අතිරික්තය/(හිඟය)	(425,104,832)	-	(425,104,832)
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**(4,934,955,153)**	**34,199,215**	**(4,900,755,938)**
වසර තුළ එකතු කිරීම	-	1,743,600	1,743,600
ගෙවන ලද ප්‍රතිලාභ	-	(209,000)	(209,000)
ශුද්ධ අතිරික්තය/(හිඟය)	(482,727,810)	-	(482,727,810)
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	**(5,417,682,964)**	**35,733,815**	**(5,381,949,149)**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2024 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

	31.12.2024	31.12.2023
	රු. ශත.	රු. ශත.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ		
ශුද්ධ අතිරික්තය/(හිඟය)	(483,661,913)	(425,184,846)
ගැලපුම්		
ක්ෂයවීම	17,642	17,642
විශ්‍රාම වගකීම වැඩිවීම	510,491,316	464,298,280
සමූහ රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා දායකත්වය	1,743,600	1,746,720
විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	6,194,629	7,333,900
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය	92,408	273,031
	34,877,682	**48,484,727**
වට්ටෝරු භාණ්ඩවල (වැඩිවීම)/අඩුවීම	(28,825)	4,789
ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම	(83,172)	-
අනෙකුත් ගෙවිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම	(86,763,315)	83,026,105
උපචිත වියදම් (වැඩිවීම)/අඩුවීම	578,527	42,900
	(86,296,785)	**83,073,795**
මෙහෙයුම්වලින් උත්පාදිත මුදල්		
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදිත මුදල්	(51,419,103)	131,558,521
විශ්‍රාම පාරිතෝෂිකය- ගෙවන ලද	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	**(51,419,103)**	**131,558,521**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ		
මූල්‍ය සාධනපත්‍ර	51,306,737	(130,766,793)
ගොවි මරණ පාරිතෝෂික අරමුදල	(209,000)	(83,000)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	**51,097,737**	**(130,849,793)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ		
	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ	**-**	**-**
මුදල් හා මුදලට සමාන දෑ ශුද්ධ වැඩි /(අඩුවීම)	**(321,366)**	**708,729**
වසර ආරම්භයේදී මුදල් සහ මුදලට සමාන දෑ	1,409,330	700,601
වසර අවසානයේදී මුදල් සහ මුදලට සමාන දෑ	**1,087,964**	**1,409,330**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

2024 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

1. පොදු ප්‍රතිපත්ති

1.1 වාර්තාකරණ අස්තිත්වය

ශ්‍රී ලංකා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය (මෙහි මින්මතු 'මණ්ඩලය' ලෙස සඳහන් කරනු ලබන) 1990 අංක 20 දරන පනත යටතේ ස්ථාපිත කරන ලදී. එහි ලියාපදිංචි කාර්යාලය නුගේගොඩ, ගංගොඩවිල, සුභද්‍රාරාම පාරේ අංක 117 දරන ස්ථානයේ පිහිටා ඇති අතර එය එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ලෙස ද කටයුතු කරයි.

තවද, නියම කරනු ලැබූ දිනයේ සිට බල පැවැත්වෙන පරිදි, 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත යටතේ ස්ථාපිත කරනු ලැබූ ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය වෙත පවරනු ලැබූ හෝ පනවනු ලැබූ සියලු බලතල හා කාර්ය ඒ අනුව ක්‍රියාවට නැංවීම සහ ඉටු කිරීම කළ යුතුය.

1.2 මව් අස්තිත්වය සහ අවසාන මව් අස්තිත්වය

මණ්ඩලයේ මව් අස්තිත්වය සහ අවසාන මව් අස්තිත්වය වන්නේ ශ්‍රී ලංකා රජයයි.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

ධීවරයන් සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

1.5 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2024 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන 2025 පෙබරවාරි 27 දින අනුමත කොට නිකුත් කිරීමට බලය පවරන ලදී.

2 පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශනය

මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, අරමුදල් සහ සංචිතවල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් සමන්විත වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර/ ශ්‍රී.ල.ගි.ප්‍ර.) ප්‍රකාරව පිළියෙල කර ඇත.

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් සංරචක වලින් සමන්විත වේ.

- මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයකින් 2024 දෙසැම්බර් 31 දිනට ධීවර විශ්‍රාම වැටුප් සහ

සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පිළිබඳ තොරතුරු සපයයි. [පිටුව 01]

- විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයකින් සමාලෝචිත වර්ෂය සඳහා ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සපයයි. [පිටුව 02]
- ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනයකින් ස්කන්ධවල සියලු වෙනස්වීම් නිරූපණය කරයි. [පිටුව 03]
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය, මුදල් සහ මුදලට සමාන දෑ ජනනය කිරීමට මණ්ඩලයට ඇති හැකියාව සහ එම මුදල් ප්‍රවාහ භාවිතය පිළිබඳව පරිශීලකයින්ට තොරතුරු සපයයි [පිටුව 04]
- ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවලින් සමන්විත මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් [පිටු 05]

2.2 මැනීමේ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණය කිරීම් කරනු ලබන විටදී හැරුණු විට මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් පිළියෙල කර ඇත.

2.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය එහි සාපේක්ෂ ද්‍රවශීලතාව පිළිබිඹු කිරීම පිණිස පුළුල්ව එහි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කරයි. මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමනාත්මක සාධක සඳහා ගැලපීම් සිදුකර නොමැත.

2.4 කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

මණ්ඩලයේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලැබ ඇති සියලු මූල්‍ය තොරතුරු, අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස, ආසන්නතම රුපියලට වටයනය කර ඇත.

2.5 ප්‍රමාණවත්බව හා සමාහරණය

එක හා සමාන අයිතමවල එක් එක් ප්‍රමාණාත්මක පංති වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත. ස්වභාවය හෝ කාර්යයන් අනුව අයිතමයන් අසමාන වන්නේ නම් හැර ඒවා ද වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

2.6 වාර්තාකරණ කාලසීමාව

වාර්තාකරණ කාලසීමාව වන්නේ 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වාය. අදාළ වන විටදී, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඉන් අනතුරුව දක්වා ඇති සටහන් මගින් පැහැදිළි කර ඇත.

2.7 වැදගත් ගිණුම්කරණ තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර /.ශ්‍රී.ල.ගි.ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තාකරනු ලැබූ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණ භාවිතය කෙරෙහි බලපාන්නා වූ තීන්දු, තක්සේරු සහ උපකල්පන සිදුකිරීමට කළමනාකාරීත්වයට නියම කරයි. යොදා ගනු ලැබූ මෙම ඇස්තමේන්තු සහ තීන්දු සැබෑ ප්‍රතිඵලවලට වඩා වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ පාදක උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා ප්‍රතිශෝධන, ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කරඇති කාලසීමාව තුළ සහ ඒවා බලපානු ලබන යම් අනාගත කාලසීමාවන් තුළ පිළිගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවල පිළිගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම සැලකිය යුතු බලපෑම් ඇති කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී තක්සේරු, අවිනිශ්චිතතා සහ තීරණාත්මක තීන්දු පිළිබඳ සැලකිය යුතු ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන්වල අඩංගු කර ඇත.

2.7.1 අඛණ්ඩ පැවැත්ම

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවැතීමට ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට ඇති හැකියාව පිළිබඳව කළමනාකාරිත්වය තක්සේරුවක් කර තිබේ. එබැවින්, ප්‍රවර්තන ව්‍යාපාරයක පදනමින් මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව පිළියෙල කරනු ලැබේ.

2.7.2 සංසන්දනාත්මක තොරතුරු

අන්තර් කාල සීමා සංසන්දනීයභාවය වැඩි දියුණු කිරීම පිණිස ප්‍රවර්ථන කාල සීමාවේ මූල්‍ය ප්‍රකාශනයන් අවබෝධ කර ගැනීම ඉහළ නැංවීම පිණිස මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කොට ඇති සියලු මුදල් ප්‍රමාණ සඳහා පෙර කාල සීමාවට අදාළ ප්‍රමාණාත්මක, ආඛ්‍යාන සහ විස්තරාත්මක ඇතුළු සන්සන්දනාත්මක තොරතුරු හෙළිදරව් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනයන්හි අයිතමයන් ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය සංශෝධනය කරනු ලැබ ඇති විටදී, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සැපයීම පිණිස ප්‍රවර්ථන වසර සමග අනුකූලවන සේ සන්සන්දනාත්මක මුදල් ප්‍රමාණ ද ප්‍රතිවර්ගීකරණය කර ඇත.

2.7.3 මූල්‍ය වත්කමක ක්‍රමක්ෂිත පිරිවැය

පහත දැක්වෙන කොන්දේසි දෙකම සපුරාලන්නේ නම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 9 ප්‍රකාරව මණ්ඩලය මූල්‍ය වත්කම් ක්‍රමක්ෂිත පිරිවැයට හඳුනාගනු ලබයි.

(අ) ගිවිසුම්කර මුදල් ප්‍රවාහ රැස් කිරීම පිණිස මූල්‍ය වත්කම් රඳවා ගැනීමේ අරමුණ ඇති ව්‍යාපාරික මොඩලයක් තුළ මූල්‍ය වත්කම් රඳවා ගැනීම

(ආ) මූල්‍ය වත්කමේ ගිවිසුම්කර නියම නිශ්චිතව සඳහන් කළ දිනවලදී මුදල් ප්‍රවාහ ඇති කරන අතර ඒවා හුදෙක්ම මුල් මුදල සහ මුල් මුදලේ නොපියවූ මුදල මත පොළිය වේ.

රජයේ සුරැකුම්පත් සහ ස්ථාවර තැන්පතුවල සිදු කළ ආයෝජන, මූල්‍ය වත්කම්වල ක්‍රමක්ෂිත පිරිවැය ක්‍රමය යටතේ වර්ගීකරණය කර ඇත.

2.7.4 මූල්‍ය සාධනපත්‍රවල සාධාරණ වටිනාකම

නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ මිලක් නොමැති, මූල්‍ය තත්තවය පිළිබඳ ප්‍රකාශනයේ වාර්තා කර ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් සඳහා සාධාරණ මිළ නිර්ණය කිරීම සිදු කරනු ලබනුයේ ගණිත ක්‍රම ආකෘති යොදා ගැනීම ඇතුළුව තක්සේරු කිරීමේ විවිධ ශිල්පීය ක්‍රම භාවිතා කරමිනි. මෙම ආකෘතිවල ආදාන සාමාන්‍යයෙන් ව්‍යුත්පන්න වනුයේ, ලබා ගත හැකි විටදී නිරීක්ෂණය කළ හැකි, වෙළඳපොළ දත්තවලිනි.

කෙසේ වෙතත්, එවැනි දත්ත නොමැති විටදී, මෙම මූල්‍ය සාධනපත්‍රවල සාධාරණ වටිනාකම ස්ථාපිත කිරීම පිණිස විචාර බුද්ධිය අවශ්‍ය කරනු ලබයි.

2.8 මූල්‍ය වත්කම් හානිකරණය

ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සෑම වාර්තාකරණ දිනයකදීම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි මණ්ඩලය තක්සේරු කරන අතර එවැනි හානිකරණයක් සිදුව ඇත්නම්, වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගැනීම මගින් හානියේ ප්‍රමාණය ගණනය කරනු ලැබේ.

3. වත්කම් හා ඒවායේ තක්සේරු පදනම්

3.1 දේපළ, පිරියත හා උපකරණ

3.1.1 හඳුනාගැනීම සහ මැනීම

දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීමේ පදනම හඳුනාගනු ලබන්නේ වත්කම ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලා ඒමක් සිදුවිය හැකිනම් සහ වත්කමේ පිරිවැය විශ්වසනීයව මැනිය හැකි නම් පමණි.

සියලු දේපළ, පිරියත සහ උපකරණ මුලින්ම වාර්තා කර ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් හෝ හානිකරණ අලාභ අඩුකර පිරිවැයටය. වත්කමක වැදගත් සංරචක වෙනම හඳුනාගනු ලැබ ක්ෂය කරනු ලැබේ. දේපළක, පිරියතක හෝ උපකරණයක සැලකිය යුතු කොටස් යම් කාල අන්තර තුළ ප්‍රතිස්ථාපනය කරනු ලැබීමට අවශ්‍ය වූ විට, ප්‍රතිස්ථාපිත කොටස හඳුනාගැනීමෙන් ඉවත්කර නව කොටස එය ආශ්‍රිත ප්‍රයෝජ්‍ය ආයු කාලය සහ ක්ෂයවීම සහිතව අස්තිත්තවය මගින් පිළිගනු ලැබේ. අනෙකුත් සියලු අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරන ලද වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

රු. 696,175.42 ක මුළු ඓතිහාසික පිරිවැයක් සහිත සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් දේපළ, පිරියත හා උපකරණවල ඇතුලත් කර තිබේ.

3.1.2 පිරිවැය

දේපළ, පිරියත හෝ උපකරණ අයිතමවල පිරිවැය ඒවායේ මිලදී ගැනීමේ මිලෙන් සහ අදාළ වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා වැඩකරන තත්ත්වයට ගෙන ඒම සඳහා වූ සෘජුවම ආරෝපණීය වූ පිරිවැයෙන් සමන්විත වේ

වත්කම්වල ඉපැයුම් ධාරිතාවය දිගටම පවත්වා ගනු හෝ ඉහළ නැංවීම පිණිස ස්ථීර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද තදනන්තර වියදම ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

ප්‍රධාන පරීක්ෂාකිරීම් සහ පිරිවැඩියා කිරීම් ඇතුළුව වෙනම ගිණුම් තබා ඇති දේපල, පිරියත හෝ උපකරණ අයිතමයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අනෙකුත් තදනන්තර පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලාඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වසනීය ලෙස මැණිය හැකිනම් පමණි.

3.1.3 ක්ෂයවීම්

සරල මාර්ග ක්‍රමය මත පහත දැක්වෙන වාර්ෂික අනුපාතයන්ට එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය තුළ එම ප්‍රමාණ පොත්වලින් ඉවත්කිරීම පිණිස, ක්ෂයවීම් විස්තිරණ ආදායම් ප්‍රකාශයේ වැයබරක් සේ දක්වනු ලබයි.

කාර්යාල උපකරණ	10%
ලී බඩු සහ සවිකිරීම්	10%
සුබසාධන උපකරණ	10%
පරිගණක	20%

3.2 අස්පෘශ්‍ය වත්කම්

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ තත්ත්වයක් තිබෙනම් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ශ්‍රී.ල.ගි.ප්‍ර. -38 අස්පෘශ්‍ය වත්කම් ප්‍රකාරව වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මිණිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලැබේ. ඒ අනුව මෙම වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ කිසියම් සමුච්චිත හානිකරණ අලාභ අඩුකර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වනු ලැබේ.

මණ්ඩලයේ අසපෘශ්‍ය වත්කම්වලට උපාර්ජිත පරිගණක මෘදුකාංග අයත් වේ. පරිගණක මෘදුකාංග සරල රේඛීය ක්‍රමය මත වසර 5ක කාලා සීමාවක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ.

3.3 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ ප්‍රකාශ කර ඇත්තේ වඩා අඩු පිරිවැයට සහ ශුද්ධ උපලබ්ධි කළ අගයටය. ශුද්ධ උපලබ්ධි කළ අගය යනු, සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ සහ විකුණුම් වියදම් අඩුකිරීමෙන් පසු ඇස්තමේන්තුගත විකුණුම් මිලය.මෙම පිරිවැයට තොග භාණ්ඩ අත්කර ගැනීමේ සහ ඒවා දැනට තිබෙන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමට දරන ලද වියදම ද ඇතුළත්ය.

3.4 මූල්‍ය වත්කම්

ශ්‍රී.ල.ගි.ප්‍ර. 39 හි විෂය පථය තුළ මූල්‍ය වත්කම් යෝග්‍ය පරිදි ලාභය හෝ පාඩුව, ණය සහ ලැබිය යුතු දෑ, කල් පිරීම තෙක් රඳවා ගත් ආයෝජන, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් හෝ ඉදිරි රැකුම් සාධන පත්‍ර ලෙස නම් කරනු ලැබූ ව්‍යුත්පන්න හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

සිය මූල්‍ය වත්කම්හි මූලික පිළිගැන්ම මත අධ්‍යක්ෂ මණ්ඩලය ඒවායේ වර්ගීකරණය තීරණය කරයි.

සියලු මූල්‍ය වත්කම් ආරම්භයේදී සාධාරණ වටිනාකම ධන ලෙසත් ලාභහෝ පාඩු මගින් වත්කම් සාධාරණ වටිනාකමට නොවන අවස්ථාවන්හිදී සෘජුව ආරෝපණීය ගනුදෙනු පිරිවැයටත් ආරම්භයේදී පිළිගනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පත් ආරම්භයේදී ඒවා ආරම්භ කරනු ලබන දිනයේදී පිළිගනු ලැබේ. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් (ලාභ සහ පාඩු හරහා සාධාරණ වටිනාකමට නිමිත කළ වත්කම් ඇතුළුව) ආරම්භයේදී පිළිගනු ලබන්නේ සාධන පත්‍රයේ ගිවිසුම් ප්‍රතිපාදනයන්ට මණ්ඩලය පාර්ශවකරුවකු වූ වෙළඳ දිනයටය.

යම් වත්කමකින් මුදල් ප්‍රවාහයන් කෙරෙහි ඇති ගිවිසුම්කර හිමිකම් අවසානවීමේදී හෝ මූල්‍ය

වත්කමක හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ පරිදාන සැළකියයුතු ලෙස පවරනු ලබන විටකදී ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය එය පවරන විටදි මණ්ඩය මූල්‍ය වත්කම පිළිගැනීම ඉවත්කරනු ලැබේ. පවරනු ලැබූ මූල්‍ය වත්කමක මණ්ඩලය විසින් නිර්මාණය කරනු ලැබූ හෝ රඳවාගනු ලැබූ යම් බැඳියාවක් වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස හඳුනාගනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ බැරකම් හිලව් කරනු ලබන අතර මුදල් ප්‍රමාණ හිලව් කිරීමට මණ්ඩලයට නෛතික අයිතිවාසිකමක් ඇතිවිටකදී සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම උපලබ්ධිකර බැරකම සමගාමීව පියවීමට අදහස් කරන්නේ නම් පමණක් ශුද්ධ මුදල් ප්‍රමාණය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉදිරිපත් කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය වත්කම්වලට මුදල් සහ කෙටිකාලීන ආයෝජන සහ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ ඇතුලත් වේ .

3.4.1 ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්වලට වෙළඳහා සඳහා රඳවා ගෙන සිටිනු ලබන මූල්‍ය වත්කම් සහ ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මුල් පිළිගැනීම මත නම් කළ මූල්‍ය වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් ආසන්න කාලීනව විකිණීමේ හෝ ප්‍රතිමිලදී ගැනීමේ කාර්යය සඳහා අත්කර ගෙන ඇත්නම්, ඒවා වෙළඳාම සඳහා රඳවාගෙන ඇති සේ වර්ගීකරණය කරනු ලැබේ.

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්, විස්තිරණ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට හෝ මූල්‍ය වියදමට පිළිගනු ලැබූ සාධාරණ වටිනාකමේ වෙනස්කම් සහිතව සාධාරණ වටිනාකමට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වනු ලැබේ.

3.4.2 ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රීය වෙළඳපොලක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික ගණනය කිරීමෙන් පසුව එබඳු මූල්‍ය හානි අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතාකරමින් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්කරගැනීමේදී කිසියම් වට්ටමක් හෝ ආධික්‍යයක් සහ සඵල පොළී අනුපාතයේ අනුකලක කොටසක්වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි.සඵල පොළී අනුපාත ක්‍රමක්ෂය විස්තීර්ණ අදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායමේ අන්තර්ගත කරනු ලැබේ . හානිවීම් හේතු කොට ගෙන ඇතිවන අලාභ මූල්‍ය පිරිවැයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දෑ සමන්විත වනුයේ වෙළඳ ලැබිය යුතු දෑ, සේවක ණය, තැන්පතු, අත්තිකාරම්, අනෙකුත් ලැබුය යුතු දෑ සම මුදල් සහ මුදලට සමාන දෑ ආදියෙනි.

3.4.3 මූල්‍ය වත්කමක ක්‍රමක්ෂය කළ පිරිවැය

SLFRS 9 ට අනුව, පහත සඳහන් කොන්දේසි දෙකම සපුරා ඇත්නම්, මණ්ඩලය ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ මූල්‍ය වත්කමක් හඳුනාගනු ලැබේ.

අ) මූල්‍ය වත්කම, ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම සඳහා මූල්‍ය වත්කම් තබා ගැනීම අරමුණු කරගත් ව්‍යාපාර මොඩලයක් තුළ පවත්වාගෙන යනු ලබන අතර

ආ) මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත නියමයන්ට අනුව නිශ්චිත දිනවලදී මුදල් ප්‍රවාහයන් ඇති කරයි, ඒවා හුදෙක්ම මුළු මුදල හා පොළිය ගෙවීම සඳහා වන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් වේ.

රාජ්‍ය සුරැකුම්පත් සහ ස්ථාවර තැන්පතුවල සිදු කර ඇති ආයෝජන, මූල්‍ය වත්කමක ක්‍රමක්ෂය කළ පිරිවැය ක්‍රමය යටතේ වර්ගීකරණය කර ඇත

3.4.4 විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන

විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු විකුණුම සඳහා ඇති ලෙස නම් කර ඇති හෝ ඉහත සඳහන් කවර හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයකට වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ .මූලික පිළිගැනීමට පසුව ,ඒවා සාධාරණ වටිනාකමට ගණනය කරනු ලබන අතර හානි අලාභ හැර එහි වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායමේ පිළිගනු ලබන අතර අරමුදල් සහ සංචිතවල වෙන්කර ඇති සාධාරණ වටිනාකමේ ඉදිරිපත් කරනු ලැබේ .විකිණීම සඳහා ඇති ණය සුරැකුම් මත පොළි ආදායම සඵල පොළී අනුපාතය භාවිතා කරමින් ගණනය කරනු ලබන අතර ලාභයෙහි හෝ අලාභයෙහි පිළිගනු ලැබේ. ආයෝජනයක් පිළිගැනීම ඉවත් කළ විට, අරමුදල් සහ සංචිතවල එකතුවූ ලාභය හෝ පාඩුව ලාභ හෝ අලාභවල ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

මූලික පිළිගැනුම මත විකිණීම සඳහා ඇති මූල්‍ය අයෝජනයක් ලෙස මණ්ඩලය කවර හෝ මූල්‍ය වත්කමක් නම් කර නොමැත.

3.4.5 මූල්‍ය වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ දිනයකදීම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි මණ්ඩලය තක්සේරු කරයන අතර එවැනි හානිවීමක් සිදුව ඇත්නම්, වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වත්මන් වටිනාකම අතර වෙනස ලබා ගැනීම මගින් හානියේ ප්‍රමාණය ගණනය කරනු ලැබේ .

4. බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය මත ජංගම බැරකම් ලෙස වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ඉල්ලුම මත හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ ගෙවීමට නියමිතව ඇති දේය. ජංගම නොවන බැරකම් වනුයේ වාර්තාකරණ දිනයේ සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂ වේ .

මෙම මූල්‍ය වාර්තා සකස් කිරීමේදී, දන්නා සියලු බැරකම් සඳහා හේතු දක්වා ඇත .අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති විටදී සහ බැඳීම නිරාකරණය සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමත් අවශ්‍ය කරනු ලැබීමට ඉඩ ඇති විටදී ප්‍රතිපාදන සහ බැරකම් පිළිගනු ලැබේ.

4.1 විශ්‍රාම ප්‍රතිලාභ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 'විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය' අනුකූල වන පරිදි සියලු ස්ථිර සේවකයන් සඳහා සේවයේ පළමු වසර සම්පූරණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත . කෙසේවෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සමග සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේදී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

4.2 ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම් වනුයේ ආර්ථික ප්‍රතිලාභ පැවරුම සිදු වීමට ඉඩක් නොමැති හෝ විශ්වාසනීය ලෙස මිණීමට නොහැකි අවස්ථාවන්හිදී අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කරන භව්‍ය බැඳීම් වේ.

මණ්ඩලයේ ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, දන්නා සියලු බැරකම් සැලකිල්ලට ගෙන ඇත. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සම්මුතික බැඳීමක් මණ්ඩලය සතු විටදී සහ එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හැකියාවක් ඇති විටදී මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ.

4.3 සීවර විශ්‍රාම වැටුප් අරමුදල

සීවර විශ්‍රාම අරමුදලේ බැරකම් 2007 දී සිදුකරන ලද ආයුගණක ගණනය කිරීම මත වත්මන් වටිනාකම පාදකව මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් ගත කර ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 4 හි 15 වැනි ඡේදයේ ප්‍රකාශ කර ඇති පරිදි, රක්ෂණ ගිවිසුම්වල දී, රක්ෂණ සමාගම එක් එක් වාර්තාකරණ කාල සීමාව අවසානයේදී, සිය රක්ෂණ ගිවිසුම් යටතේ අනාගත මුදල් ප්‍රවාහවල වත්මන් ඇස්තමේන්තු භාවිතා කරමින් සිය හඳුනාගත් රක්ෂණ බැරකම් ප්‍රමාණවත් ද යන්න තක්සේරු කළ යුතුය. අනාගත මුදල් ප්‍රවාහ සැලකිල්ලට ගත් විට සිය රක්ෂණ බැරකම්වල ධාරණ අගය (ආශ්‍රිත විලම්බිත අත්කර ගැනීමේ පිරිවැය සහ ආශ්‍රිත අස්පෘශ්‍ය වත්කම් අඩු කොට) ප්‍රමාණවත් නොවන බව එම තක්සේරුවෙන් පෙන්නුම් කරන්නේ නම්, සමස්ත ඌනතාවය ලාභ හෝ අලාභවල හඳුනා ගත යුතුය.

වෙළඳපොළ පොළී අනුපාතවල වෙනස්කම් සැලකිල්ලට ගනිමින් සීවර විශ්‍රාම වැටුප් බැරකම වැඩි කරනු ලැබ ඇති අතර ලාභ හා අලාභ ප්‍රකාශයේ වෙනත් විස්තීරණ ආදායමේ සහ සහ මූල්‍ය ප්‍රකාශනවල වෙනත් විස්තීරණ ආදායමේ ඌනතාවක් හඳුනා ගෙන තිබේ.
එබැවින්, වෙනත් විස්තීරණ ආදායම යටතේ සීවර විශ්‍රාම වැටුප් බැරකමේ එකී වැඩිවීම ඉහත ප්‍රමිතියේ අවශ්‍යතා සමග අනුකූල වේ.

5. විස්තීරණ ආදායම් ප්‍රකාශනය

5.1 ආදායම

1. මණ්ඩලයේ අයභාරය රක්ෂණ වාරික ආදායම, භාණ්ඩාගාර බිල්පත්වල පොළී ආදායම සහ ස්ථාවර තැන්පතු, සේවක ණය

සහ වෙනත් විවිධ ආදායම් නියෝජනය කරයි.

2. සියලුම ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ.
3. රක්ෂණ වාරිකය ගොවීන් වෙනුවෙන් සහනාධාරයක් ලෙස රජයෙන් ලැබී ඇත.
4. ප්‍රාග්ධන වියදම් සඳහා රජයෙන් ලැබුණු ප්‍රදාන ක්‍රමික පදනමක් මත ආදායම ලෙස පිළිගෙන ඇත.

5.2 ආදායම පිළිගැනීම

1. විශ්‍රාම වැටුප් වාරික ආදායම රක්ෂිත කාලය සඳහා පිළිගනු ලැබේ.
2. ඉහත ආදායම උපචිත පදනමකින් වන අතර ආශ්‍රිත වියදම් සමග ගලපනු ලැබේ.
3. පොළී ආදායම කාල පදනමකින් උපචිත වේ.

5.3 රජයේ ප්‍රදාන සඳහා ගිණුම්කරණය

දරන ලද වියදම් වෙනුවෙන් මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රදාන එම වියදම් හඳුනාගනු ලැබූ කාල සීමාව තුළ ආදායම් ලෙස විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලැබේ. වත්කමක පිරිවැය සඳහා මණ්ඩලයට ගෙවනු ලබන ප්‍රදාන ආශ්‍රිත වත්කමේ ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ක්‍රමික පදනමකින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

5.4 වියදම

දරන ලද පිරිවැය සහ නිශ්චිත වියදම් අයිතම ඉපැයුම් අතර සෘජු සම්බන්ධතාවයේ පදනමින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම් හඳුනාගනු ලැබේ. මණ්ඩලය පවත්වාගෙන යාම සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්වයෙන් පවත්වාගෙන යාම සඳහා දරන ලද සියලු වියදම්, වසර සඳහා අතිරික්තය සකස් කිරීමේදී ආදායමට බැර කර ඇත.

අංක 401/4 දරන 15.10.2008 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් පහත දැක්වෙන අනුපාත මත වෙන්කරනු ලැබූ මණ්ඩලයේ වක්‍ර වියදම් පහත දැක්වෙන පරිදි වේ.

වියදම	අනුපාත
කුලී, දුරකථන	5%
තැපැල් ගාස්තු, ජල ගාස්තු	5%
විදුලිය	5%
ප්‍රධාන කාර්යාල උපකරණ	5%
ගොඩනැගිලි නඩත්තුව	5%
වාහන නඩත්තුව	3%
ඉන්ධන	2%
ලිපි ද්‍රව්‍ය	2%
නිල ඇඳුම්	2%
ආරක්ෂක	5%
පරිගණක වියදම්	5%

6. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව යෝජනා ක්‍රමයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ වක්‍ර ක්‍රමය යොදා ගනිමිනි.

7. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවන සිදුවීම්වල ප්‍රමාණවත් බව සලකා බලා ඇති අතර අවශ්‍ය තැන්හිදී ගිණුම්වල යෝග්‍ය ගැලපීම් සිදුකර ඇත.

8. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය, ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සම්බන්ධිත පාර්ශව ලෙස සලකනු ලැබේ. මෙම සම්බන්ධිත පාර්ශව සමග සිදුකළ ගනුදෙනු සාධාරණ වටිනාකම මත පදනම්ව හෙළිදරව් කරනු ලැබේ.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
සටහන - 01

2024.12.31 දිනට දේපළ, පිරියත හා උපකරණ

වත්කම්	2024.01.01 දිනට පිරිවැය/ තක්සේරුව	බැහැර කිරීම්	පිරිවැය එකතු කිරීම්	2024.12.31 දිනට ප්‍රත්‍යාගණන වත්කම්	2024.01.01 දිනට සමුච්චිත	බැහැර කිරීම්	වර්ෂය සඳහා ක්ෂය	මුළු ක්ෂයවීම්	2023.12.31 දිනට ලියා හළ අගය
කාර්යාල උපකරණ	528,649	-	-	528,649	477,513	-	14,792	492,305	36,344
සුඛසාධන උපකරණ	1,325	-	-	1,325	1,325	-	-	1,325	-
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	77,677	-	-	77,677	74,114	-	2,850	76,964	713
පරිගණක	264,945	-	-	264,945	264,945	-	-	264,945	-
	872,595	**-**	**-**	**872,595**	**817,897**	**-**	**17,642**	**835,539**	**37,056**

දේපළ, පිරියත හා උපකරණවලට 2024 දෙසැම්බර් 31 දිනට රු.696,175.42 ක ඓතිහාසික පිරිවැයක් සහිත මුළුමණින්ම ක්ෂය කරන ලද තවමත් භාවිතයේ පවතින වත්කම් අන්තර්ගත වේ .

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනට

	31.12.2024	31.12.2023
සටහන 02 -තොග	රු..ශත.	රු..ශත.
මුද්‍රණ ද්‍රව්‍ය	116,255	87,430
	116,255	**87,430**
සටහන 03 - ලැබිය යුතු දෑ		
නොගෙවූ විශ්‍රාම වැටුප්	83,172	
මරණ පාරිතෝෂික අත්තිකාරම	5,000	5,000
	88,172	**5,000**
සටහන 04 -		
කල්පිරීම් දක්වා රඳවාගත් මූල්‍ය සාධනපත්‍ර		
භාණ්ඩාගාර බිල්පත් - ලංකා බැංකුව	29,076,885	110,070,126
ස්ථාවර තැන්පතු - මහජන බැංකුව	299,958,861	284,358,861
	329,035,746	**394,428,987**
සටහන 05 - බැංකුවේ ඇති මුදල්		
ගිණුම් අංකය 164790 ලංකා බැංකුව යුනියන් පෙදෙස	190,525	332,905
ගිණුම් අංකය164795 ලංකා බැංකුව යුනියන් පෙදෙස	711,056	948,429
ගිණුම් අංකය 91071672 ලංකා බැංකුව නුගේගොඩ	24,000	25,000
ගිණුම් අංකය 335100280112349 මහජන බැංකුව නුගේගොඩ	47,945	
එකතු කිරීමේ ගිණුම්	114,438	102,996
	1,087,964	**1,409,330**
සටහන 06 - ධීවර විශ්‍රාම වැටුප් සමුච්චිත අරමුදල		
ඉදිරියට ගෙනා ශේෂය	(4,934,955,153)	(4,509,752,321)
පෙර වසරේ ගැලපීම	-	(98,000)
	(4,934,955,153)	(4,509,850,321)
වර්ෂය තුළ එකතු කිරීම්		
වර්ෂය සඳහා මුළු අතිරික්තය / (හිඟය)	(482,727,810)	(425,104,832)
	(5,417,682,963)	**(4,934,955,153)**

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනට

	31.12.2024	31.12.2023
	රු. ශත.	රු. ශත.
සටහන 7 - මරණ පාරිතෝෂික අරමුදල		
ඉදිරියට ගෙනා ශේෂය	1,663,720	-
එකතු කළා:		
වර්ෂය සඳහා දායක මුදල	1,743,600	1,746,720
අඩුකළා:		
මරණ පාරිතෝෂික ගෙවීම්	(209,000)	(83,000)
	(209,000)	(83,000)
	1,534,600	**1,663,720**
	3,198,320	**1,663,720**
සටහන 08 - ගෙවිය යුතු දෑ		
විශ්‍රාම වැටුප් ගෙවීම	5,560,510	5,537,581
කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය	74,051,579	67,786,327
ආපසු ගෙවනු ලබන දායක මුදල	104,594	82,940
මරණ පාරිතෝෂිකය	169,000	167,000
දායක මුදල් මත ආපසු ගෙවූ පොළිය	124,704	150,451
පරිගණක නඩත්තුව	11,450	-
ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම	-	86,866,223
	80,021,837	**160,590,522**
සටහන 9 - උපචිත වියදම්		
මුද්‍රණ කටයුතු සඳහා ප්‍රතිපාදනය	545,812	522,699
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදනය	535,725	327,000
තැපැල් වියදම්	346,690	-

දීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2024 දෙසැම්බර් 31 දිනට

	31.12.2024	31.12.2023
	රු. ශත.	රු. ශත.
සටහන 10 - පරිපාලන වියදම්		
වැටුප් සහ වේතන	845,412	2,283,133
සේ.අ.අ. දායක මුදල්	116,637	302,868
සේ.හා.අ. දායක මුදල්	23,327	68,543
අතිකාල	3,242	-
විශේෂ දීමනා	483,879	557,736
පාරිතෝෂික	92,408	273,031
ඉන්ධන	498,715	460,976
ලිපි ද්‍රව්‍ය	345,370	314,066
මුද්‍රණ	333,265	267,539
කාර්ය මණ්ඩල නිල ඇඳුම්	31,374	-
කුලී	1,429,836	1,237,854
දුරකථන	895,270	370,852
තැපැල් ගාස්තු	801,008	694,102
ජල බිල්පත්	57,801	48,591
ආරක්ෂාව	174,023	184,530
විදුලිය	373,776	313,436
නඩත්තුව - රථ වාහන	813,217	792,711
නඩත්තුව - ගොඩනැගිලි	171,604	491,215
නඩත්තුව - කාර්යාල උපකරණ	173,243	96,073
පරිගණක වියදම්	247,426	331,109
ක්ෂයවීම	17,642	17,642
විගණන ගාස්තු	208,725	324,000
	8,137,200	**9,430,008**
සටහන 12 - මූල්‍ය ගාස්තු		
බැංකු ගාස්තු	17,642	17,642
	17,642	**17,642**

විගණකාධිපති වාර්තා

10 පරිච්ඡේදය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ARI/C/AAIB/1/24/28/FA ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2025 ජූනි 09 දින

සභාපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහ එහි ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය සහ ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමවල 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ("මණ්ඩලය") සහ එහි ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය සහ ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමවල ("සමූහය") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනතේ, 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනාක්‍රම පනතේ සහ 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනාක්‍රම පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ මණ්ඩලයේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (1.2.1) විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

සමූහය

වියාවනය කළ මතය

සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාවනය සඳහා පදනම කොටසේ (1.2) සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වියාවනය මතය සඳහා පදනම

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1.2.1 හි සඳහන් කරුණු මත පදනම්ව මා විසින් තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කරමි.

සමූහය තුළ ඇති ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය සඳහා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1.2.2 හි සඳහන් කරුණු මත පදනම්ව මා විසින් වියාවනය කරන ලද මතයක් ප්‍රකාශ කර තිබුණි.

සමූහය තුළ ඇති ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය සඳහා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1.2.3 හි සඳහන් කරුණු මත පදනම්ව මා විසින් වියාවනය කරන ලද මතයක් ප්‍රකාශ කර තිබුණි.

1.2.1 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මහියංගනය, ඇඹිලිපිටිය සහ අනුරාධපුරය යන නගරවල පිහිටි නිල නිවාස 3 පිහිටි පර්චස් 76.6 ක් වූ ඉඩම් මණ්ඩලයට අයිතිව තිබුණ ද එම ඉඩම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ආ) 2018 සිට 2022 වර්ෂය දක්වා වගාහානි රක්ෂණ වන්දි ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස මණ්ඩලයේ අවසන් ගිණුම් තුළ දක්වා තිබුණු රු.4,249,619,152 ක ලැබිය යුතු ආදායම 2023 වර්ෂයේදී මුළු මුදලම සමුච්චිත අරමුදල හර කර කපා හැර තිබුණි. 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල පනත අනුව මෙහෙයුම් ආදායමින් සියයට 5 ක් ගොවිජන රක්ෂණ අරමුදලට මාරුකරන බැවින් ඉහත මුදලට අදාළව එලෙස මෙහෙයුම්

ආදායමින් මාරුකළ රු.212,480,957 ක මුදල 2024 දෙසැම්බර් 31 දින දක්වා ගොවිජන රක්ෂණ අරමුදලින් ඉවත් කර සමුච්චිත අරමුදලට ගලපා නොතිබුණි.

(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 හි 04 වන ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබීම හේතුවෙන් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ශේෂ අතර වෙනස රු.58,650,439 ක් ලැබිය යුතු ගිණුම් ශේෂ තුළ ගැලපීම සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා පවත්වාගෙන යන ජංගම ගිණුම් වල සත්‍ය මුදල් ගලා ඒම රු.1,724,342,412 ක් සහ සත්‍ය මුදල් ගලා යාම රු.1,475,253,745 ක් මෙහෙයුම් මුදල් ප්‍රවාහය තුළ හඳුනා ගෙන නොතිබීම නිසා මෙහෙයුම් මුදල් ප්‍රවාහය රු. 190,696,424 කින් ඌණ ගණනය වී තිබුණි. එමෙන්ම මුදලින් ගෙවන ලද රු.2,137,293 ක් වූ සේවක වෛද්‍ය රක්ෂණ ගාස්තු මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම වටිනාකමෙන් මෙහෙයුම් මුදල් ප්‍රවාහය අධි ගණනය වී තිබුණි. තවද සේවක වෛද්‍ය රක්ෂණ අරමුදල් ගිණුමේ ශේෂ වෙනස රු.8,960,763 ක වැඩි වීම ආයෝජන මුදල් ප්‍රවාහය තුළ වාර්තා කිරීම නිසා ආයෝජන මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණු අතර ආයෝජන මත ලද පොලිය වූ රු.5,703,848 ක් ආයෝජන මුදල් ප්‍රවාහය තුළ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ආයෝජන මුදල් ප්‍රවාහය ඌණ ගණනය වී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.2.2 ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය

වියාචනය කළ මතය සඳහා පදනම

(අ) යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.3,062,149,691 ක් සහ මුළු වගකීම් රු.94,351,635,618 ක් වූයෙන් වත්කම් ඉක්මවූ වගකීම් රු.91,289,485,927 ක්ද, මුළු ජංගම වත්කම් රු.1,125,049,320 ක් සහ මුළු ජංගම වගකීම් රු.3,222,013,500 ක් වූයෙන් ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම් රු.2,096,964,180 ක්ද වන අතර භාණ්ඩාගාරයේ දායකත්වයක් නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතින නිසා යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම ගැටළු සහගතවේ.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 88 ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දී ගොවීන්ගෙන් ලැබුණු වාරික ආදායම, ගොවි විශ්‍රාමිකයින්ගේ දායකත්ව ආදායම හා ආයෝජන පොලිය ඇතුළුව සමාලෝචිත වර්ෂය තුළ දී ලද රු.143,566,887 ක මුදල කාලපරිච්ඡේදයේ

ආදායමක් ලෙස ගිණුම්ගත නොකර සමුච්චිත අරමුදලට ගලපා තිබුණු බැවින් එම ප්‍රමාණයෙන් ලාභය අවප්‍රමාණය වී තිබුණි.

(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 7 හි 4 වන ඡේදය ප්‍රකාරව දායකයින්ගෙන් ලද රු.135,443,031 ක්, වාරික මුදල් ආදායම මෙහෙයුම් ආදායම තුළ හඳුනා නොගැනීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරිත්වය තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අව තක්සේරු වී තිබුණු අතර රු.8,123,855 ක් ආයෝජන ආදායම තුළ හඳුනා නොගැනීම නිසා ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අවතක්සේරු වී තිබුණි

(ඈ) වර්ෂයේ ආරම්භක විශ්‍රාම වැටුප් වගකීමෙන් වර්ෂය තුළ ගෙවන ලද විශ්‍රාම වැටුප් මුදල අඩුකළ විට ලැබෙන අවසාන ශේෂයට සියයට 11 ක් එකතු කර විශ්‍රාම වැටුප් වගකීම ගණනය කරන ක්‍රමවේදයක් යෝජනා ක්‍රමය විසින් දිගින් දිගටම අනුගමනය කරමින් පැවතුණි. ඒ අනුව 2024 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වූ රු.86,898,445,376 න් ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම වූ රු.4,845,125,008 අඩු කර එම ශේෂයට සියයට 11ක් වූ රු.9,025,865,240 එකතු කොට අවසාන ශේෂය වූ රු.91,079,185,608 විශ්‍රාම වැටුප් වගකීම වශයෙන් හඳුනාගෙන තිබුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 59 ඡේදය ප්‍රකාර අයුගණක තක්සේරු කිරීමකින් තොරව ඉහතින් සඳහන් කරන ලද ක්‍රමය අනුගමනය කරමින් ගණනය කරන ලද විශ්‍රාම වැටුප් වගකීමේ නිරවද්‍යතාවය පිළිබඳව සැහීමකට පත් විය නොහැක.

(ඉ) ගොවීන්ගේ ජීව දත්ත තොරතුරු යාවත්කාලීන නොකිරීම හේතුවෙන් මියගිය සහ වෙනත් හේතූන් මත හිමිකම් ලබාගැනීමට ඉදිරිපත් නොවන ගොවීන්ගේ විශ්‍රාම වැටුප දිගින් දිගටම තැපැල් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. 2024 වර්ෂයේ දී ගොවීන් විසින් භාර නොගැනීම නිසා තැපැල් දෙපාර්තමේන්තුව විසින් ආපසු එවූ විශ්‍රාම වැටුප රු.469,255,211 ක් වූ අතර සමාලෝචිත වසර අවසානයට එම දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ශේෂය රු.99,247,815 ක් විය. එම ශේෂයන් සෑදී ඇති ආකාරය හා එක් එක් ගොවීන් පිළිබඳ විස්තර ඇතුළත් තොරතුරු පද්ධතියක් නොවූ බැවින් ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි විය.

(ඊ) 2024 නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාළව ගොවි විශ්‍රාමිකයින්ගේ දායකත්ව ආදායම පිළිවෙලින් රු.8,970,200 ක් හා රු.8,969,200 ක් වූ අතර එම වටිනාකම් ගොවි විශ්‍රාමිකයින්ගේ දායකත්ව ආදායම් ගිණුමට බැර කිරීම වෙනුවට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ගිණුමට බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.17,939,400 කින් අවතක්සේරු වී ඇති අතර ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අධිතක්සේරු වී ඇත.

(උ) යෝජනා ක්‍රමයේ සමූහ ජීවිත රක්ෂණ ආවරණය මගින් වයස අවුරුදු 18-54 ත් අතර දායකයකු විශ්‍රාම වැටුප් ලැබීමට පෙර මරණයට පත් වීම, පූර්ණ හා අර්ධ බෙලහීනතාවයට පත් වීම, වෙනුවෙන් ගෙවීමට සිදුවන පාරිතෝෂික ගෙවීම් සඳහා 2024 වර්ෂයේදී දායකයින් 266,297 ක්

වෙනුවෙන් රු.15,977,820 ක අගයක් වෙන් කර තිබුණු අතර ඉන් 256,616 ක් අක්‍රිය දායකයින් වූ අතර ඔවුන්ගෙන් මිය ගිය ප්‍රමාණය හා සත්‍ය වශයෙන්ම අක්‍රිය වන දායකයින් ගණන තහවුරු කර ගැනීමකින් තොරව ඇස්තමේන්තු කර තිබුණි.

1.2.3 ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය

වියාවනය කළ මතය සඳහා පදනම

(අ) වර්ෂයේ ආරම්භක විශ්‍රාම වැටුප් වගකීමෙන් වර්ෂය තුළ ගෙවන ලද විශ්‍රාම වැටුප් මුදල අඩු කර ලැබෙන ශේෂයට සියයට 11 ක් එකතුකර විශ්‍රාම වැටුප් වගකීම ගණනය කරන ක්‍රමවේදයක් යෝජනා ක්‍රමය විසින් දිගින් දිගටම අනුගමනය කර තිබුණි. ඒ අනුව 2024 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වූ රු.5,532,349,026 න් ධීවර විශ්‍රාම වැටුප් ගෙවීම වූ රු.88,348,718 අඩු කර එම ශේෂයට සියයට 11ක් වූ රු.598,840,034 එකතු කොට අවසාන ශේෂය වූ රු.6,042,840,342 විශ්‍රාම වැටුප් වගකීම වශයෙන් හඳුනාගෙන තිබුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 59 වගන්තිය ප්‍රකාර අයුගණක තක්සේරු කිරීමකින් තොරව එයට පටහැනිව ඉහත පරිදි විශ්‍රාම වැටුප් වගකීම ගණනය කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබීම විගණනයේදී පිළිගත නොහැකිය.

(ආ) 2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බැඳුම්කර තක්සේරු වටිනාකම රු.429,486,430 ක් වූ අතර එම වටිනාකමින් 2023 වර්ෂයේ භාණ්ඩාගාර බැඳුම්කර තක්සේරු කිරීමේදී වැඩියෙන් ගණනය කර තිබුණු වටිනාකම වූ රු.16,520,221 අඩුකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම එම අගයෙන් අවතක්සේරු වී තිබුණි.

(ඇ) යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.743,331,403 ක් සහ මුළු වගකීම් රු.6,125, 280,552ක් පැවති අතර වත්කම් ඉක්මවූ වගකීම් රු.5,381,949,149ක් විය. මෙම අවාසිදායක තත්ත්වය යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන්වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 මණ්ඩලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මණ්ඩලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය සහ සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය සහ සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ප්‍රතිපත්ති සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා

ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම සමූහයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණු නමුත් සමූහය විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා සමූහය තබා නිබෙද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්වාගණනය මතය සඳහා පදනම කොටසේ 1.2.1 (අ), (ආ) සහ (ඇ) යන ඡේදවල දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, රීති හා රෙගුලාසියට යොමුව	අනුකූල නොවීම
(අ) 2000 අංක 43 දරන රක්ෂණ පාලන පනතේ අංක 12(3)(1) වගන්තිය හා 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල පනතේ 29 වගන්තිය	මණ්ඩලය විසින් සිදු කරන කෘෂිකාර්මික රක්ෂණ කාර්යයන් සඳහා රක්ෂණ පාලන පනතේ රක්ෂණ පාලන අධිකාරිය විසින් නියාමනයක් අවශ්‍ය නොවූවද මෙම කෘෂිකාර්මික නොවන තෙවන පාර්ශව රක්ෂණ කටයුතු සඳහා රක්ෂණ නියාමන කොමිසමේ අධීක්ෂණයක් හා එහි නීති රීති ප්‍රකාරව කටයුතු කිරීම කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.
(ආ) 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල පනත	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ අරමුණ ගොවි ජනතාවගේ සුභසාධනය වුවද මණ්ඩලය එම අරමුණෙන් බැහැරව තෙවන පාර්ශව රථවාහන රක්ෂණ යෝජනා ක්‍රමයක් ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි.2007 වර්ෂයේදී ට්‍රැක්ටර් සඳහා පමණක් තෙවන පාර්ශව රක්ෂණ නිකුත් කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබුණු අවසරය මෙන්ම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද ලිපිය අනුව කෘෂි යන්ත්‍ර සඳහා පමණක් රක්ෂණ සහතික නිකුත් කිරීමට බලය ඇති බව දක්වා තිබුණද ඊට පටහැනිව අනෙකුත් වාහන සඳහා තෙවන පාර්ෂව රක්ෂණ නිකුත් කිරීම 2015 වර්ෂයෙන් පසු ආරම්භ කර තිබුණි.

(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ 381	මණ්ඩලයේ බැංකු ගිණුම් 45 ක්ද ඇතුළුව සමූහයේ බැංකු ගිණුම් 57 ක් සඳහා භාණ්ඩාගාර අනුමැතිය නොමැතිව ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි.
(ඈ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13:4 වගන්තිය	පූරප්පාඩු වී තිබෙන තනතුරක වැඩ බැලීම සඳහා එම තනතුර දැරීමට සෑම අතින්ම පූර්ණ සුදුසුකම් නොලත් නිලධාරියකු පත් නොකළ යුතු බව දක්වා තිබුණද සංවර්ධන නිලධාරී තනතුර සඳහා සපුරා තිබිය යුතු සුදුසුකම් නොමැති නිලධාරීන් 05 දෙනෙකු සංවර්ධන නිලධාරී තනතුරුවල සහ එක් නිලධාරියෙක් අධ්‍යක්ෂ(පාලන) තනතුරෙහිද, මාස 07 සිට අවුරුදු 4 දක්වා කාලයක් දිගින් දිගටම වැඩ බැලීමේ කාලය දීර්ඝ කරමින් පත්වීම් ලබා දී තිබුණි.
(ඉ)	2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන කාර්ය පටිපාටි රීති සඳහා වන අති විශේෂ ගැසට් පත්‍රයේ IX පරිච්ඡේදයේ 131 වගන්තිය	නීතියට පටහැනිව තනතුරු 09 ක් සඳහා නිලධාරීන් 22 ක් මාස 06 සිට අවුරුදු 10 දක්වා දීර්ඝ කාලීනව වැඩ බැලීමේ පදනමට සේවයේ යොදවා තිබුණි.
(ඊ)	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ කළමනාකරණ සේවා ගණයෙහි තනතුරු සඳහා බඳවා ගැනීම් පටිපාටියේ 4.3.2.2 වගන්තිය	සහකාර අධ්‍යක්ෂ (පාලන හා මානව සම්පත්) තනතුර සඳහා බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී සුදුසුකම් සහ පළපුරුද්ද රහිත නිලධාරිනියක් ඒ සඳහා බඳවාගෙන තිබුණි.
(උ)	2015 මැයි 25 දිනැති PED අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ 2 ඡේදය	වක්‍රලේඛයට පටහැනිව MM 1-1 සේවා ගණයට අයත් නිලධාරීන් 19 දෙනෙකු සඳහා 2022 හා 2023 වර්ෂයන් තුළදී රු.3,218,493 ක් සහ නිලධාරීන් 15 ක් සඳහා 2024 වර්ෂය තුළදී රු.1,183,833 ක් ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි.
(ඌ)	2022 ඔක්තෝබර් 06 දිනැති හා අංක 06/2022 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛය	වක්‍රලේඛයට පටහැනිව වයස අවුරුදු 60 ඉක්ම වූ නිලධාරීන් 4 දෙනෙකු සේවයේ යොදවා අනුමැතියක් නොමැතිව වැටුප් හා දීමනා ලෙස රු.6,790,567 ක් ගෙවීම් කර තිබුණි.
(එ)	2022 ජූලි 8 දිනැති හා 02 /2022 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ	යම් නිශ්චිත කාර්යයක් සඳහා ව්‍යවස්ථාපිත ආයතනයක් වෙත ත්‍යාග/ප්‍රධාන වශයෙන් ලැබෙන මුදල් අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් මොබිටෙල් ආයතනය වෙතින් ලද

මාර්ගෝපදේශයේ වගන්තිය	1.2.5	රු.මිලියනයක මුදල එසේ ප්‍රේෂණය නොකර බැංකු ගිණුමක රඳවා ගෙන තිබුණි.
(ඒ)	2019 සැප්තැම්බර් 02 දිනැති අංක 07/2017 (සංශෝධන II) දරන කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 4 වගන්තිය	2022/23 මහ කන්නයට අදාළව වගාහානි සඳහා වන්දි ඉල්ලීම් ඉදිරිපත් කර වන්දි ගෙවීම සඳහා අනුමත වී ඇති ගොවීන් 39,455 දෙනෙකුගෙන්, 9,513 න් දෙනෙකුට, ප්‍රතිශතයක් ලෙස සියයට 25 ක් වෙත වන්දි ගෙවීම සඳහා වසරකට වඩා වැඩි කාලයක් ගත කර තිබුණි.
(ඔ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ)	චක්‍රලේඛය හා සංශෝධිත මුදල් රෙගුලාසි වලට පටහැනිව රු.110,000 සිට රු.9,991,000 දක්වා වූ පරාසයක් තුල අත්තිකාරම් ලබාදී තිබුණි.ඒ අනුව විවිධ අත්තිකාරම් ලබා දීමේදී අවස්ථා 70 කදී උපරිම අත්තිකාරම් සීමාව ඉක්මවා ලබා ගත් තත්කාර්යය අතුරු අග්‍රිමයෙහි වටිනාකම රු.23,695,099 ක් වූ අතර ප්‍රාග්ධන අත්තිකාරම් යටතේ අවස්ථා 08කදී ලබා දී තිබූ අත්තිකාරම් හි වටිනාකම රු.31,829,529 ක් විය.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ, බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්		**අනුකූල නොවීම**
(අ)	1999 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනතේ 7(අ) උප වගන්තිය	පනත ප්‍රකාරව කෘෂිකාර්මිකයන්ට සිදුවන පාඩු වෙනුවෙන් ඔවුන්ට හානි පූර්ණය සලසන පූර්ණ රක්ෂණ ක්‍රමයක් පිහිටවිය යුතු වුවත් එලෙස හානි සිදු වූ ගොවීන් 8,185 කට 2017 සහ 2018 වර්ෂ සඳහා වූ රු.70,800,200 ක වන්දි මුදල්, ගිණුම් අංක, ගොවීන්ගේ නම් හා හැඳුනුම්පත් අංක නොගැලපීම හේතුවෙන් වාණිජ බැංකු මඟින් ආපසු එවා ඇතත් අදාළ ගොවීන් හඳුනාගෙන එම මුදල නිරවුල් කිරීමට හෝ නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට වසර 6 ක් තිස්සේ කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ

ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) මණ්ඩලයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධති (ERP System) සඳහා 2023 වර්ෂය වන විට රු.72,002,970 ක් ගෙවා තිබූ අතර පසුව ගිවිසුම් කාලය 2025 අප්‍රේල් 01 දක්වා දීර්ඝ කර ගෙන තිබුණද, 2025 මැයි 02 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) සමඟ ඒකාබද්ධව කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතිය ගොඩනැගීම සඳහා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් 2022 වර්ෂයේදී රු.20,391,089 ක මුදලක් මණ්ඩලය වෙත ලබාදී තිබුණු අතර එම වර්ෂයේදි ඒ සඳහා රු.23,009,698 ක් වැයකර තිබුණද 2024 වර්ෂය වන විටත් වන්දි ගණනය කිරීම සහ වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සඳහා තොරතුරු පද්ධතිය භාවිතා කර නොතිබුණි.

(ආ) දේශීය ආදායම් පනත ප්‍රකාරව ආදායම් බදු සඳහා ලියාපදිංචි නොවීම හේතුවෙන් 2018 අප්‍රේල් 01 සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා ගෙවිය යුතු බදු මුදල් වූ රු.299,354,489 ක් නියමිත දිනයන්හීදී ගෙවා නොතිබීම හේතුවෙන් ප්‍රමාද පොලිය ලෙස රු.40,869,072 ක් මණ්ඩලයට ගෙවීමට සිදු ව තිබුණි.

(ඇ) අනපේක්ෂිත සිදුවීම්වලින් පැන නඟින හිමිකම් වෙනුවෙන් යොදා ගත යුතු සංචිත අරමුදලක් 2002 වර්ෂයේ සිට ගොඩනඟා ගෙන තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු.588,524,391 ක් විය. එම අරමුදල භාවිත කළ යුතු අනපේක්ෂිත සිදුවීම් පිලිබඳව නිර්වචනය කර රීති ගොඩනගාගෙන නොතිබුණු නිසා 2002 වර්ෂයේ සිට මේ දක්වා වසර 22 ක කාලය තුළ මෙම අරමුදල භාවිතා කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට යීවර විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමයේ දායකත්වය ලබාගත් වයස අවුරුදු 60 ඉක්මවා විශ්‍රාම වයසට පැමිණ සිටි 32,149 ක් වූ යීවරයින්ගෙන් 26,093 ක් වෙත යීවර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය ප්‍රදානය කර නොතිබුණි.

(ඉ) නෙවැනි පාර්ශව රක්ෂණ ආදායමින් සියයට 5 ක් වෙන් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව දිරි දීමනා අරමුදලක් ගොඩනගාගෙන තිබූ අතර 2024 වර්ෂයේ අරමුදල සඳහා වෙන් කිරීම රු.18,056,415 ක් වූ අතර 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.38,361,464 ක් විය. 2022 වර්ෂයේ දී රු.8,437,499 ක්, 2023 වර්ෂයේ දී රු.8,714,577 ක් සහ 2024 වර්ෂයේ දී

රු.10,380,974 ක් දිරි දීමනා ගෙවීම් කර තිබුණු අතර මෙම අරමුදල පිහිටුවීමට සහ දිරි දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඊ) 2024 පෙබරවාරි 28 දිනැති හා අංක 01/2024 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 වගන්තිය ප්‍රකාරව රජය සතු ව්‍යාපාරවල අරමුදල් සුභසාධන සංගම් හෝ වෙනත් කිසිදු සුභසාධන කටයුත්තක් සඳහා මාරු නොකළ යුතු වුවත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සේවකයින්ට රක්ෂණ ආවරණයක් ලබාදීම සඳහා සේවක වෛද්‍ය රක්ෂණ අරමුදලක් ගොඩනගාගෙන තිබුණු අතර 2024 වර්ෂයේ සමූහයේ දායකත්වය රු.5,221,150 ක් සහ 2024 දෙසැම්බර් 31 දිනට අරමුදලේ ශේෂය රු.36,274,240 ක් විය. මෙම අරමුදල පිහිටුවීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(උ) අමතර රක්ෂණ ආවරණ යටතට ගැනෙන උවදුරු සඳහා වන්දි මහා භාණ්ඩාගාරයෙන් සහ ජාතික රක්ෂණහාර අරමුදලෙන් මූල්‍යනය කළ නොහැකි නමුත් වගා හානියට හේතුව එකකට වඩා වැඩියෙන් අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති 2022/23 මහ කන්නයේ හානියටපත් වගාබිම් අක්කර 2,190 ක ගොවීන් 1,111 ක් වෙත ජාතික රක්ෂණහාර අරමුදලෙන් සහ මහා භාණ්ඩාගාරයෙන් ලබාගත් මුදලින් රු.35,356,111 ක් වන්දි මුදල් ගෙවා තිබුණි.

(ඌ) 2007 දෙසැම්බර් 31 දිනට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ පැවති සමූහ ජීවිත රක්ෂණ අරමුදලේ සහ එයට අදාළ ආයෝජනය වූ රු.251,547,146 ක ශේෂය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ගිණුමට මාරු කර තිබුණි. යෝජනාක්‍රමයේ මුදල් අවශ්‍යතාව සඳහා 2010, 2011 සහ 2012 වර්ෂවලදී සමූහ ජීවිත රක්ෂණ අරමුදලෙන් රු.295,230,442 ක ණය මුදලක් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා 2024 වර්ෂය දක්වා වූ සමුච්චිත පොලිය රු.469,030,456 ක් විය. සමාලෝචිත වර්ෂයේ යොජනා ක්‍රමයේ පරිපාලන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.249,630,000 ක මුදලින් රු.12,596,498 ක මුදලක් යොදාගෙන ණය මුදලින් කොටසක් වශයෙන් පියවා තිබුණි. මේ අනුව ජීවිත රක්ෂණ අරමුදලෙහි ආයෝජනය ණය මුදලක් බවට පත් වී තිබුණි.

(එ) 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනතෙහි 6(1) වගන්තිය ප්‍රකාරව, අවුරුදු 60 සම්පූර්ණ වූ විට විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු වුවත් එම වයස සම්පූර්ණ කළ ගොවීන් හඳුනාගෙන විශ්‍රාම වැටුප ගෙවීම් කර නොතිබුණු අතර 15(1) වගන්තිය ප්‍රකාරව, පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හැර ඇති දායකයෙකුට සහතිකය යටතේ වූ ප්‍රතිලාභ අහිමි කිරීම දායකයා වෙත දැන්වීමට මණ්ඩලයට බලය ඇතත් ප්‍රතිලාභී පාර්ශවය විසින් පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හරිනු නොලබන නමුත් කඩින් කඩ හෝ වාරික 5 ක් නොගෙවූ ප්‍රතිලාභීන් ද ඔප්පුව කඩකළා සේ සලකා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමි කර තිබුණි.

(ඒ) ගොවි විශ්‍රාම වැටුප් යොජනා ක්‍රමයේ දායකයින් වෙත නිකුත් කර තිබුණු සහතික ඔප්පුවේ 6 වගන්තිය ප්‍රකාරව ගෙවා ඇති අර්ධ වාර්ෂික දායක මුදල් ප්‍රමාණයෙන් සියයට 75 ක් ලැබී නිබෙ නම් මණ්ඩලය විසින් තීරණය කරන පරිදි නියමිත විශ්‍රාම වැටුපට වඩා අඩු විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇතත් එම දායකයින් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමිකර තිබුණි.

(ඔ) 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනතේ 5 (1) වගන්තිය ප්‍රකාරව, වයස අවුරුදු 18 සහ 59 අතර යම් ධීවරයෙකුට මෙම ධීවර විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමයට බැඳීමට හිමිකම් ඇතත් 2018 වර්ෂයෙන් පසු යෝජනාක්‍රමයට ධීවර විශ්‍රාම වැටුප් සාමාජිකයන් බඳවාගෙන නොතිබුණු අතර 7 වගන්තිය ප්‍රකාරව, යෝජනා ක්‍රමයට දායක වී සිටින ධීවරයින් සඳහා වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ යුතු වුවත් 2007 ජනවාරි සිට 2017 දෙසැම්බර් දක්වා කාලයට අදාළව විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ ධීවරයන් 141 ක් සඳහා රු.4,240,063 ක් සහ 2023 සහ 2024 වර්ෂවලදී විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ ධීවරයින් 56 ක් සඳහා රු.1,320,447 ක් ලෙස එකතුව රු.5,560,510 ක් හිඟ විශ්‍රාම වැටුප් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය කර තිබුණු නමුත් ධීවරයන් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි.

ජී.ඒ.ඩබ්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. ARI/C/FPS/1/24/25/FA | ඔබේ අංකය உமது இல. Your No. | දිනය திகதி Date 2025 මැයි 30 දින

සභාපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය වියාවනය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය වියාවනය සඳහා පදනම

(අ) යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.3,062,149,691 ක් සහ මුළු වගකීම් රු.94,351,635,618 ක් වූයෙන් වත්කම් ඉක්මවූ වගකීම් රු.91,289,485,927 ක්ද, මුළු ජංගම වත්කම් රු.1,125,049,320 ක් සහ මුළු ජංගම වගකීම් රු.3,222,013,500 ක් වූයෙන් ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම් රු.2,096,964,180 ක්ද වන අතර භාණ්ඩාගාරයේ දායකත්වයක් නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතින නිසා යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම ගැටළු සහගත වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 88 ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දී ගොවීන්ගෙන් ලැබුණු වාරික ආදායම, ගොවි විශ්‍රාමිකයින්ගේ දායකත්ව ආදායම හා ආයෝජන පොලිය ඇතුළුව සමාලෝචිත වර්ෂය තුළ දී ලද රු.143,566,887 ක මුදල කාලපරිච්ඡේදයේ ආදායමක් ලෙස ගිණුම්ගත නොකර සමුච්චිත අරමුදලට ගලපා තිබුණු බැවින් එම ප්‍රමාණයෙන් ලාභය අවප්‍රමාණය වී තිබුණි.

(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 7 හි 4 වන ඡේදය ප්‍රකාරව දායකයින්ගෙන් ලද රු.135,443,031 ක්, වාරික මුදල් ආදායම මෙහෙයුම් ආදායම තුළ හඳුනා නොගැනීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරීත්වය තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අව තක්සේරු වී තිබුණු අතර රු.8,123,855 ක් ආයෝජන ආදායම තුළ හඳුනා නොගැනීම නිසා ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අවතක්සේරු වී තිබුණි

(ඈ) වර්ෂයේ ආරම්භක විශ්‍රාම වැටුප් වගකීමෙන් වර්ෂය තුළ ගෙවන ලද විශ්‍රාම වැටුප් මුදල අඩුකළ විට ලැබෙන අවසාන ශේෂයට සියයට 11ක් එකතු කර විශ්‍රාම වැටුප් වගකීම ගණනය කරන ක්‍රමවේදයක් යෝජනා ක්‍රමය විසින් දිගින් දිගටම අනුගමනය කරමින් පැවතුණි. ඒ අනුව 2024 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වූ රු.86,898,445,376 න් ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම වූ රු.4,845,125,008 අඩු කර එම ශේෂයට සියයට 11ක් වූ රු.9,025,865,240 එකතු කොට අවසාන ශේෂය වූ රු.91,079,185,608 විශ්‍රාම වැටුප් වගකීම වශයෙන් හඳුනාගෙන තිබුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 59 වගන්තිය ප්‍රකාර අයුගණක තක්සේරු කිරීමකින් තොරව ඉහතින් සඳහන් කරන ලද ක්‍රමය අනුගමනය කරමින් ගණනය කරන ලද විශ්‍රාම වැටුප් වගකීමේ නිරවද්‍යතාවය පිළිබඳව සැහීමකට පත් විය නොහැක.

(ඉ) ඉහත විශ්‍රාම වැටුප් වගකීම් ගිණුමට අමතරව සත්‍ය වශයෙන් ගෙවිය යුතු ලෙස හඳුනාගෙන ඇති විශ්‍රාම වැටුප් වගකීම රු.2,345,496,047 ක් වුවද එම වටිනාකම පදනම්ව ආයුගණක තක්සේරුවක් සිදු කර නොතිබූ බැවින් නිරවද්‍යතාව තහවුරු නොවීය.

(ඊ) ගොවීන්ගේ ජීව දත්ත තොරතුරු යාවත්කාලීන නොකිරීම හේතුවෙන් මියගිය සහ වෙනත් හේතූන් මත හිමිකම් ලබාගැනීමට ඉදිරිපත් නොවන ගොවීන්ගේ විශ්‍රාම වැටුප දිගින් දිගටම තැපැල් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. 2024 වර්ෂයේ දී ගොවීන් විසින් භාර නොගැනීම නිසා තැපැල් දෙපාර්තමේන්තුව විසින් ආපසු එවූ විශ්‍රාම වැටුප රු.469,255,211 ක් වූ අතර සමාලෝචිත වසර අවසානයට එම දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ශේෂය රු.99,247,815 ක් විය. එම ශේෂයන් සෑදී ඇති ආකාරය හා එක් එක් ගොවීන් පිළිබඳ විස්තර ඇතුළත් තොරතුරු පද්ධතියක් නොවූ බැවින් ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි විය.

(උ) 2024 නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාළව ගොවි විශ්‍රාමිකයින්ගේ දායකත්ව ආදායම පිළිවෙලින් රු.8,970,200 ක් හා රු.8,969,200 ක් වූ අතර එම වටිනාකම් ගොවි විශ්‍රාමිකයින්ගේ දායකත්ව ආදායම් ගිණුමට බැර කිරීම වෙනුවට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ගිණුමට බැර කිරීම

හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.17,939,400 කින් අවතක්සේරු වී ඇති අතර ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අධිතක්සේරු වී ඇත.

(ඌ) යෝජනා ක්‍රමයේ සමූහ ජීවිත රක්ෂණ ආවරණය මගින් වයස අවුරුදු 18-54 ත් අතර දායකයකු විශ්‍රාම වැටුප් ලැබීමට පෙර මරණයට පත් වීම, පූර්ණ හා අර්ධ බෙලහීනතාවයට පත් වීම, වෙනුවෙන් ගෙවීමට සිදුවන පාරිතෝෂික ගෙවීම සඳහා 2024 වර්ෂයේදී දායකයින් 266,297 ක් වෙනුවෙන් රු.15,977,820 ක අගයක් වෙන් කර තිබුණු අතර ඉන් 256,616 ක් අක්‍රිය දායකයික් වූ අතර ඔවුන්ගෙන් මිය ගිය ප්‍රමාණය හා සත්‍ය වශයෙන්ම අක්‍රිය වන දායකයින් ගණන තහවුරු කර ගැනීමකින් තොරව ඇස්තමේන්තු කර තිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ ව්‍යාවනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2.(අ),(ආ),(ඇ) සහ (ඊ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1. නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

නීතිරීති හා රෙගුලාසිවලට යොමුව		අනුකූල නොවීම
(අ)	1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත	
	(i). 6 (1) වගන්තිය	අවුරුදු 60 සම්පූර්ණ වූ විට විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු වුවත් එම වයස සම්පූර්ණ කළ ගොවීන් හඳුනාගෙන ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම් කර නොතිබුණි.
	(ii). 12 (ඇ) වගන්තිය	යෝජනාක්‍රමය සම්බන්ධයෙන් ජීව දත්ත ඇතුළත් තොරතුරු පද්ධතියක් තිබුණද දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන නොයාම නිසා අවශ්‍ය මූල්‍ය හා මෙහෙයුම් වාර්තා ලබා ගැනීමට

නොහැකි වී තිබුණි. මේ නිසා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 528/03 ප්‍රකාරව යෝජනා ක්‍රමයට දායක වී ඇති මුළු ගොවීන් සංඛ්‍යාව 954,254 ක් වූ අතර තොරතුරු පද්ධතියෙහි ඇතුළත්ව ඇති සංඛ්‍යාව 871,425 ක් විය. ඒ අනුව ගොවීන් 82,829 ක වෙනසක් වුවද, එයට හේතු විගණනයට පැහැදිලි නොවීය.

(iii). 12 (ඇ) වගන්තිය — යෝජනා ක්‍රමය පිළිබඳව සමීක්ෂණ අගැයුම් හා සමාලෝචනය කර මෙහෙයුම් රීතිවල වෙනස්කම් ඇති කිරීම සිදු කළ යුතු වුවත්,ගොඩනගාගන්නා ලද නීතියක් රීතියක් හෝ රෙගුලාසියක් නොමැතිව හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප ආපසු ගෙවීමේ දී අර්ධ වර්ෂයකට සියයට 3.32 ක පොලී ප්‍රතිශතයක් ශුද්ධ වාරික මුදලට අමතරව ගණනය කර තිබුණි.

(iv). 15(1) වගන්තිය — පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හැර ඇති දායකයෙකුට සහතිකය යටතේ වූ ප්‍රතිලාභ අහිමි කිරීම දායකයා වෙත දැන්වීමට මණ්ඩලයට බලය ඇතත් ප්‍රතිලාභි පාර්ශවය විසින් පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හරිනු නොලබන නමුත් කඩින් කඩ හෝ වාරික 5 ක් නොගෙවූ ප්‍රතිලාභීන් ද ඔප්පුව කඩකළා සේ සලකා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමි කර තිබුණි.

(v) 27(1) වගන්තිය — විෂයභාර අමාත්‍යාවරයාගේ සහ මුදල් විෂයභාර අමාත්‍යාවරයාගේ එකඟතාවය මත, යෝජනාක්‍රමය විසින් ලබා ගන්නා ණය ප්‍රමාණය තීරණය විය යුතු වුවත් එවැනි එකඟතාවයක් ලබානොගෙන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් මෙම යෝජනාක්‍රමයට රු.295,230,442 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පොලියද ඇතුළත් මුළු ණය ශේෂය රු.552,668,504 ක් විය.

(ආ) සහතික ඔප්පුවේ 6 වගන්තිය — ගෙවා ඇති අර්ධ වාර්ෂික දායක මුදල් ප්‍රමාණයෙන් සියයට 75 ක් ලැබී තිබේ නම් මණ්ඩලය විසින් තීරණය කරන පරිදි නියමිත විශ්‍රාම වැටුපට වඩා අඩු විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇතත් එම දායකයින් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමිකර තිබුණි.

3.2 අවධිමත් ගනුදෙනු

යෝජනා ක්‍රමයට අනුමත කාර්ය මණ්ඩලයක් නොසිටින අතර මණ්ඩලයෙහි මුළු සේවක වැටුප් වියදමින් හා අනිකුත් පරිපාලන වියදම් වලින් ද සියයට 50 ක් බැහින් වූ ප්‍රතිශතයක් යෝජනාක්‍රමයේ වියදම් ලෙස හරකර තිබුණි.හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප් ආපසු ගෙවීමේ දී ප්‍රතිලාභියාගෙන් ලැබෙන සෑම වාරිකයකින්ම රු.15 බැහින් පරිපාලන වියදම් වශයෙන් ද ගොවියා නිසි පරිදි ගෙවූ එක් වාරිකයකට රු.30 බැහින් රක්ෂණ ගාස්තුවක් ද ගොවියාට ආපසු ගෙවන මුදලින් රු.150 ක් යලි රක්ෂණ ගාස්තුවක් ලෙස ද අඩු කර ගොවියාට ආපසු ගෙවන මුදල තීරණය කර තිබුණ ද මේ සඳහා කිසිදු රීතියක් හෝ අනුමත කර ගෙන නොතිබුණි.

3.3 කාර්යසාධනය

(අ) අනුගාමී වාරික 5 ක් කඩ කර ඇති විට ඒ බව දැනුවත් කර ඔප්පුව සක්‍රිය කිරීම සඳහා අවශ්‍ය පහසුව සලසා නොමැති නිසා නියමිත වයස සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුප් සඳහා 2021 වර්ෂයේදී අයදුම් කළ දායකයින් 1,127 දෙනෙකුටද, 2022 වර්ෂයේදී දායකයින් 2,226 දෙනෙකුටද, 2023 වර්ෂයේ දායකයින් 715 දෙනෙකුටද, 2024 වර්ෂයේදී දායකයින් 775 දෙනෙකුටද විශ්‍රාම වැටුප් නොගෙවා ශුද්ධ වාරික මුදල් ගෙවීම් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට විශ්‍රාම වැටුප් හිමිකම් සඳහා අයදුම්පත් 7,057 ක් ඉදිරිපත් වූවද ඉන් අයදුම්පත් 1,575 කට ප්‍රතිලාභ ලබා දීමට යෝජනා ක්‍රමය අපොහොසත්ව තිබුණි.

3.4 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) 2007 දෙසැම්බර් 31 දිනට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ පැවති සමූහ ජීවිත රක්ෂණ අරමුදලේ සහ එයට අදාළ ආයෝජනය වූ රු.251,547,146 ක් ශේෂය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ගිණුමට මාරු කර තිබුණි. යෝජනාක්‍රමයේ මුදල් අවශ්‍යතාව සඳහා 2010, 2011 සහ 2012 වර්ෂවලදී සමූහ ජීවිත රක්ෂණ අරමුදලෙන් රු.295,230,442 ක ණය මුදලක් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා 2024 වර්ෂය දක්වා වූ සමුච්චිත පොලිය රු.469,030,456 ක් විය. සමාලෝචිත වර්ෂයේ යොජනා ක්‍රමයේ පරිපාලන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.249,630,000 ක මුදලින් රු.12,596,498 ක මුදලක් යොදාගෙන ණය මුදලින් කොටසක් වශයෙන් පියවා තිබුණි. මේ අනුව ජීවිත රක්ෂණ අරමුදලෙහි ආයෝජනය ණය මුදලක් බවට පත් වී තිබුණි.

(ආ) මාවිල් ආරු සොරොව්ව වැසීම නිසා ගොවීන් වෙත වගා හානි වන්දි ගෙවීම සඳහා රු. මිලියන 7 කට වැඩි මුදලක් පෙර වර්ෂයේ දී ගෙවීම් කර තිබුණු අතර මේ සම්බන්ධව ගොනු කරන ලද නඩුව නීතිපති උපදෙස් සඳහා 2007 නොවැම්බර් 30 දින යොමුකර තිබුණු අතර කිසිදු පසුවිපරමක් සිදුකර නොතිබුණි.

(ඇ) 2007 සිට 2022 වර්ෂය දක්වා නොගෙවූ සහ මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් ලෙස හඳුනා නොගෙන වියදමට එරෙහිව කපාහැර තිබූ වටිනාකම රු.1,136,598,066 ක් වූ අතර 2023 වර්ෂයේ නොගෙවූ විශ්‍රාම වැටුප් වගකීම රු.340,373,793 ක් ද, 2024 වර්ෂයේ නොගෙවූ විශ්‍රාම වැටුප් වගකීම රු.568,503,026 ක් දායකයන් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි. එම විශ්‍රාම වැටුප් විශ්‍රාමිකයින් විසින් ලබා නොගන්නා බව තහවුරු කර ගෙන එම මුදල් නැවත මහා භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2021 වර්ෂයේ නව බඳවාගැනීම් ආරම්භ කිරීමෙන් පසු, 2025 ජනවාරි 09 දින වන විට, එකවර මුදල් ගෙවූ දායකයින් 1,205 දෙනෙකු ද, අර්ධ වාර්ෂික වාරික මුදල් ගෙවන දායකයින් 2,210 දෙනෙකු ද, මාසික වාරික මුදල් ගෙවන දායකයින් 1,477 දෙනෙකු යෝජනා ක්‍රමයේ දායකත්වය ලබා ගෙන සිටි අතර ඒ ඒ දායකයින්ට අනුව දායක මුදල් අයවීම් හඳුනාගැනීමටත්, දායකයින්ගේ සක්‍රීය හෝ අක්‍රීය බව හඳුනාගැනීමටත්, අක්‍රීය වූ දායකයින්ගේ වාරික මුදල් භාර නොගැනීමටත් හැකිවන පරිදි පවතින තොරතුරු පද්ධතිය හෝ ලිපිගොනු පවත්වාගෙන ගොස් නොතිබුණි.

ජී.ඒ.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ARI/C/FIPS/1/24/24/FA

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 මැයි 28 දින

සභාපති

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය වියාවනය

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

(අ) වර්ෂයේ ආරම්භක විශ්‍රාම වැටුප් වගකීමෙන් වර්ෂය තුළ ගෙවන ලද විශ්‍රාම වැටුප් මුදල අඩු කර ලැබෙන ශේෂයට සියයට 11 ක් එකතුකර විශ්‍රාම වැටුප් වගකීම ගණනය කරන ක්‍රමවේදයක් යෝජනා ක්‍රමය විසින් දිගින් දිගටම අනුගමනය කර තිබුණි. ඒ අනුව 2024 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වූ රු.5,532,349,026 න් ධීවර විශ්‍රාම වැටුප් ගෙවීම වූ රු.88,348,718 අඩු කර එම ශේෂයට සියයට 11ක් වූ රු.598,840,034 එකතු කොට අවසාන ශේෂය වූ රු.6,042,840,342 විශ්‍රාම වැටුප් වගකීම වශයෙන් හඳුනාගෙන තිබුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 59 වගන්තිය ප්‍රකාර අයුගණක තක්සේරු කිරීමකින් තොරව එයට පටහැනිව ඉහත පරිදි විශ්‍රාම වැටුප් වගකීම ගණනය කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබීම විගණනයේදී පිලිගත නොහැකිය.

(ආ) 2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බැඳුම්කර තක්සේරු වටිනාකම රු.429,486,430 ක් වූ අතර එම වටිනාකමින් 2023 වර්ෂයේ භාණ්ඩාගාර බැඳුම්කර තක්සේරු කිරීමේදී වැඩියෙන් ගණනය කර තිබුණු වටිනාකම වූ රු.16,520,221 අඩුකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම එම අගයෙන් අවතක්සේරු වී තිබුණි.

(ඇ) යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.743,331,403 ක් සහ මුළු වගකීම් රු.6,125, 280,552ක් පැවති අතර වත්කම් ඉක්මවූ වගකීම් රු.5,381,949,149ක් විය. මෙම අවාසිදායක තත්ත්වය යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ ව්‍යාවනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2.(අ) සහ (ඇ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසියට යොමුව	අනුකූල නොවීම
(අ) 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත	
(i) 3 වන වගන්තිය	වයස 60 සම්පූර්ණ වූ ධීවරයන් 26,093 දෙනෙකුට විශ්‍රාම වැටුප් නොලැබීම හා නව දායකයින් බඳවා ගැනීම් සිදු නොකිරීම නිසා යෝජනා ක්‍රමයේ 3 වන වගන්තියේ පරමාර්ථ ඉටුවී නොතිබුණි.
(ii) 5 (1) වගන්තිය	වයස අවුරුදු 18 සහ 59 අතර යම් ධීවරයෙකුට මෙම ධීවර විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමයට බැඳීමට හිමිකම් ඇතත් 2018 වර්ෂයෙන් පසු යෝජනාක්‍රමයට ධීවර විශ්‍රාම වැටුප් සාමාජිකයන් බඳවාගෙන නොතිබුණි.
(iii) 7 වගන්තිය	යෝජනා ක්‍රමයට දායක වී සිටින ධීවරයින් සඳහා වයස අවුරුදු 60 සම්පූර්ණ වන විටම විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ යුතු වුවත් 2007 ජනවාරි සිට 2017 දෙසැම්බර් දක්වා කාලයට අදාළව විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ ධීවරයන් 141 ක් සඳහා රු.4,240,063 ක් සහ 2023 සහ 2024 වර්ෂවලදී විශ්‍රාම වැටුප් ප්‍රදානය කළ ධීවරයින් 56 ක් සඳහා රු.1,320,447 ක් ලෙස එකතුව රු.5,560,510 ක් හිඟ විශ්‍රාම වැටුප් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය කර තිබුණු නමුත් ධීවරයන් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි.
(iv) 11 වගන්තිය	විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලැබීමට පෙර දායකයකු මිය ගිය විට යෝජනා ක්‍රමය යටතේ නියමිත පරිදි ගණුන් බලන ලද මරණ පාරිතෝෂිකයක් ගෙවිය යුතු විය. මණ්ඩලය වෙත මරණ පාරිතෝෂික අයදුම්පත් ලද දිනයේ සිට මරණ පාරිතෝෂික ගෙවීම් ක්‍රියාවලිය අවසාන කිරීමට මාස 3 සිට මාස 42 ක් දක්වා කාලයක්ද, ධීවරයා මියගිය දින සිට මරණ පාරිතෝෂික ගෙවීම් ක්‍රියාවලිය අවසාන කිරීමට මාස 5 සිට මාස 193 අතර කාලයක්ද ගත කර තිබුණි.
(V) 20 වගන්තිය	යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථාපිත උපදේශක කාරක සභාව 2016 නොවැම්බර් මාසයෙන් පසු මේ දක්වා රැස්වී නොතිබුණි.

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) වයස අවුරුදු 60 සම්පූර්ණ වී වාරික මුදලින් සියයට 75 කට වඩා අඩුවෙන් ගෙවන ලද ධීවරයින් සඳහා ශුද්ධ වාරික මුදල් ආපසු ගෙවීමට මාස 3 සිට මාස 78 ක කාලයක් ගතකර තිබුණි.

(ආ) 2024 නොවැම්බර් 25 දිනැති අංක-2412/08 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මෙම අරමුදල ධීවර අමාත්‍යාංශය යටතට පත්කර ඇතත් අමාත්‍යාංශය මඟින් පැවැත්වෙන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී මෙම අරමුදල පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට යෝජනාක්‍රමයේ දායකත්වය ලබාගත් වයස අවුරුදු 60 ඉක්මවා විශ්‍රාම වයසට පැමිණ සිටි 32,149 ක් වූ ධීවරයින්ගෙන් 26,093 ක් වෙත ධීවර විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය ප්‍රදානය කර නොතිබුණි.

(ඈ) ධීවර විශ්‍රාමිකයින්ගේ ජීව දත්ත නොරතුරු පවත්වා ගැනීම හෝ යාවත්කාලීනව පවත්වා නොතිබීම හේතුවෙන් විශ්‍රාම වැටුප්ලාභීන් සත්‍ය වශයෙන්ම ජීවත්ව සිටින්නේද යන්න පිළිබඳව තහවුරු කර නොගෙන සමාලෝචිත වර්ෂයේදී විශ්‍රාම වැටුප් ලෙස රු.88,348,718 ක් ගෙවා තිබුණද එහි නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි විය

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)